# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018** ජූනි **05** වන අඟහරුවාදා
2018 வைகாசி 22 செவ்வாய்க் கிழமை
Tuesday 05th June 2018

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.45 ට පළාත් සභාව රැස් විය.**
**மு.ப. 09.45 க்கு சபை கூடியது**
The Provincial Council met at 09.45 a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"අසෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාගේ අභාවය හේතුවෙන් පුරප්පාඩු වී ඇති සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජික ධූරය සඳහා ගරු කේ.ඒ. ජනක කුරුප්පු මැතිතුමාව අද දින සිට ක්‍රියාත්මක වන පරිදි මවිසින් නම් කරනු ලබන බව දැනුම් දෙනවා."*

*ii*

*"මතු කියැවෙන පරිදි සභාවේ කාරක සභා සඳහා ගරු මන්ත්‍රීවරුන්ව අද දින සිට ක්‍රියාත්මක වන පරිදි මවිසින් නම් කරනු ලබන බව දැනුම් දෙනවා.*

| | | |
|---|---|---|
| *කාර්ය පටිපාටි රීති කාරක සභාව* | - | *ගරු කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා* |
| *සභා කටයුතු කාරක සභාව* | - | *සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා* |
| *ගෘහ කාරක සභාව* | - | *හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා* |
| *ප්‍රඥප්ති හා නීති කාරක සභාව* | - | *සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා* |
| *මහජන පෙත්සම් කාරක සභාව* | - | *ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා* |
| *අවදි කාරක සභාව* | - | *කේ.ඒ. ජනක කුරුප්පු ගරු මන්ත්‍රීතුමා"* |

සියලුම කාරක සභා සඳහා විපක්ෂය වෙනුවෙන් තමයි නම් කරලා තිබෙන්නේ. ඒ අයට මම සුභ පතනවා. ඒ වාගේම මම ඒ ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරනවා. මේ හැම කාරක සභාවක්ම ජනතාව වෙනුවෙන් පවත්වන කාරක සභා බැවින්. එම කාරක සභාවලට අනිවාර්යයෙන්ම සහභාගී වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මම අධ්‍යාපන උපදේශක කාරක සභාවෙන් අස් වෙලා මාව සෞඛ්‍ය උපදේශක කාරක සභාවට පත් කරන්නය කියලා කිව්වා. ඒ වෙලාවේ මෙතැන ඇතුළෙත් ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, ඒ වෙනස කරලා එතුමාව අධ්‍යාපන උපදේශක කාරක සභාවට පත් කරන්න කියලා. නමුත් තවම මාව උපදේශක කාරක සභාවකට පත් කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තවම ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඒ පිළිබඳව දැනුම් දුන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒකට මාසයක් විතර ගත වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. ඔබතුමාගේ පත්වීම කරන්න මාසයක් විතර ගත වුණා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක සභාවේදීම කරපු යෝජනාවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු සංවිධායකතුමා, ඒ පිළිබඳව මට දැනුවත් කිරීමක් කළේ නැහැ. කාවද නම් කරන්නේ කියලා. ඔබතුමා ඒ ගැන ඉක්මණටම කථා කරලා පුරප්පාඩු -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, නැත්නම් මේ මාසේ මට සහභාගී වෙන්න උපදේශක කාරක සභාවක් නැතිව යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මතකයි. ඔබතුමා මගෙන් ඉල්ලීමක් කළා. මටත් ඒ අයිතිය තිබෙනවා. නමුත් මම එහෙම කරන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉන්නවා. ගරු සභානායකතුමා ඉන්නවා. එතුමන්ලාගෙන් -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මම හිතනවා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා එද සභාවේදී සාකච්ඡා කළාට ඒක තවත් නෛතික ස්වරූපයක් ගන්න නම් එතුමා ඉල්ලීමක් කරලා ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට දුන්නා නම්, එතුමා ඒක නෛතික වශයෙන් ඔබතුමාට ලියලාම ඉදිරිපත් කරාවි. එතකල් පොඩ්ඩක් ඉවසමු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මමත් අධ්‍යාපන උපදේශක කාරක සභාවෙන් ඉවත් වුණා. මම ඒක ඔබතුමාට ලිඛිතව දැනුම් දීලා තිබෙනවා. මාවත් වෙනත් උපදේශක කාරක සභාවකට පත් කරයි කියලා මම බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ඉල්ලා අස්වීම් සහ ඒ අවශ්‍යතාවය තිබෙන ඉල්ලීම් කරුණාකර මා වෙත ලිඛිතව යොමු කරන්න. ඒ අනුව මම ක්‍රියා කරන්නම්. මට ඒ ගැන ලිඛිතව දැනුම් දෙන්න. ඒ වාගේම ඒ සම්බන්ධව අපි මේ වන විට අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් විමසලා තිබෙනවා, ඒ ඒ කාරක සභාවලට මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය පිළිබඳව. රීතිවල පැහැදිලිවම කියලා තිබෙනවා, පිට පිට තුන් වතාවක් රැස්වීම්වලට සහභාගී වෙලා නැත්නම් එම කාරක සභාවේ සාමාජිකත්වය අහිමි වන බව. රීතිවල එය සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා අපි අමාත්‍යාංශ ලේකම්වරුන්ට දැනුම් දීලා තිබෙනවා, ඒ කාරක සභාවල පැමිණීමේ වාර්තාව අප වෙත එවන්නය කියලා. ඊට පසුව අපට ඒ ගැන යම්කිසි තීන්දුවක් ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොහෝ අය සහභාගි වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. සහභාගී වෙන්නේ නැහැ. මම දන්න සමහර උපදේශක කාරක සභා තිබෙනවා. ගණ පූරණය නැහැ. තහනම් ඒවා. ඒවා රීති විරෝධීයි. සමහර අමාත්‍යාංශවල උපදේශක කාරක සභා තියනවා. කොහොමද තියන්නේ? උපදේශක කාරක සභාවේ නියෝජිත මන්ත්‍රීවරු කාරක සභාවට එන්නේ නැහැ. වෙන අය ඇවිල්ලා වාඩි වෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

නීත්‍යානුකූල නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නීත්‍යානුකූල නැහැ. ඒ ගැන වාර්තාවක් අපට එවන්නේ නැහැ. රීතිවල පැහැදිලිවම තිබෙනවා, වාර්තාව සභාපතිවරයාට එවන්නය කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පසුගිය අධ්‍යාපන උපදේශක කාරක සභාවට හිටියේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු දෙන්නයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරු දෙන්නයි ඉඳලා තිබෙන්නේ. නීත්‍යානුකූල නැහැ. නමුත් කාරක සභාව යනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එහෙම තියන්න බැහැ. එහෙම නම් මේකත් තියන්න පුළුවන් නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මීට ඉහතත් අපි මේ පළාත් සභාවේදී ප්‍රකාශ කළා උපදේශක කාරක සභාවට නිත්‍ය වශයෙන්ම පත් වුණු මන්ත්‍රීවරු නැත්නම් වලංගු භාවයක් නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නමුත් හැමදාම පවත්වාගෙන ගිහිල්ලා තිබෙන්නේ එහෙම. ගන්න කිසිම තීරණයක්, තීන්දුවක් ක්‍රියාත්මක කරන්න බැහැ. උපදේශක කාරක සභවේ නිත්‍ය වශයෙන් පත් වුණු මන්ත්‍රීවරු 21 දෙනෙක් ඉන්නවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සාමාන්‍යයෙන් ඒවා ක්‍රියාත්මක වෙන්නෙත් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වෙන්නෙත් නැහැ. නමුත් කොහොමත් ඒ 21 දෙනා සම්බන්ධ වෙන්නේ නැත්නම් ඒ තීන්දු තීරණ ගන්න ඒවා වලංගුභාවයක් නැහැ. ඒ උපදේශක කාරක සභාව. පවත්වාගෙන ගිහිල්ලා තිබෙන්නේ ඒ විධියටමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ පිළිබඳව දිගින් දිගටම දැනුවත් කරලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ ගැන ඔබතුමා අවධානය යොමු කරන්න. කවදාවත් වාර්තාවක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ගැන අවධානය යොමු කරනවා. අනිවාර්යෙන්ම අවධානය යොමු කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ වාර්තාව සභාවට යොමු කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් එහෙම යොමු කරන්නේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමා, ඒ වාර්තාව යොමු කරවා ගන්න. දැන් ඔබතුමා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන්ම. මම මේ අවස්ථාවේ සභා ගර්භයේ සිටින ඒ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ උපදේශක කාරක සභා වාර්තාව අපට එවන්න. සභාපතිවරයාගේ නමට එවන්න. එවන්නේ නැහැ නේ? මම කියන්න ගියොත් ඉතින් මටත් ලැජ්ජයි කියන්න. සමහර ලේකම්වරු ලියුම් අත්සන් කරනවා. දිනය නැහැ. දින රහිත ලියුම්. අපේ පළාත් සභාවේ ඉන්න මේ ජ්‍යෙෂ්ට කියන ලේකම්වරු. Protocol එක දන්නේ නැහැ. පළාත් සභාවේ protocol එක දන්නේ නැති ලේකම්වරු අපේ පළාත් සභාවේ ඉන්නවා. මම ඒ අයට කියනවා, දන්නේ නැත්නම් දිනපොත බලන්නය කියලා. ඕනෑ පොඩි එකෙක් දන්නවා පළාත් සභාවේ protocol එක මොකක්ද කියලා. ගාමිණී තිලකසිරි ඇමතිතුමාව පල්ලෙහාට දාලා. මම මේ ඇත්ත කථා කරන්නේ. මට ලිඛිතව පෙන්වන්න පුළුවන්. නමුත් මට අවශ්‍ය නැහැ එහෙම යන්න. ගාමිණී තිලකසිරි ඇමතිතුමා පල්ලෙහායින් ඉන්නේ. සුමිත් ලාල්

[ ගරු සභාපතිතුමා ]

මැන්දිස් ඇමතිතුමා උඩින්ම ඉන්නවා. ඊළඟට ලලිත් වනිගරත්න ඇමතිතුමා ඉන්නේ. මේ පළාත් සභාවේ ඉන්න ජ්‍යෙෂ්ට ඇමතිවරයෙක්. එතුමාගේ නමත් පල්ලෙහායින් දාලා තිබෙන්නේ. ඊටත් පල්ලෙහා සභාපතිවරයා ඉන්නේ. මොනවාද මේ පළාත් සභාවේ යන්නේ. ජ්‍යෙෂ්ට ලේකම්වරු කියනවා. අපි මෙපමණ කාලයක් පළාත් සභාවේ හිටියා කියනවා. නමුත් පළාත් සභාවේ ප්‍රොටෝකෝල් එක දන්නේ නැහැ. දන්නේ නැත්නම් ඒ ලේකම්වරු Diary එක බලලා ඉස්සරහාටවත් ඒ වැඩේ කරන්න. හැමදාම කියන්න පොඩි ළමයි නොවෙයි නේ? ලේකම්වරු කියන්නේ, අපට වඩා උගත් බුද්ධිමත් පිරිසක්. ඉගෙන ගත් පිරිසක්. නැත්නම් Diary එක බලලා ඒ වැඩේ කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

protocol එක දාලා ලියුමක් අරින්න. දන්නේ නැත්නම් කියන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලියුම් අරින්න ඕනෑ නැහැ. ඒක දැන්නේ නැද්ද? Diary ය බෙදලා තිබෙනවා. හැම දේම දන්නවා නේ පළාත් සභාවේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දන්නේ නැත්නම් දැන ගන්න කියන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ටිකක් නම් නොකියා කිව්වේ ඒකයි මේ. ඔබතුමාගේ නමත් පල්ලෙහා තිබෙන්නේ. මම ඕනෑ නම් පෙන්වන්නම්. මම ඕවා ප්‍රසිද්ධියේ කියන්න ගියේ නැහැ. හොඳ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කියන්න ඕනෑ. නොකියා ඉඳලා හරියන්නේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

තව මාස දහයයි තිබෙන්නේ. කියන්න තිබෙන ඔක්කොම කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉස්සරහාට පටන් ගන්නවා කියන්න. අපේ පළාත් සභාවේ ප්‍රවෘත්ති නිලධාරී දීප්ති විජේතුංග මහත්මයා මට ලිපියක් එවලා තිබෙනවා. නිවේදනයක් වශයෙන් ඉදිරිපත් කරන්නය කියලා. දශක තුනක පළාත් සභාවේ අභිමානය ග්‍රන්ථය සම්පාදනය කිරීම. මේක ඉතා වැදගත් දෙයක්. එතුමා මේ සැලසුම් කරන්නේ. එතුමා නිර්මාණය කරන්නේ. ඉතාමත් වැදගත් දෙයක්. එතුමා මා මඟින් ප්‍රකාශ කරනවා, *දශක තුනක බස්නාහිර පළාත් සභාවේ අභිමානය ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම : ඉහත කරුණට අදාළව ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට අදහස් කර ඇති බැවින්, එම ග්‍රන්ථයට එක් කිරීම සඳහා බස්නාහිර පළාත් සභා රැස්වීම පැවැත්වෙන අවස්ථාව දැක්වෙන ඡායාරූප කිහිපයක් ලබා ගැනීමට අවශ්‍ය වී ඇත. දැනට පවතින සභා ශාලාවේ පිහිටීම අනුව එවන් ඡායාරූප ගැනීමේදී සභා ගර්භයට පිවිස ඡායාරූප ගැනීමට සිදු වේ. ඒ අනුව සභාවේ කටයුතුවලට කිසිම බාධාවක් නොවන අයුරින් ගරු මන්ත්‍රීවරුන් අසුන් ගෙන සිටින ආසන අතරට නොයා, එහෙත් ආණ්ඩු පක්ෂයේ සහ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආසනවලට පිටුපස හිස් කොටසේ සහ ගරු සභාපතිතුමාගේ අසුනට දෙපස කොටසේ සිට ඡායාරූප කිහිපයක් ලබා ගැනීම සඳහා ඉතා කෙටි වේලාවකට අද දින, එනම් 2018.06.05 දින සභා රැස්වීම පැවැත්වෙන අවස්ථාවේ ඡායාරූප ශිල්පියෙකුට සභා ගර්භයට ඇතුළු වීම සඳහා අවසර ලබා දෙන ලෙස* එතුමා මගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒකත් අපට අවශ්‍ය දෙයක්. ඒ නිසා මම එතුමාගේ ඉල්ලීමට ඉඩ දෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලා ඒ සඳහා සහාය දක්වන්න.

මොකද, මම දැක්කා, එදා අපි ගිණුම් කාරක සභාවේ වැඩ මුළුවට සහභාගී වුණා. ඒ වැඩ මුළුවේදී ඉතා සාර්ථකව වීඩියෝ ක්ලිප් එකක් ඉදිරිපත් කළා. ඒ ගිය අය ඒ වීඩියෝ ක්ලිප් එක දකින්න ඇති. හරිම පැහැදිලිව. සභාව රැස් වෙන්නේ කොහොමද? එතකොට ගිණුම් කාරක සභාවේ තිබෙන කාර්යභාරය. ඒකේ වටිනාකම. ඒ හැම දෙයක්ම ඒ පුංචි වීඩියෝ ක්ලිප් එකක ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ වුණා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ අභිමානය ග්‍රන්ථය තුළිනුත් ඒ පිළිබඳව අපි යම්කිසි දෙයක්, ඒ අවුරුදු 30 ක කාලය තුළ පළාත් සභාවේ සිදු වුණු දේ ඉදිරිපත් කරන්න. ඒ සඳහා ගරු ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න.

## කාරක සභා වාර්තා පිළිගැන්වීම
PRESENTATION OF COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018.05.23 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දැනුයි දැක්කේ ගරු ප්‍රධාන ලේකම්තුමා ඉන්නවා. මම කියපු ටික එතුමා සිටිද්දියි මට කියන්න තිබුණේ. අපේ ජ්‍යෙෂ්ට ලේකම්තුමන්ලා protocol එක දන්නේ නැහැ. සමහර අය. මම ඒ අයට දැන් ඔබතුමා එන්න ඉස්සෙල්ලා කිව්වේ, අපේ දිනපොත දිහා බලලා ඒ protocol එක හඳුනාගෙන ඒ ආරාධනා පත්‍ර සකස් කිරීමේදී, ඒ ආරාධනා කිරීමේදී - ඔබතුමාවත් මම දැනුවත් කරනවා. ප්රධාන ලේකම්තුමා වශයෙන් ඔබතුමා ඒ ගැන ක්‍රියාමාර්ගයක් ගන්න. නැත්නම් මේක ප්‍රශ්නයක්. ජ්‍යෙෂ්ට ඇමතිවරු පල්ලෙහාට යනවා. අපි ඔක්කොම එකයි. නමුත් ඒක තියෙන්න ඕනෑ පළාත් සභාවේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමා, සභානායකතුමාවත් නිසි තැන තියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි උපරිම උත්සාහ කරනවා. ඒ තැන්වල තියනවා අපි. සමහර අය තමයි.

## පෙත්සම්
PETITIONS

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, ඉංගිරිය, රයිගම්වත්ත පහළ කොටස, නො 119 හි පදිංචි ටී. කල්‍යාණි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, කලගෙඩිහේන, කුරුඳුවත්ත පාර, අංක 31/2 හි පදිංචි පී.එම්. ජයන්ත යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මඩපාත, දම්පේ, 262/5 හි පදිංචි ජේ.වී. අසංක සොයිසා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

## ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම
QUESTIONS, INTERIM QUESTIONS OF PREVIOUS MEETING AND ANSWERS TO SUCH

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ප්‍රශ්නය යොමු කරනවා.

**01.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI/(1)/18/19)**

අ. i. මතුගම අධ්‍යාපන කලාපයේ වර්ෂ 2017 අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?

ii. එයින් ජාතික පාසල්වල ළමුන් සංඛ්‍යාව හා පළාත් පාසල්වල ළමුන් සංඛ්‍යාව වෙන වෙනම කොපමණද?

ආ. i. මෙම විභාගයට පෙනී සිටි ළමුන්ගෙන් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

ii. එයින් ජාතික පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

iii. එම සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

iv. මෙය පළාත් පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

v. එම සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

ඇ. i. මෙම විභාගයේදී ගණිත විෂය පමණක් අසමත් මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?

ii. එය ජාතික පාසල් මට්ටමින් කොපමණද?

iii. එය පළාත් පාසල් මට්ටමින් කොපමණද?

iv. ජාතික පාසල් හා පළාත් පාසල් මට්ටමින් ප්‍රතිශතාත්මකව කොපමණද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. i. 3363

ii. ජාතික පාසල්වල දරුවන් - 736
පළාත් පාසල්වල දරුවන් - 2627

ආ. i. සමත් සංඛ්‍යාව - 2200
අසමත් සංඛ්‍යාව - 1163

ii. සමත් සංඛ්‍යාව - 664
අසමත් සංඛ්‍යාව - 72

iii. සමත් ප්‍රතිශතය - 90%
අසමත් ප්‍රතිශතය - 10% (ජාතික පාසල් මට්ටමින්)

iv. සමත් සංඛ්‍යාව - 1536
අසමත් සංඛ්‍යාව - 1091

v. සමත් ප්‍රතිශතය - 58%
අසමත් ප්‍රතිශතය - 42% (පළාත් පාසල් මට්ටමින්)

ඇ. i. අසමත් සංඛ්‍යාව - 1098

ii. 81

iii. 1017

iv. ජාතික පාසල් - 11%
පළාත් පාසල් - 39%

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමතිතුමා, ඔබතුමාට මේ ප්‍රතිඵල විශ්ලේෂණය කරන කොට පෙනී යනවා, පසුගිය වර්ෂය සඳහා සාපේක්ෂව දරුවන්ගේ අසමත් සංඛ්‍යාව ගත්තොත් එහෙම ඒක වැඩි වීමක් වෙලා නැහැයි කියලා. මම කියන්නේ, මේකට ඔබතුමාගේ පැත්තෙන් මොකක්ද වැඩ පිළිවෙළ? මේ දරුවන් අසමත් වන සංඛ්‍යාව සමත් දරුවන් බවට පත් කරන්න වැඩ පිළිවෙළක් එහෙම සකස් කරලා තිබෙනවාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ප්‍රදේශයේ ළමයි අසමත් වෙන කොට ගරු ඇමතිතුමා ලැජ්ජා වෙන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjithe Somawansha - Minister

ගරු සභාපතිතුමනි, දැන් එතුමාත් ප්‍රශ්නයක් අහනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එතුමා ප්‍රශ්නයක් අහන්නේ නැහැ. මෙතුමා අවසර දුන්නොත් අහන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjitha Somawansha - Minister

අපට තිබෙනවා, මේ පිළිබඳව අවබෝධයක්. දැන් අවංකවම මීට අවුරුදු දෙකකට කලින් අපි මේ විෂයයන්වල සාමාන්‍ය පෙළ අසමත් වීම පිළිබඳව වැදගත්ම විෂය බවට පත් වෙන්නේ ගණිතය සහ භාෂාව. ඒ නිසාවෙන් ගණිත ප්‍රවර්ධන වැඩ සටහනක් අපි මොරටුවේ සර්වෝදය මධ්‍යස්ථානයෙන් ආරම්භ කළා. එහි මූලාසනයටත් මම ආරාධනා කළා, ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහත්මයාට.

එතැන ඉඳලා මේ වැඩ සටහන අපි කර ගෙන යනවා. විවෘත විශ්ව විද්‍යාලය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ මේ සම්බන්ධව ආචාර්ය උපාධි පවා තිබෙන ගුරු භවතුන් කැඳවලා අපි විශේෂ වැඩ සටහනක් කර ගෙන යනවා. දැනුත් මේ වැඩ සටහන කර ගෙන යනවා. මම අවංකවම කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමා මේ අහපු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න..

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ වැඩ සටහන තමයි එතුමා අහන්නේ. මේ සම්බන්ධව ගුරු භවතුන්වත් පුහුණු කිරීමේ තත්ත්වයට අපි කර ගෙන යනවා. තත්ත්වය ඒක තමයි. ඒ වාගේම මම විශ්වාස කරනවා. සිංහල භාෂාව සම්බන්ධවත් විශේෂ ව්‍යාපෘතියක් ගොඩ නගලා මේ දවස්වල අපි උපරිම කැප වීමකින් කටයුතු කර ගෙන යනවා. අවශ්‍ය නම් නිලධාරීන්ගේ නම් පවා කියන්න පුළුවන්. නැත්නම් අපේ ලේකම්තුමා හම්බ වුණොත් වැඩි විස්තර දැන ගන්නත් පුළුවන්. බොහොම ස්තූතියි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමතිතුමා, මම දැන් ගිය වසරේත් මේ ප්‍රශ්නය ඇහුවා. ගිය වසරේත් මේ විධියටම ප්‍රශ්න කළා. ඊට පස්සේ මේකේදී විශේෂයෙන්ම ඔබතුමාගේ ප්‍රදේශය තමයි මතුගම ප්‍රදේශය. මම උදාහරණයක් කියන්නම්. දැන් ගිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. මට ප්‍රශ්න ඇසීමේදී එහෙම උදාහරණවලට ගොඩක් යන්න බැහැ. ඔබතුමා කෙටියෙන් අතුරු ප්‍රශ්නයක් අහන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමතිතුමා, ඔබතුමා ගිය සභාවේ හිටියේ නැහැ. ගියවර උත්තර දුන්න එකක්මම කියන්නේ. හල්කඳවිල පාසලේ ළමයි 88 දෙනෙකු විභාගයට යන කොට ළමයි 18 දෙනයි පාස්. වාද්දුව ධර්මපාලේ 31 දෙනෙකු විභාගයට යන කොට 14 යි පාස්. දැන් ඔබතුමාට මේ ප්‍රතිඵල විශ්ලේෂණය කළොත් එහෙම සෑම කලාපයෙන් කලාපයට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. ඔබතුමා ලොකු කාලයක් ගන්නවා. ඔබතුමා අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න. එතුමා කෙටියෙන් උත්තර දෙයි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මේ ප්‍රතිඵල දිහා බලලා මේ වසරේ සිට අසමත් දරුවන්ට ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේක ජාතික මට්ටමේ ප්‍රශ්නයක්. එතුමාට මම ආරාධනා කරනවා මගේ අමාත්‍යාංශයට මේ සම්බන්ධව - ඒ වාගේම අර අතරින් පැනලා හොම්බ දාපු අධි නීතිඥ සුනිල් වටගලටත් මම ආරාධනා කරනවා. හොම්බ දාන්නේ නැතිව මාව හම්බ වෙන්න කියලා. මොකද, මේක ඇවිල්ලා ජාතික මට්ටමේ ප්‍රශ්නයක්. මේ විෂයයන්වලට නිවැරදි ගුරුවරු අද නිෂ්පාදනය වෙන්නේ නැහැ. මේක විශ්ව විද්‍යාලවලින් පවා අද මේ පන්ති කාමරයේ විෂයට අදාළ ගුරුවරයා නොවෙයි අපට ලැබෙන්නේ. අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා පුළුල් කරන්න කියලා අපි යෝජනා කරලා තිබෙනවා. විද්‍යා පීඨ වැඩි කරන්න කියලා යෝජනා කරලා තිබෙනවා. Training college වල පුහුණුව ඉස්සර තිබුණා. මම හිතන්නේ, රන්වල ගරු මන්ත්‍රීතුමාගේ දෙමව්පියෝ ඒ පසුබිමේ හිටපු ගුරුවරු වෙන්න ඇති. ඒ තිබුණු පුහුණු වීම් ක්‍රමය දැන් වෙනස් කරලා තිබෙන්නේ. විෂය සම්බන්ධව විද්‍යා පීඨ වැඩි වෙන්න ඕනෑ. ඒ වාගේම විශ්ව විද්‍යාලයේ මේ පන්ති කාමරයේ විෂයයට අදාළ ගුරුවරුන් බිහි කිරීමේ පාඨමාලා, එහෙම නැත්නම් පීඨ, faculty වැඩි වෙන්න ඕනෑ. මේවා ඉතාම නිවැරදිව අපි යෝජනා කරනවා. සමහර ඒවා අපට තනියම කරන්න බැහැ. ඇත්ත කථාව මේක. ගුරු පුහුණුව ඉතා විධිමත් වෙන්න ඕනෑ. කොන්ක්‍රීට් වනාන්තර නොවෙයි අධ්‍යාපනය කියන්නේ. ගුරු පුහුණුව තිබෙන්න ඕනෑ. විෂය මාලා සංවර්ධනය තිබෙන්න ඕනෑ. මේ විෂයයට අදාළ කැමැත්ත තිබෙන අය තමයි ගුරුවරුන්

[ ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

හැටියට බඳවා ගන්නේ. දැන් ඔක්කොම එක ලෝඩ් එකට එනවා. මොකද, ගුරුවරු ඉල්ලලා දැන් රටේ ප්‍රශ්නයක් තිබෙනවා. අපි දෙනවා. නමුත් මේක අපි කැපවීමෙන් කළ යුතු දෙයක්. එතුමාටත් මම සම්පූර්ණයෙන් උදව් කරනවා. එතුමා කැමැති නම් මතුගම කලාපය භාර දීලා එතුමාට වැඩ කරන්න ප්‍රතිපාදනත් දෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

දෙන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේකට පිළිතුරු හෙට හම්බ වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ අවසරය ඇතිව තුන් වන අතුරු ප්‍රශ්නය.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඒ සම්බන්ධව හෙට රැස්වීමක් තිබෙනවා. ඒකට සහභාගී වෙන්න කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා අවසර දුන්නා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා දන්නවාද කියලා මම දන්නේ නැහැ. මේ ගණිතයට දුර්වලකම, ඒ කියන්නේ ගණිතයට දුර්වල දරුවන්ගේ ගණිත හැකියාවන් වර්ධනය කරන්න අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ගණිත අධ්‍යක්ෂවරයෙක් ව්‍යාපෘතියක් ඉදිරිපත් කළා. නමුත් ඒක අධ්‍යාපන අමාත්‍යාංශය භාර අරගෙන කටයුතු කළේ නැහැ. ඔබතුමා සූදානම්ද එම ව්‍යාපෘතිය බස්නාහිර පළාත තුළ ගණිතය අසමත් දරුවන් සඳහා ක්‍රියාත්මක කරන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම හිතන්නේ, විජයදාස මහත්තයා වෙන්න ඇති.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විජයදාස මහත්තයාව අපි ගෙන්වලා සාකච්ඡා කළා. මේ විෂය සම්බන්ධව ඉතාමත් හොඳ අධ්‍යක්ෂවරයෙක්. ඒකේදී අවංකවම ඔබතුමාගේ ඉල්ලීම මම භාර ගන්නවා. ඒ වාගේම මේ වන කොටත් අපි අර කියපු ගණිතය සම්බන්ධව ඉතාම ඉහළ මට්ටමේ ගුරු භවතුන්. විශේෂයෙන් කථිකාචාර්යවරු තමයි අපි ගෙනැල්ලා කටයුතු කළේ. මම ඔබතුමාටත් ආරාධනා කරනවා බොහොම අවංකව. එතුමාවත් අපට සම්බන්ධ කරන්න. මේ වගකීම අපි තුන් දෙනත් එක්කම එකතු වෙලා ඉෂ්ට කරමුයි කියලා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 02 යටතේ ඇති ප්‍රශ්නයත් එතුමාගේමයි. ඒකත් අධ්‍යාපන අමාත්‍යතුමාට යොමු වෙන්නේ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ප්‍රශ්නය යොමු කරනවා.

**02.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI/(1)/18/20)**

අ. i. හොරණ අධ්‍යාපන කලාපයේ වර්ෂ 2017 අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?

ii. එයින් ජාතික පාසල්වල ළමුන් සංඛ්‍යාව හා පළාත් පාසල්වල ළමුන් සංඛ්‍යාව වෙන වෙනම කොපමණද?

ආ. i. මෙම විභාගයට පෙනී සිටි ළමුන්ගෙන් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

ii. එයින් ජාතික පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

iii. එම සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

iv. මෙය පළාත් පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

v. එම සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

ඇ. i. මෙම විභාගයේදී ගණිත විෂය පමණක් අසමත් මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?

ii. එය ජාතික පාසල් මට්ටමින් කොපමණද?

iii. එය පළාත් පාසල් මට්ටමින් කොපමණද?

iv. ජාතික පාසල් හා පළාත් පාසල් මට්ටමින් ප්‍රතිශතාත්මකව කොපමණද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. i. 5190

ii. ජාතික පාසල්වල දරුවන් - 1364
පළාත් පාසල්වල දරුවන් - 3826

ආ. i. සමත් සංඛ්‍යාව - 3431
අසමත් සංඛ්‍යාව - 1759

ii. සමත් සංඛ්‍යාව - 1240
අසමත් සංඛ්‍යාව - 124

iii. සමත් ප්‍රතිශතය - 90.90%
අසමත් ප්‍රතිශතය - 09.10% (ජාතික පාසල් මට්ටමින්)

iv. සමත් සංඛ්‍යාව - 2191
අසමත් සංඛ්‍යාව - 1635

v. සමත් ප්‍රතිශතය - 57.26%
අසමත් ප්‍රතිශතය - 42.74% (පළාත් පාසල් මට්ටමින්)

ඇ. i. අසමත් සංඛ්‍යාව - 1687

ii. 146

iii. 1536

iv. ජාතික පාසල් - 11%
පළාත් පාසල් - 40%

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමතිතුමා, ඒකෙත් අර වාගේම තමයි ප්‍රතිඵල විශ්ලේෂණය කළාට පස්සේ. දැන් ජාතික පාසල් ගත්තොත් එහෙම අපට වැඩිය ඉහළ තැනකින් ඉන්නවා. ප්‍රතිඵල විශ්ලේෂණය කරද්දී. පළාත් පාසල්වල තමයි මේකේ ප්‍රවණතාවය අඩුයි. ගණිතය අසමත් වන සංඛ්‍යාව වැඩිපුර තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් නැවත නැවත ප්‍රශ්න කරන්න ඕනෑ නැහැ. ඇත්තටම ඉල්ලා සිටින්නේ මේකට මොකක් හරි වැඩ පිළිවෙළක් දාන්න. මේ දරුවන් ගණිතය අසමත් වන සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගණිතය අසමත් වන සංඛ්‍යාව සමත් කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන වැඩ සටහනක් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය පිළිබඳව බොහොම උනන්දුවක් දක්වන මන්ත්‍රීවරයෙක් තමයි නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා. මම ඒ ගැන බොහොම අවංකව කියන්න ඕනෑ. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාටත් වඩා, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාටත් වඩා බොහොම කැප වීමෙන් අපිත් එක්ක අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා කටයුතු කරනවා නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා. මම

[ ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

සම්පූර්ණ සහයෝගය, එතුමාගේ අදහස්වලට ගරු කරලා සහයෝගය දෙනවා. ගණිතය විෂය සම්බන්ධව විශේෂ ව්‍යාපෘති දෙකේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙකු හැටියට සහ මගෙත් එක්ක බොහොම ළඟින් කටයුතු කරන්නය කියලා බොහොම ගෞරවයෙන් ආරාධනා කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පිට එකක් නම් මට අවස්ථාව දෙන්න බැහැ. ඔබතුමා ඒක ලියලා දුන්නේ නැහැ නේ? මට ඔබතුමා ලිඛිතව ඒක සඳහන් කරලා එව්වේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

වරප්‍රසාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දැන් එහෙමද තිබෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමයි තිබෙන්නේ. බොහොම ස්තුතියි. ඔබතුමා හොඳ ළමයෙක්. කියන එක අහනවා. තුන්වන ප්‍රශ්නයත් එතුමාගේමයි. ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ලැහැස්ති වෙලා හිටියේ. මේ පිළිතුර බලාගෙන යන කොට මට සෑහීමකට පත් වෙන්න බැහැ. අඩුපාඩුවක් තිබෙනවා. ඒ නිසා ඒ සඳහා පිළිතුරු දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අන්න ඇමතිවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 04 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය යොමු කරනවා.

**04.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VII/(1)/18/22)**

අ. වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හොරපෙ සිට හීන්කෙන්ද දක්වා දිවෙන මාර්ගයේ පළමු පාලම අලුතෙන් ඉදි කිරීම සඳහා කොපමණ මුදලක් වෙන් කළේද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ආ. එකී පාලමේ සැලසුමට අනුව පැති බැම්මේ දිග කොපමණද යන්නත්, සකස් කරන ලද්දේ කොපමණ දිගකින්ද යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

ඇ. මේ වන විට එකී ව්‍යාපෘතිය නිම කර අවුරුද්දක් යන්නටත් පෙර පාලම ඉති තැලී ඇති බව ඔබතුමා දන්නේද?

ඈ. මේ වන විට එකී පාලම දෙපස වලවල් හැරී ඇති බැවින් ඒ හරහා ගමන් කිරීමේදී ගැටළු සහගත තත්ත්වයකට පත්ව ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඉ. එසේ සාර්ථකව එම ව්‍යාපෘතිය නිම නොකිරීම සම්බන්ධයෙන් අදාළ අයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

ඊ. නොඑසේනම් ඒ මන්ද?

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නය බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාලමක් හා මාර්ගයක් නොවන බවත්, එය වත්තල ප්‍රාදේශීය සභාවට අයත් පාලමක් හා මාර්ගයක් බවත් දන්වා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමා කියන්නේ ඒ පාලම PRDA එකට අයිති නැහැයි කියලා. ඒ පාලම අයිති වත්තල ප්‍රාදේශීය සභාවට. ඒ නිසා එතුමාට ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න බැහැයිලු.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, ඒක තමයි කියන්නේ. දන්නේ නැතිව කවුරුවත් ලියලා දුන්න පළියට ගේනවා. වත්තල ප්‍රාදේශීය සභාවේ පාරක් ගැන තමයි අහලා තිබෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා ඉන්න කෝ? ඇයි පනින්නේ? දැන් ගියවරත් ගරු සභාපතිතුමනි, - දැන් මෙතුමා ඇමතිද? මේ හොරා කාපු හින්දාද මේ කළබල වෙන්නේ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මෝඩයෙක් වාගේ ලියලා දෙන ඒවා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මෝඩයෙක් වාගේ නොවෙයි. මෝඩයා කෑ ගහන්න එපා. හොරා. පට්ට හොරා. මේ හොරකම් කරපු හින්දා තමයි මේ පාලම කැඩිලා තිබෙන්නේ. මෙතුමා තමයි වගකියන්න ඕනෑ. ඒකයි මම ප්‍රශ්නය ඇහුවේ. මෙතුමා තමයි වගකියන්න ඕනෑ. හැමදාම පනිනවා. මම දන්නවා කලබල වෙනවා කියලා. කලබල වෙනවා කියලා අපි දන්නවා. ඇයි කලබල වෙන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇයි මේ කලබල වෙන්නේ? කවුරු හරි ලියලා දෙන ඒවා මම කියන්නේ නැහැ. ඔබතුමා ඉන්න. ඔබතුමා මොකටද කලබල වෙන්නේ? හොරා කාපු හින්දානේ කලබල වෙන්නේ. දැන් මම අහන්නේ ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා. කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇයි කලබල වෙන්නේ. හොරාට කලින් කෙහෙල් කැන වැට පනිනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

කලබල වෙන්න දෙයක් නැහැ. ගමේ ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම පස්සේ ඔබතුමාගෙන් අහන්නම්. මම කියනවා, මෙතුමාට මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කියලා. මෙතුමාට උත්තර දෙන්න කියන්න මේ ප්‍රශ්නයට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. එදත් මම මූලාසනයේදී ප්‍රකාශ කළා.

[සභාවේ ඝෝෂා]

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ප්‍රශ්න ඇසීමේදී දැනුවත්භාවයෙන් අහන්න ඕනෑ. දැන් ඇමතිතුමා කියන්නේ මේ පාලම සහ මාර්ගය පළාත් සභාවට -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පළාත් පාලන ආයතන පළාත් සභාව යටතේ නොවෙයිද තිබෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මහ ඇමතිතුමාගෙන් අහන්න. එතුමා තමයි විෂය භාර ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. එහෙම නම් මම ඊළඟ සැරේ එතුමාගෙන් අහන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අහන්න. මේකයි ප්‍රශ්න අහන කොට කරුණාකරලා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

දැනගෙන අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා කලබල වෙන්න එපා. මම ඊළඟ සැරේ මහ ඇමතිතුමාගෙන් අහන්නම්. දැනගෙන තමයි අහන්නේ. දැනගෙන ගිහිල්ලා බලලා අහන්නේ. හොරා කාලා පාලම් ටිකයි, පාරවල් ටිකයි ඔක්කොම කැඩිලා. මොනවාද මේ?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

බොරු කියන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කවුද බොරු කියන්නේ කියලා පැහැදිලියි. ඇයි කලබල වෙන්නේ කියලා පැහැදිලියි. ප්‍රශ්නයක් දැම්මාම කලබල වෙනවා. ඇයි? හොරකම් කරපු හින්දා කලබල වෙනවා.

ගරු සභාපතුමනි, ප්‍රශ්න වටය අවසන් නේ? ප්‍රශ්න වටය අවසන් නිසා පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට ඉතාම ගෞරවයෙන් යුතුව ප්‍රකාශ කරනවා. එකක් තමයි, මම මේ සභාවට ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ අවබෝධයෙන් යුතුව. මට මේ ප්‍රශ්නය මහ ඇමතිතුමාට ඊළඟ වතාවේ ඉදිරිපත් කරන්නම්. ඒක වෙනමම ප්‍රශ්නයක්. නමුත් මම මේ සභාවට කිසිදු ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ නැහැ, අවබෝධයක් සහ ඒ ප්‍රශ්නය පිළිබඳව හොඳ අවධානයකින් තොරව. මම ගිය සැරේ ප්‍රශ්නය ඉදිරිපත් කළෙත් එහෙමයි. ඒ වාගේම මම ගියසැරේ චන්ද්‍රජෝති විදුහල පිළිබඳව ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. එතකොට - අමැතිතුමා එදා හිටියෙත් නැහැ. ඇමතිතුමා මට කථා කරලා කිව්වා, උදෙන්ම එන්න වෙන්නේ නැහැ කියලා. මට ගියවර සභාවට එන්න වෙන්නේත් නැහැ කියලා මම එතුමාට කිව්වා. එතකොට මේ සභාවේදී ප්‍රශ්නයට උත්තර දෙනවාය කියලා කිව්වා. කොහොම වුණත් ඒක මම හිතන්නේ, සභාගත කරලා තිබෙනවා. ඒ වෙලාවේදී ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ පැත්තෙන් - මම හිතන්නේ, ඒක ඔබතුමාගේ තනතුරටත් ගැලපෙන්නේ නැහැයි කියලා මම හිතනවා. ඔබතුමාට

ඉතාමත් ගෞරවයෙන් කියන්නේ. ඔබතුමාගේ පැත්තෙන් ඒ සඳහා අදහස් දක්වලා තිබුණා. චන්ද්‍රජෝති විදුහලේ එහෙම ප්‍රශ්නයක් නැහැයි කියලා. මම ඉතාම වගකීමෙන් යුතුව ප්‍රකාශ කරනවා. මොකද, මට ප්‍රශ්න එනවා. දෙමව්පියන්ගෙන් එනවා. ගුරුවරුන්ගෙන් එනවා. ප්‍රජාවගෙන් එනවා. හැබැයි, ඒ ප්‍රශ්න පිළිබඳව මම හොඳ විමර්ශනයක් කරලා තමයි අදාළ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. ප්‍රශ්නය අහපු පලියට ඉදිරිපත් කරන්නේ නැහැ. චන්ද්‍රජෝති විදුහලේ එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. පරිපාලනය කඩාගෙන වැටිලා තිබෙනවා. මේ ඉදිරිපත් කරන්නේ, ඔබතුමාම දන්නවා, අපේ ප්‍රදේශයේ තිබෙන ඉතාම කීර්තිමත් පාසලක්. මේ පාසල බිඳ වැටෙන නිසා තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඔබතුමාගේ පැත්තෙන් කියලා තිබුණා එහෙම ප්‍රශ්නයක් මේකේ නැහැයි කියන එක. ඇයි මන්ත්‍රීවරුත් කලබල වෙන්නේ. මම ප්‍රශ්නය ඉදිරිපත් කළාට ඇමතිතුමාට වඩා මන්ත්‍රීවරු කලබල වෙලා. මෙහෙම වුණොත් අපට ප්‍රශ්න ඉදිරිපත් කරන්න බැහැ මේ සභාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සභාගත කරපු උත්තරේ මම තවම දැක්කේ නැහැ. කියවන්න හම්බ වුණේ නැහැ. නමුත් ඔබතුමා කියන තරම් බරපතළ කාරණාවක් චන්ද්‍රජෝති ඉස්කෝලේ නැහැ. හැබැයි, මම ඒක සොයලා බැලුවා. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය කිව්වා, බලලා මට දෙන්න කියලා. එතුමිය නම් මට වාර්තා කළේ එහෙම ලොකු මේවා එකක් නැහැයි කියලා ඒකේ. මෙහෙමයි. සමහර ගුරුවරු ඉන්නවා, පාසල ඇතුළත - එතුමා මට වාර්තා කළේ එතරම් බරපතළ ගැටළුවක් නැහැ. පොඩි පොඩි ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. නමුත් සමහර පාසල්වල ගුරුවරු ඉන්නවා. මම දන්නේ නැහැ. එක එක පක්ෂ නියෝජනය කරන අය ඉන්නවා. අන්න ඒ ගුරුවරු තමයිලු ගොඩක් ඒ චන්ද්‍රජෝති විදුහලේ ප්‍රශ්නය වැරදි විධියට ඔබතුමාට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම නැවත වරක් ඒක සොයලා බලන්නම්. ඔබතුමාත් පොඩ්ඩක් දීපුවාම එක පාරටම ප්‍රශ්නය ඉදිරිපත් කරන්න එපා. ඔබතුමා පොඩ්ඩක් හොඳට සොයලා බලන්න කෝ. ගම්පහ නම් මගෙන් අහන්න මෙහෙම දෙයක් තිබෙනවාද කියලා. බොහොම සාධාරණව මම ඒවාට උත්තර දෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, රීති අංක 37. දැන් කැඩුනේ. කලින් කැඩුනු එකක් නොවෙයි. දැන් කැඩුනේ. ගරු සභාපතිතුමනි, ඇතුළට එන කොට කැඩුනේ. රීති අංක 37. කලින් කඩා ගත්ත එකක් නොවෙයි. පුළුවන් නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම දැන් එළියට ගිහිල්ලා ඇතුළට එන කොට මට කථා කරලා ඇහුවා, ප්‍රවෘත්තිවලට ගිහිල්ලා තිබෙනවා දැන් ටිකකට ඉස්සෙල්ලා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන් ප්‍රමාණයකට බැඳුම්කරයේ සල්ලි ඇලෝසියස් දීලා තිබෙනවාය කියලා. අද ප්‍රවෘත්තිවලට ගිහිල්ලා තිබෙනවා. දැන් පොඩ්ඩකට ඉස්සෙල්ලා. ඒ නිසා ඒ මුදල් ගත්තේ කවුද කියන එක පිළිබඳව අදාළ වාර්තාවෙන් ඉල්ලා සිටීමේ අයිතිය ඔබතුමාට තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා විධියට - දැන් මේ අපේ අයිතිවාසිකමක්. පොදුවේ නම් කියලා නැහැ. බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු ප්‍රමාණයක් කියලා, කියලා තිබෙනවා. ඒ නිසා ඒ කවුද කියන එක පිළිබඳව දැන ගන්න අවශ්‍යයි. දැන් ගරු සභාපතිතුමනි, ඔබතුමා ඇතුළු අපි සියලු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද කඩ වෙන්නේ. එක්කෙනෙක් දෙන්නෙක් එහෙම කරලා තිබෙනවා නම්, ඒ කවුද කියන එක අනාවරණය කරන එක ගරු සභාපතිතුමා විධියට ඔබතුමාගේ වගකීමක්. ඒ වගකීම උදෙසා අපි ඉල්ලා සිටිනවා, අතිගරු ජනාධිපතිතුමාගේ ලේකම්තුමාගෙන්. ඒ වාර්තාව භාරව ඉන්න නිලධාරීවරයාගෙන් ලිඛිතව ඉල්ලීමක් කරන්නය කියලා. බස්නාහිර පළාත් සභාවේ යම් මන්ත්‍රීවරයෙකුට මේ මුදල් දීලා තිබෙනවා නම්, මේ මුදල් ගත්ත මන්ත්‍රීවරයා කවුද කියන එක පිළිබඳව එළිදරව් කරන්න කියලා. මොකද, නැත්නම් ඔක්කෝටම ඇඟිල්ල දික් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට අදාළවම වරප්‍රසාද ප්‍රශ්නයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙම කථා කරන්න දෙන්න බැහැ. වරප්‍රසාද කථා කරන්න බැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අරගත්තාද?

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

අද පළාත් සභා මන්ත්‍රීවරයෙකුට මළ ගෙදරකට, මඟුල් ගෙදරකට යන්න බැහැ. මන්ත්‍රීවරුන්ගේ නම් කියවෙනවා. ගත්ත අයගේ නම් දෙකක් කියවෙනවා. ඒ නිසා තමුන්නාන්සේ සභාපතිවරයා හැටියට -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ. නම් දෙක්ක නොවෙයි. නම් නැතිව කියන්නේ. නම් කියන්නේ නැහැ. නම් නැතිව පොදුවේ කියන්නේ.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ඔබතුමාගේ වගකීම තමයි මේ පිළිබඳව සොයා බලලා ඒ මන්ත්‍රීරුවන් කවුද කියලා, හෙළිදක්වන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක සොයලා බලන්නම්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නම් කවුද කියලයි -

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

මේ ප්‍රශ්නය නිසා පළාත් සභාවට බොහොම අපකීර්තියක් ඇති වෙලා තිබෙනවා. මහ ලොකුවට සමාජ හිතකාමී, පරාර්ථකාමී විධියට කථා කරලා ඒ පුද්ගලයින්ගෙන් සල්ලි අරන් මේවා යටි මඩි ගහන්න කුමන්ත්‍රණය කරන අය සභාව තුළ ඉන්නවා. ඒ නිසා තමුන්නාන්සේ ඒක නිවැරදි කරන්න කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක ප්‍රකාශ කරන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති 37 යටතේ මම ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාට දැන් සිදු වුණු එකක් නොවෙයි නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මහ ඇමතිතුමා, අවසරද කියන්න. ගරු සභාපතිතුමනි, මහ ඇමතිතුමාගේ නම කියන්න අවසරද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, අපි න්‍යාය පත්‍රයට යමුද? නැත්නම් මේක -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සමාවෙන්න. මහ ඇමතිතුමාගේ ප්‍රශ්නයක් මම මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඔබතුමාට සම්බන්ධ නැහැ නේ? මම ඒ ගැන ගරු කථානායකතුමා වාගේ අවශ්‍ය කරුණු සොයා බලලා මේ සභාවට මම වාර්තාවක් දෙන්නම්.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. මම දන්න විධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේක ප්‍රශ්නයක් වෙනවා නේ?

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

සෑම මන්ත්‍රීවරයෙකුටම දිවුරුම් ප්‍රකාශයක් දෙන්න පුළුවන් අපි සල්ලි ගත්තේ නැහැයි කියලා. සෑම මන්ත්‍රීවරයෙකුටම තමන් සල්ලි ගත්තේ නැහැයි කියලා තමුන්නාන්සේට දිවුරුම් ප්‍රකාශයක් දෙන්න පුළුවන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ. නැහැ. එහෙම අවශ්‍ය නැහැ.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

දිවුරුම් ප්‍රකාශයක් දීලා එයා අරගෙන තිබුණොත් එයා අවුරුද්දක් හිරේ යනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හොරාට කලින් වැට පනින්න ඕනෑකමක් නැහැ. මේ නම් ටික දැන් තිබෙනවා, ජනාධිපති ලේකම්තුමා ළඟ. ජනාධිපති ලේකම්තුමාගෙන් ඔබතුමා ඉල්ලන්න. දිවුරුම් ප්‍රකාශ දෙන්න ඕනෑකමක් නැහැ. මට හිතෙනවා, ඔබතුමා ගත්තාද කියලා මේ විධියට කියන කොට.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

කඩුව වනලා පෙන්වන්න කියන්න නම් ටික.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ කඩුව වැනෙන්නේ. වැස්සට විතරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. දැන් නිශ්ශබ්ද වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතමනි, කාර්ය පටිපාටි රීති 37 යටතේ මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. මම අවස්ථාව දෙනවා. පොඩ්ඩක් ඉන්න. තව ආවේ නැහැ. තවම එතැනට ආවේ නැහැ. පොඩ්ඩක් වාඩි වෙන්න. පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ඒ අනුව ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 37 යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒක මට ලියලා දුන්නේ නැහැ නේ? මට ඒක කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. මේක දැන් කඩ වුණු දෙයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ලැබුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වුණු දෙයක් වෙන්න එපැයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔව්. මගේ වරප්‍රසාද කඩ වීමක්. ගරු සභාපතිතුමනි, මම මේ කියන්න යන්නේ මම අද උදේ ගෙදරින් පිටත් වෙලා එන කොට මිනිස්සු අහපු දෙයක් ගැන මම මේ කියන්නේ. පත්තරේ තිබෙනවා, පසුපෙළ එන පීඩනය සමනය කරන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට තවත් සැප දෙයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට නේ? ඒක අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් මේ ආණ්ඩුව මේ පැත්තේ ඉන්නේ. ආණ්ඩුව ඉන්නේ ඉස්සරහා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභා ආණ්ඩු පක්ෂය නොවෙයි නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක පාර්ලිමේන්තුව කියලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලිව කියන්න. ඔබතුමා ප්‍රකාශ කරන එක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළාත් සභා. දැන් අපට තවම පර්මිට් එකක්වත් හම්බ වෙලා නැහැ. දැන් මේ පත්තරේ තිබෙන විධියට ලක්ෂ තුනක දීමනාවක් වැඩි කරන්න යනවාලු. කාර්යාල දීමනාවක් දෙන්න යනවාලු. තවත් 75,000 ක් වැඩි කරන්න යනවාලු. එතකොට අමතරව දැනටමත් පාර්ලිමේන්තුවේත් ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්ට ලක්ෂ 10 ක් විතර දීමනා හම්බ වෙනවා. මේ මහජනතාවගේ බඩු මිල වැඩි වෙලා. ගෑස් ටික වැඩි වෙලා. පෙට්‍රල් ටික වැඩි වෙලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ විධියට යන්න බැහැ. මේක අමාරුයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේවා වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මිනිස්සු අපට කියන්නේ අපිත් පර්මිට් අරගෙන සැප විඳිනවා කියලා. අපි පැහැදිලිව කියන්න ඕනෑ. මේ බස්නාහිර පළාත් සභාවේ එක මන්ත්‍රීවරයෙකුටවත් - උතුරේ ඇරෙන්න කාටවත් හම්බ වෙලා නැහැ එහෙම. ඒක පැහැදිලිව කියන්න ඕනෑ. දැන් මේක අපේ මන්ත්‍රීතුමෙක් ජනාධිපතිතුමාගෙන් අහපුවාම කියලා තිබෙනවා, පොහොට්ටුවේ අයට පර්මිට් දෙන්න ඕනෑද කියලා. පොහොට්ටුවේ අයට පර්මිට් දීලා ඔවුන්ව ශක්තිමත් කරන්න ඕනෑද කියලා අහලා තිබෙනවා. ඒක වැරදියි. මොකද, මිනිස්සු කියන්නේ, අපිත් මේවා ගන්නවාය කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි සන්ධානයේ. පොහොට්ටුවේ නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට පාර්ලිමේන්තුවේ දැනටමත් ලක්ෂ 10 ක් හම්බ වෙනවා. වාහනයක් අමතරව හම්බ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඊට අමතරව දැන් ආයිත් 75,000 කුයි කාර්යාල දීමනාවකුයි තවත් වැඩි වෙන්න යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, භාගයක් කපා ගන්නවා ආපහු බදු වලට. රජය බද්ද ගහනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ මොනවා වුණත් ගරු සභාපතිතුමනි, මිනිස්සු හිතන්නේ, මේවා අපටත් ලැබෙනවාය කියලා නේ? සම්පූර්ණ බොරුවක් නේ මේක. ඒකත් පැහැදිලි කරන්නයි මට ඕනෑ වෙලා තිබුණේ. ඉතින් අපි ජනාධිපතිතුමාට කියන්නේ, උතුරේ ඉන්න දමිළ මන්ත්‍රීවරුන්ට පර්මිට් එක දෙන්න පුළුවන් නම්, දකුණේ ඉන්න අපි කට්ටිය කළුද කියලා තමයි අහන්න තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අපි කට්ටියම අගමැතිතුමාගෙන් අහමු. ජනාධිපතිතුමාගෙන් අපි ඇහුවා. ඔබතුමා අහන්න ඒක.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 37(1) වගන්තිය යටතේ ඔබතුමා මට බැහැයි කිව්වා. ඒ නිසා කට වහගත්තා. වාඩි වුණා. දැන් මම අහන්නේ ගරු සභාපතිතුමනි, මේ වරප්‍රසාදය කැඩිලා ටිකක් කල් වෙනවා. අපේ සෞඛ්‍ය ඇමතිතුමාගෙන් දැන ගැනීමක් අහන්නේ. එතුමාගෙන් පැහැදිලි කර ගැනීමක්. දැන් ඒක කැඩුනා. මෙතුමා දැන් සති දෙකකට ඉස්සෙල්ලා කිව්වා, විශේෂ ප්‍රකාශයක් කරනවාය කියලා. ඉතින් මම ඒ කඩා ගත්ත එක තියාගෙන හිටියා කොයි වෙලාවේ හරි කියයි කියලා. දැන් අද ආවාම තමයි මට තේරෙන්නේ වරප්‍රසාදය කඩ වෙනවා කියලා. එතුමා ප්‍රකාශයක් නොකරන කොට. එතකොට මම 37(1) කොහෙන්ද ඒක ඉල්ලා ගන්නේ? සෞඛ්‍ය ඇමතිතුමා ප්‍රකාශයක් කළා. මෙතැන ඔබතුමා මූලාසනයේ සිටිද්දී. සති දෙකක් ඇතුළත මම ප්‍රකාශයක් -

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

නැහැ. තවම විමර්ශනය කරමින් පවතිනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඉතින් ඒක කියන්න එපැයි. ඒක නේ මේ ලෙඩේ. අන්න බලන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඒක අහන්නත් පුළුවන්. එතුමාට ඒකට උත්තර දෙන්නත් පුළුවන්. සති දෙකක් ඇතුළත උත්තරයක් දෙන්න කෝ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ලිඛිතව දෙන්න විධියක් නැහැ නේ? ඒකයි මම ඇහුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සෞඛ්‍ය ඇමතිතුමා ඒකට සූදානම් නම්, ලැහැස්ති නම් -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කොපමණ කල් යනවාද?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

සති දෙකක්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

තව දෙකක්. බොහොම ස්තූතියි.

# පෞද්ගලික ප්‍රකාශ කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික ප්‍රකාශ යටතේ මුලින්ම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඇත්ත වශයෙන්ම මම එතුමාට ගරු කරනවා. එතුමා නියම ආකාරයෙන් මේක ඉදිරිපත් කරලා තිබෙනවා. අනික් අයට ආදර්ශයක්. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ පෞද්ගලික ප්‍රකාශය ඉතාමත් පැහැදිලිව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, අප රටේ ජනතාවගේ මුදල් තමන්ට නිසි ආරක්ෂාවක් ඇතැයි යන විශ්වාසයෙන් පිළිගත් බැංකු හා මූල්‍ය ආයතනවල තැන්පතු හැටියට තැන්පත් කිරීමෙන් පසු 'පරිස්සමට තිබූ දේ ඇලියාවට ගියාක් මෙන්' එකී මුදල් තමන්ට අහිමි වීම නිසා අසරණ භාවයට පත් වූ ජනතාවගේ හඬ වෙනුවෙන් මෙම ප්‍රකාශය ඉදිරිපත් කරමි. මෙම තත්ත්වය සුළු පටු දෙයක් නොව මුළුමහත් සමාජයේම අරාජිකත්වයෙත්, අස්ථාවරභාවයත්, සැකයෙන් පිරි තත්ත්වයත් ඇති වීමට බලපා ඇති අතර, එකී මුදල් තැන්පත්කරුවන් වෙනුවෙන් සාධාරණත්වය ඉටු කිරීමට පියවර ගැනීම වගකිවයුතු රජයක වගකීමක් ලෙස සැලකිය යුතුය. මෙම මුදල් තැන්පත් කළ ජනතාව මුදල් තැන්පත් කර ඇත්තේ, ගිනි පොලීකාර මුදලාලිලාගේ ගිණුම්වලට මුදල් යොදවනවා සිතා නොව තම මුදල්වලට කුමන හෝ රාජ්‍ය වගකීමක් සහිත, රාජ්‍ය බැඳීමක් සහිත ආයතනවල මුදල් යෙදවීමක්ය යන අදහස ඇතිවය. නමුත්, අප රටේ මුදල් වංචනික ලෙස, දූෂිත කොමිස් ගනුදෙනු ලෙස හූරා ගත් බලපුළුවන්කාරකම් සහිත පුද්ගලයන්ගේ මුදල් කිසි ගැටළුවකින් තොරව විදේශීය ඩුබායි බැංකුව වැනි තැන්වල ආරක්ෂා වෙද්දී තමන්ට හිමි සේවක භාරකාර අරමුදලෙන් ලැබිය යුතු මුදල, විදෙස්ගත වී ශ්‍රමය, දහදිය වගුරා ඉතිරි කර ගත් මුදලත්, ආරක්ෂක හමුදාවක සේවය කොට විශ්‍රාම යෑමේදී ලැබුණු මුදලත්, තම දේපළක් විකුණා ලබා ගත් මුදලත් මූල්‍ය ආයතනයක තැන්පතු ලෙස යොදවා මාසික පොලී මුදලක් බලාපොරොත්තු වූ ජනතාවක් තමන් සතු වූ එකී මුදල අහිමි වීමෙන් අද අසරණව මහ පාරට බැස උද්ඝෝෂණය කරන තත්ත්වයට පත්ව ඇත.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවද වගකීමකට බැඳී සිටින ඇතැම් සණස සමිතිවල තැන්පත්කරුවන් ලෙස කටයුතු කළ අයට ද අද එකී ව්‍යසනයේ කොටස්කරුවන් වීමට සිදුව ඇත. 532 සී, වත්තෙගෙදර සණස සමිතියේ රුපියල් කෝටි 75 ක පමණ තැන්පත්කරුවන්ගේ මුදල් නොලැබීමේ සිද්ධිය මෙම පළාත් සභාවේදී ප්‍රථම වරට දිගහැරුණේ මා විසින් අවධානය යොමු කළ කරුණක් හැටියට ය. ඒ අනුව තොරතුරු හෙළි වූයේ වසර 15 කින් විගණනයට ලක් නොකළ මෙම සමිතියේ අශ්වයන් පැන ගොස් ඇති බවයි. අද දිනයේත්, මෙම සමිතියේ මුදල් තැන්පත් කළ පවුල් 1800 ක පමණ ජනතාවක් මහපාරට පැමිණ ඇත. මෙම තත්ත්වයේ සමිති ගණනාවක් ඇති බව ද මේ වන විට කරුණු හෙළිදරව් වී ඇත.

ගරු සභාපතිතුමනි, මෙහි වගකීම පළාත් සභාවක් ලෙස එහි නියමිත බරින් තවමත් තේරුම්ගෙන තිබේද? මෙම ප්‍රශ්නය නිරාකරණය කිරීම වෙනුවෙන් සංවිධිත ක්‍රියාමාර්ග ගෙන තිබේද? අප විසින් මතු කරන ප්‍රශ්නයකට කුමන හෝ පිළිතුරක් ලබා දී පසෙකට වීම හැර තවත් මෙවැනි දේ සිදු නොවීමට සමූපකාර දෙපාර්තමේන්තුව ගෙන ඇති පියවර කවරේද? මෙම සිද්ධියේදී පැන ගිය අශ්වයන් හා වගකිව යුතු දේශපාලකයන් අතර තිබුණේ යැයි කියන සම්බන්ධකම් තවදුරටත් පැන ගිය අශ්වයන්ට රැකවරණය ලැබෙනවා යැයි කියැවෙන ආරංචිමාර්ග පිළිබඳව තවදුරටත් සමාජ සැක සංකා පැමිණීම පිළිබඳව දොස් කීමෙන් පලක් වේද? වගකිව යුත්තන් විසින් තම වගකීමට උර දී තිබේද?

ගරු සභාපතිතුමනි, ගිනි මැල්ලගේ ප්‍රියංග නිශාන්ත කුමාර යනු වත්තෙගෙදර සණස මූල්‍ය වංචාවේ ප්‍රධානියා ලෙස හඳුන්වන්න පුළුවනි. වංචා කර ඇති මුදල්වල වැඩිම පංගුව ඔහු අතට පත් වී තිබේ. මෙම සමිතියේ ආරම්භයේ සිටම එහි ලේකම් ලෙස කටයුතු කර ඇත. අද සුප්‍රකට මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවේ චූදිතයා අර්ජුන් මහේන්ද්‍රන් සොයා ගත නොහැකි පුද්ගලයෙකු වී ඇත. අර්ජුන් මහේන්ද්‍රන්ට සමානවම ශ්‍රී ලංකා පොලීසියට, පොලිස් දෙපාර්තමේන්තුවවට අල්ලා ගත නොහැකි බලගතු සම්පන්න තවත් පුද්ගලයෙක් ලංකාවේ සිටියි. ඒ ගිනිමැල්ලගේ ප්‍රියංග නිශාන්ත කුමාරයි.

ගරු සභාපතිතුමනි, අර්ජුන් මහේන්ද්‍රන් අධිකරණය වෙත ගෙන ඒමට නොහැකි වීම පුදුම වීමට කරුණක් නොවේ. පුදුමය වන්නේ ගිනිමැල්ලගේ ප්‍රියංග නිශාන්ත කුමාර අල්ලා ගැනීමටත් ශ්‍රී ලංකා පොලීසියට නොහැකි වීමයි. මෙයින් පැහැදිලි වන්නේ නීතිගරුක මිනිසුන්ට ආරක්ෂාවක් නොමැති බවයි.

ගරු සභාපතිතුමනි, වගකිවයුත්තන්ගේ අවධානය යොමු කිරීමට මීටත් වඩා සංවේදී වචන සොයා ගැනීමට නොමැති අතර, මේ පිළිබඳව කාරුණිකව සලකා බලා බස්නාහිර පළාත් සභාවේ සභාපතිතුමා ලෙස අවශ්‍ය පියවර ගැනීමට මෙම ප්‍රකාශය අදාළ කර ගනු ඇතැයි විශ්වාසය තබමි.

ගරු සභාපතිතුමනි, පසුගිය සමූපකාර අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී සමූපකාර කොමසාරිස්තුමා කියලා තිබෙනවා, මේකට අපට කරන්න පුළුවන් කිසිම

දෙයක් නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, දැන් අද සියලු මූල්‍ය ආයතනවල සල්ලි ගත්තාට පස්සේ රජයේ ආයතන කියන්නේ, ආ සල්ලි දාලා තිබෙනවා නම් අපට කරන්න දෙයක් නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, මේ තැන්වල අය ගෙනැල්ලා සල්ලි තමයි දාන්නේ. නැත්නම් ගෙදර තිබෙන ටීවී, කැබිනට් ගෙනැල්ලා දාන්නේ නැහැ. සල්ලි තමයි දාන්නේ. ඒ සල්ලිවලට වගකිවයුත්තෙක් නැහැ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම මේ කියපු ටික. මට මේකට ඇතුළත් කරන්න විධියක් නැහැ. ඔබතුමාට වගකීමක් තිබෙනවා මේ ප්‍රශ්නය මන්ත්‍රීවරයෙකු හැටියට අපි මේ සභාවේ තමයි මතු කරන්නේ. ඒ නිසා සභාපතිතුමා හැටියට ඔබතුමාට වගකීමක් තිබෙනවා. මේ නිලධාරීන් ගෙන්වන්න ඔබතුමාට කිසිම ප්‍රශ්නයක් නැහැ. පොලීසිය මේ වැඩේ කරන්නේ නැත්නම්, ඔබතුමා අදාළ ආයතනවලින් තොරතුරු ටික ගෙන්වාගෙන, පොලීසියත් ගෙනැල්ලා මේ සම්බන්ධව සාධාරණ පරීක්ෂණයක් ඔබතුමා කරන්න ඕනෑ. ඒ නිසා මම කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ඔබතුමාගේ වගකීමට අදාළව ඔබතුමා ගන්නේ නැත්නම් අපි ලැහැස්ති වෙනවා, ඔබතුමාට විරුද්ධව විශ්වාසභංගයක් ගේන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙහෙමයි. දැන් මේ කාරණය පිළිබඳව ඇත්ත වශයෙන්ම දිගින් දිගටම වත්තෙගෙදර සමූපකාර සංගමය සහ සමූපකාර සංගම් පිළිබඳව දූෂණ, වංචා ගොඩක් කථා කළා. ඉතින් ඒකේදී ඇත්ත වශයෙන්ම විෂය භාර ගරු ඇමතිතුමා දැන ගන්න වෙනවා, කොමසාරිස්තුමා දුර්වල නම් එතුමාව ගෙනැල්ලා එතුමාට ඇඩිව - නිකම් මේ හිමින් කියලා හරියන්නේ නැහැ. එතුමාට පොඩි තරවටුවක් කරන්න ඉක්මණට මේක දෙන්න කියලා. නැත්නම් මේක ප්‍රශ්නයක්. දැන් මේ ප්‍රශ්නය ඊළඟට මට එන්නේ. දැන් එතුමා පැහැදිලිව කියන්නේ ඒක නේ? ඔබතුමන්ලා ප්‍රශ්නය ඉක්මණටම විසඳගන්න. සභාපතිතුමාට විෂයයක් නැහැ නේ? සභාපතිතුමාට සමූපකාර නැහැ. දැන් මට ඒ පිළිබඳව චෝදනා කරනවා මට දැන් විශ්වාස භංගයක් ගේනවා කියලා. ඒ මට්ටමට යන්න ඕනෑ නැහැ.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මෙතුමන්ලා ප්‍රශ්නය යොමු කළාට පස්සේ මම දැන් මෙතුමන්ලාවත් ගෙන්වලා, නිලධාරීන්වත් ගෙන්වලා, පොලීසියත් ගෙන්වලා ඒක සාකච්ඡා මට්ටමෙන් යනවා. දැන් ලොකු මුදලක් අය කර ගන්න බැරිව ගියත් දැනට විශාල මුදලක් අපි අය කර ගෙන තිබෙනවා. දැනට ඒක ක්‍රියාත්මක කර ගෙන යනවා. මට කලින් වුණු ප්‍රශ්නයක් ඒක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පිළිගන්නවාද ඒක.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, දැන් අපි මතු කළාට පස්සේ එතුමා මේ විධියට උත්තරයක් දෙනවා. කෝටි 75 ක මුදලක්. කෝටි දෙකක වාගේ මුදලක් එකතු කරලා තිබෙන්නේ. ඒ මේ හය වෙලා ගෙනැල්ලා සල්ලි දාන මිනිස්සු විතරයි. ඇත්ත. මම මේකේ සඳහන් කරලා තිබෙනවා, මේකේ ඇත්ත වූදිතයා කවුද කියලා. සල්ලිවලට වගකිවයුතු. ඔබතුමන්ලා මොකක්ද ගත්ත පියවර ඒ ලේකම්ව අත්අඩංගුවට ගන්න. ඔබතුමා පොලීසිය ගෙන්වලා පොලීසියට ඔබතුමා නියෝගයක් දුන්නාද මේකේ නියම චූදිතයා ඉන්නවා. ගත්ත පියවර මොකක්ද කියලා ඔබතුමා පොලීසියට කථා කරලා තිබෙනවාද? මේක මේ අපි ගිහිල්ලා එවලේට තේ එකක් බීලා සාකච්ඡා කරලා එන එක නොවෙයි.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මට පොලීසියට නියෝග කරන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දෙපාර්තමේන්තුව විධියට කොමසාරිස්වරයාට තිබෙනවා මේකේ විශේෂ වගකීමක්. ඒ වගකීම ඉෂ්ට කරන්නේ නැහැ.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

පැමිණිලි කිරීම විතරයි කරන්න පුළුවන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ලිස්සලා යන්න මේගොල්ලෝ ඉඩ දෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ඒකට දේශපාලන බල අධිකාරිය ලිස්සලා යන්න ඉඩ දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැම තැනම තිබෙනවා මේක.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

කෝටි 54 ක මුදලක් නැගෙනහිර හේවාගම්කෝරළයේ විවිධ සේවා සමූපකාර සමිතියේ. එන සභාව වෙන කොට ඒ තැන්පත්කරුවන් විසින්. මේ සභාව වටලනවා ඒකට අවශ්‍ය විසඳුම් ගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. තවම ආවේ නැහැ. ඔබතුමාට කාලය දෙනවා. හදිසි එකක් නොවෙයි නේ? මෙහෙමයි. මම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය යොමු කරන්නේ. ඔය ප්‍රශ්නය මුලින්ම තිබුණේ මූල්‍ය ආයතනවල. සෙලින්කෝ එක, එතකොට සක්විති, ඊළඟට ETI වාගේ ඒවායේ මූල්‍ය වංචා සිද්ධ වුණේ. දැන් කනගාටුවට කාරණය සමූපකාරයටත් මේක ආවා. සමූපකාර පාලනය වෙන්නේ අපෙන්. මධ්‍යම රජයේ වෙනම අමාත්‍යාංශයක් තිබෙනවා. අපේ එකක් තිබෙනවා. ඒ නිසා මේක මේ වැඩිය උඩු දුවන්න යන්න දෙන්න එපා. දැන් ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා නේ, නැගෙනහිර හේවාගම්කෝරළයේ කෝටි 54 ක් වංචාවක් කරලා තිබෙනවා. ඒත් සමූපකාර. මේක දිගින් දිගටම ගියොත් ගරු ඇමතිතුමා, ඔය අධ්‍යක්ෂ මණ්ඩලවල භය ඇරෙනවා. සභාපතිවරු ඔබතුමාව ගණන් ගන්නෙත් නැහැ. පළාත් සභාව ගණන් ගන්නෙත් නැහැ. මොකක්ද කියන්නේ? දූවදූවා හොරකම් කරනවා. ඒකයි කරන්නේ.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

නිලවරණ කල් දා ගෙන එකම කට්ටයි ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න එපා. ඔබතුමාට අවනත නැත්තම් ඒ සභාපතිවරුන්ව මාරු කරන්න. අධ්‍යක්ෂවරු අයින් කරන්න.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

නිලවරණ කල් දාගෙන. අවුරුදු ගණනකින් නිලවරණ තියලා නැහැ. එක සමූපකාර සමිතියකවත් නිලවරණ තියලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දක්ෂ අය පත් කරන්න. මහජන මුදල් මේවා. බොහොම අමාරුවෙන් සොයලා ලක්ෂ තුන හතරක් තැන්පත් කරන්නේ. ඒ නිසා මම දන්නවා, එතුමාට දැඩි ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන්. ඉක්මනටම ගන්න. නැත්නම් ඊළඟට මෙතුමා වටලනවා. දැන් එතුමා ප්‍රකාශයක් කළේ. කෝටි 54 ක් එතුමාගේ බල ප්‍රදේශයේ. කෝටි 54 ක්. ඒ වාගේම මම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට ඇත්ත වශයෙන්ම එතුමා පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙක්. ඒ නිසා අපි මේ පළාත් සභාව අනුගමනය කරන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය. ඒකයි මේ රීතිපොත සංශෝධනය කිරීමේදී අපි පැහැදිලිව කළේ, පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී ඒ ප්‍රකාශය ගරු සභාපතිතුමාට සභාවට පෙර දින ප.ව. 4.00 ට පෙර ලියලා දෙන්න කියලා. මම ඉතාම අගය කරනවා. එතුමාගේ ප්‍රකාශය පැහැදිලිව අපට ඉදිරිපත් කරලා තිබෙනවා. අනික් මන්ත්‍රීවරුත් එතුමාව උදාහරණයට

ගන්න. පුංචි කැල්ලක් ලියලා දෙනවා. මම දෙන්නේ නැහැ ඒක. තරහා වෙන්න එපා. මම අවස්ථාව දෙන්නේ නැහැ. බොරුවට පොඩ්ඩක් ලියලා කෑ ගහන්න එපා මේකේ. මෙතුමා වාගේ හැම කෙනෙකුම ආදර්ශවත් වෙන්න. මේ වාගේ ලැහැස්ති වෙන්න. මීළඟට යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, හොරණ ආසනයේ ඡන්ද දායකයෝ එක් ලක්ෂ විසි අට දාහක් ඉන්න ආසනයක්. පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේ මහා ගැටළුවකට මුහුණ පාලා තිබෙනවා. ඒ නිසා හොරණ අධ්‍යාපන කොට්ඨාශයේ ගැටළුව විතරයි මම කථා කරන්නේ. කලාප කාර්යාලයේ සම්පූර්ණ ගැටළුව නොවෙයි. හොරණ අධ්‍යාපන කොට්ඨාශයේ පළාත් සභා පාසල් 53 ක් තිබෙනවා. ඒ පාසල් 53 හිම 1 වසර පන්ති සංඛ්‍යාව 82 ක් පමණ පවතිනවා. ඒ පන්ති 82 න් මේ අවුරුදු තුන ඇතුළත එක අවුරුද්දකට ළමයින් හත් දෙනා ගණනේ අඩු වෙනවා. පන්ති 82 න් ළමයින් හත් දෙනා ගණනේ අඩු වෙන කොට ළමයින් 574 ක් අඩු වෙනවා. මේ 574 ක් ළමයින් සංඛ්‍යාව අඩු වෙන කොට පන්ති සංඛ්‍යාවක් වැඩි වෙන්නේ නැහැ. ඒ පන්ති සංඛ්‍යාව වැඩි වෙන්නේ නැති නිසා දරුවන්ට පාසල් අහිමි වීමේ ප්‍රවණතාවය වැඩි වෙලා තිබෙනවා. ඒ එක්කම හොරණ නගරයේ විතරක් බැලුවොත් එහෙම පාසල් අටක් තිබෙනවා. පාසල් අටෙහිම එක වසර පන්ති සංඛ්‍යාව 29 ක් තිබෙනවා. ඒ පන්ති 29 ක ළමයි හත් දෙනා ගණනේ අඩු කළාම නගරයෙන් විතරක් ළමයින් 203 දෙනෙකු අඩු වෙනවා. මේ ළමයින් 203 දෙනාට අලුත් පන්තියක් දාන්නේ නැහැ. අලුත් පන්ති සංඛ්‍යාවක් දාන්නේ නැති නිසා දරුවන්ව කලාප කාර්යාලයෙන් සහ පළාත් කාර්යාලයෙන් දරුවන්ව විවිධ පාසල්වලට, ඉඩකඩ තිබෙන පාසල්වලට යවනවා. මම හිතන්නේ, පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා ආසනයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් මෙතැන ඉන්නවා. ඒ නිසා එතුමා දන්නවා ඇති. සමහර දරුවෝ ඉන්නවා නගරයට බස් එකක ඇවිල්ලා නගරයෙන් ආයිත් බස් එකක් ගන්නවා ගමේ පාසලකට යන්න. වෙන ගමක පාසලකට යන්න. ඒ දීපු ලිපි ලේඛන තිබෙනවා. ගරු සභාපතිතුමනි, මට ඒවා සභාගත කරන්න පුළුවන්. මේ ගැටළුව දිගින් දිගටම ඉදිරිපත් කළාම මේකට විදුහල්පතිවරුන්ට ගැටළුවක් නැහැ. ඇයි? විදුහල්පතිවරුන්ට දරුවන් 500 ක ඇප්ලිකේෂන් ආවා නම්, ඒගොල්ලෝ ගන්නේ 100 නම් ඒ 100 අරගෙන අනික් 400 දොට්ට දැම්මායින් පස්සේ ඒගොල්ලන්ට එයින් පස්සේ ගැටළුවක් නැහැ. කලාප කාර්යාලයට ගිහිල්ලා ප්‍රශ්නය ඉදිරිපත් කළාම, කලාප කාර්යාලයෙන් කොහේ හරි ඉඩ තිබෙන පාසලකට දරුවෙකු යවනවා මිසක් ළඟම පාසලක්, තනි බස් එකක යන්න පුළුවන් පාසලක් ඒ දරුවන්ට ලබා දෙන්නේ නැහැ. මෙන්න මේ තත්ත්වය නිසා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී නිලධාරීන් මේ ප්‍රශ්නය මතු කළාම නව පන්තියක් නගරයට හෝ අවශ්‍යයි කියලා තීන්දුවකට ආවා. ඒක කළුතර දිස්ත්‍රික් කමිටුවට දැම්මා. දිස්ත්‍රික් කමිටුවේ අනුමත වුණා. ඒ නිසා මම ඔබතුමා හරහා අධ්‍යාපන බලධාරීන්ගෙන් ඉල්ලනවා. හොරණ නගරයේ පාසල් අටෙන් කුමන හෝ එක පාසලක දරුවන්ට ළඟ පාසලකට යන්න පුළුවන් මට්ටමේ නව පන්තියක් ආරම්භ කරන්න. දැනුවත් කරලා කඩිනමින් ඒ පන්තිය අනුමත කරලා දෙන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඔබතුමාටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාත් පැහැදිලිව පෞද්ගලික ප්‍රකාශය ඉදිරිපත් කළා. මීළඟට එස්. කුහවර්ධන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. එතුමාත් ඒක ඉතාමත් පැහැදිලිව ඉදිරිපත් කරලා තිබෙනවා. මම වරින් වර මේ පෙන්වන්නේ අනික් ගරු මන්ත්‍රීවරුන්ටත් මේ පිළිබඳව අවබෝධයක් ලබා ගන්න. නැත්නම් කොල කැබැල්ලක ලියලා අර පරණ ක්‍රමයටම යනවා. එස්. කුහවර්ධන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**எஸ். குஹவரதன்**
Hon. S. Kuhawarthan

மதிப்பிற்குரிய கௌரவ தவிசாளர் அவர்களுக்கு எனது இப் பிரேரணையை ஏற்றுக் கொண்டதற்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொண்டு, முக்கியமாக எந்தவொரு அரசியல் கட்சியோ அல்லது எந்தவொரு அரசியல்வாதியோ யாருமே இன்று வரை கதைக்காத முக்கியமான ஒரு விடயத்தை இந்த இடத்திலே நான் கதைக்க முற்பட்டிருக்கின்றேன். உங்களுக்குத் தெரியும் கல்வி என்பது மிகவும் முக்கியமான ஒரு விடயம். அக் கல்வியை எமது நாட்டிலே இலவசக் கல்வியாக நடைமுறைப்படுத்தியிருக்கின்றோம். கல்விப் புத்தகங்களிலே இருக்கின்ற பிழைகளை சுட்டிக் காட்டத்தான் நான் இதை

**[எஸ். குஹவரதன் ]**

முன்கொண்டு வந்திருக்கின்றேன். தமிழ் பாடசாலைகளிலே இருக்கின்ற தமிழ் கற்கின்ற மாணவர்களின் கல்விப் புத்தகங்களிலே மிகவும் மோசமான நிலையில் பிழைகள் இருக்கின்றன. இது நேற்று முன்தினம் நடந்த ஒரு பிழை அல்ல, கடந்த மூன்று நான்கு வருடங்களுக்கு மேலாக தொடர்ச்சியாக தமிழ் பாடசாலைப் பிள்ளைகளின் தமிழ் புத்தகங்களிலே இருக்கின்ற பிழைகளை சுட்டிக் காட்ட விரும்புகின்றேன். இதனை நடைமுறைப்படுத்தும் தேசிய கல்வி நிறுவகம், இலங்கைப் பரீட்சைத் திணைக்களம் என்பன இது சம்மந்தமாக எந்தவிதமான ஒரு விழிப்புணர்வும் இன்று வரை எடுக்கவில்லை என்பதையும் கூறிக் கொள்ள விரும்புகின்றேன். உதாரணமாக எட்டாம் வகுப்பு தமிழ் இலக்கியப் புத்தகத்திலே, சிங்களத்திலே கூறுவதாக இருந்தால் *"මම කොළඹට ගියා"*என்ற வசனம் *"මම කොළඹ ඉඳලා ආවා"*என்றவாறு பிரசுரிக்கப்பட்டு தமிழிலே இறந்தகாலம் நிகழ்காலம் என்பன மாறி மாறி இருக்கின்றன. 7ஆம் தரத்தின் விஞ்ஞானப் புத்தகத்திலே *"කතුරුමුරුංගා"* என்பது தமிழிலே அகத்திக் கீரை என நாம் குறிப்பிடுவோம். இவ் அகத்திக் கீரை என்ற விடயத்தை அவ் இடத்தில் குறிப்பிடாமல் கதுறுமுருங்காய் என்று நேரடியாக சிங்கள மொழியில் இருந்து மாற்றப்பட்டவாறுஅவ் விஞ்ஞானப் புத்தகத்தில் பிரசுரிக்கப்பட்டுள்ளது. அதேபோல ***"අකපාන"*** என்று சொல்லப்படுகின்ற சதை கரைசான் என்று சொல்லப்படுகின்ற அக் கீரையையும் அப்படியே அதே மொழியிலேயே மாற்றப்பட்டிருக்கின்றது. தமிழ் பாடசாலை மாணவர்களின் வளர்ச்சியிலே, அப் பாடசாலை மாணவர்களின் கல்வியிலே நாங்கள் எதிர்கால சந்ததியினரை உருவாக்குவதற்காக அக் கல்வியை அவர்களுக்கு போதிப்போமாக இருந்தால் அவர்கள் அந்த இடத்திலிருந்துதான் படிப்படியாக அவர்களது கல்வி நிலைமையை வளர்த்து வருகின்றார்கள்.

எனவே இவ்வாறான பாடப் புத்தகங்களிலே இவ்வாறான பிழைகள் இருப்பது என்பது ஏற்றுக் கொள்ள முடியாத ஒன்று. எழுத்துப் பிழைகள் இருக்கின்றன, ஏராலமான பிழைகள் இருக்கின்றன. சில இடங்களிலே மிகவும் அரிதான விடயங்கள் கூட அது சம்மந்தமான மிகவும் பாரதூரமான பிழையை சுட்டிக் காட்டி வருகின்றன. இது தமிழ் பாடசாலை மாணவர்களின் கல்வி வளர்ச்சியிலே ஏற்படாத ஒரு அசாதாரண நிலை தென்படுகின்றது. பாடசாலை மாணவர்கள், ஆசிரியர் என்ன சொல்கின்றார் என்பதை அவ்வாறே கேட்டுத்தான் அதனை கிரகித்துக் கொள்கிறார்கள். எனவே பாடசாலை புத்தகங்களிலே இருக்கின்ற எழுத்துப் பிழையை, இலவசக் கல்வி, சமத்துவக் கல்வி என்று நாம் கூறிக் கொண்டு, பாடசாலைப் புத்தகங்களிலே எழுத்துப் பிழைகளை அதிகரிக்க இடமளிப்போமாக இருந்தால் நிச்சயமாக அம் மாணவர்களின் கல்வி நிலை பின் நோக்கித் தள்ளப்படும் என்பதனை நான் கூறிக் கொள்ள விரும்புகின்றேன். எனவே தமிழ் பாடப் புத்தகங்களில் இருக்கின்ற பிழையை திருத்த வேண்டும் அதற்கு தேசிய கல்வி நிறுவனமும், இலங்கைப் பரீட்சை திணைக்களமும் இதில் அக்கரை எடுக்க வேண்டும் என்பதை கூறிக் கொண்டு, மேல் மாகாண சபையின் தமிழ் உறுப்பினர் என்ற ரீதியிலே நான் இதனை ஆணித்தரமாக உங்களிடம் கூறி விடை பெறுகின்றேன் நன்றி வணக்கம்.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාටත් බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. ඔබතුමාත් ඉතාමත් පැහැදිලිව මට ලබා දුන්නා. මට හැබැයි දුන්නේ සිංහලෙන්. නමුත් ඔබතුමා කියපු කාරණය ගොඩක් ඇත්ත. ඇත්ත වශයෙන්ම ඔබතුමා බරපතළ ප්‍රකාශයක් කළේ. ඒ කියන්නේ දෙමළ භාෂාවෙන් කිවයුතු දේවල් සිංහල භාෂාව වෙනුවට වෙනත් ආකාරයකින් දරුවන්ට යන්නේ. මම හිතන්නේ මේක අපට අයිති විෂයයක් නොවෙයි. මධ්‍යම රජය තමයි පෙළ පොත් මුද්‍රණය කරන්නේ. ඒ නිසා මම ලේකම්තුමාට කියනවා, මේ සම්බන්ධයෙන් විෂයය භාර ඇමැතිතුමාට වහාම මෙතුමා එවපු ලිපියේ පිටපත් ටික යොමු කරන්න. ඒ ගැන වහාම ක්‍රියා මාර්ග ගන්න කියලා. අපි ඒ දේ කරනවා. ඔබතුමාටත් පිටපතක් එවන්නම්. තවත් පැහැදිලි කිරීම් දෙකක් තිබෙනවා. ඊට පස්සේ ඔබතුමාට අවස්ථාව දෙනවා.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ වේලාව ලබා දීම සම්බන්ධව ඉතාමත් සතුටු වෙනවා. මීට පෙරත් මේ සභාවේ

මේක ඉදිරිපත් කළා. අද සෑම මාධ්‍යයකම, පත්තරයකම මුළු රටේම ඇති වෙලා තිබෙන මහ බැංකු බැඳුම්කර මගඩිය ගැන කථා වෙනවා. 2018.06.05 වන දින පත්තරවල තිබෙනවා මන්ත්‍රීවරු සහ දේශපාලඥයෝ 118 සහ පාර්ලිමේන්තුව සහ අනෙකුත් ආයතනවල 168 ක් අර්ජුන ඇලෝෂියස්ගේ ආයතනයෙන් චෙක්පත් මගින් සහ විවිධ විධියට වවුචර්වලින් මුදල් ලබා ගත්තා කියලා. එතකොට මම දැක්කා බස්නාහිර පළාත් සභාවේ ඉන්න දෙන්නෙක්ගේ නම් දෙකකුත් තිබෙනවා. අන්තර්ජාලයේ, වෙබ් අඩවියේ ඒක සඳහන් වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ අපේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

නමක් තිබෙනවා. ඒ වාගේම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

නමකුත් තිබෙනවා. ඒ වාගේ නම් දෙකක් බස්නාහිර පළාත් සභාවෙනුත් අන්තර්ජාලයට වැටිලා තිබෙනවා. දැන් ඔබතුමන්ලා මගින් මේක නිවැරැදි කරගත්තේ නැත්නම් මේ මන්ත්‍රීවරු 104 දෙනාටම මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකද, මේ මන්ත්‍රීවරු 104 දෙනාටම මහජනයා ඡන්දය දුන්නේ හොරකම් කරන්න, බැංකු කඩන්න, මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කිව්වා වාගේ දින 100 වැඩ සටහනින් අපේ සෝභිත හාමුදුරුවෝ තැටිය රත් කරලා රොටිය පුච්ච ගන්න දුන්නු අවස්ථාව අරගෙන බැංකු කඩන්න දුන්නේ නැහැ. බැංකුවලින් පගාව ගන්න දුන්නේ නැහැ. දැන් මේ ප්‍රශ්නයත් එක්ක බැලුවාම මේකම TV එකේ කථා කළා අපේ දූෂණ විරෝධී පෙරමුණ. දූෂණ විරෝධී පෙරමුණේ නායකයෙක් තමයි මේ ප්‍රශ්නයේ ඉන්නේ. දැන් කොහොමද සෙල්ලම? ඉතින් මේක සොයා බැලීමේ යුතුකමක් ඔබතුමාට තිබෙනවා. අපේ 104 දෙනාගේ ගරුත්වය ආරක්ෂා කරගන්න මේක නිවැරැදි කරගන්න. දූෂණ පෙරමුණ කියනවා හොරු අල්ලපන්, හොරු අල්ලපන් කියලා. රාජපක්ෂලාගේ ඔක්කෝම හොරු ටික අල්ලපන්, අල්ලපන් කියලා බලනකොට ඒ කියන හොරාත් මේකේ ඉන්නවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක නිසයි මම කියන්නේ. පක්ෂයේ නම මම කිව්වා. මම මේක වෙබ් අඩවියේ දැකපු නිසා මම ඊළඟ සභාවට හරියටම නම් කරන්නම්. දැන් අන්තර්ජාලයේ, වෙබ් අඩවියේ තිබෙන්නේ. ඒක නිසා ඔබතුමා මගින් මේ සභාවට ලේකම්තුමා හරහා ඉදිරිපත් නොකළොත් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා, ඇමැති මණ්ඩලය ඇතුළු අපේ සියලු දෙනාම මේ චෝදනාවට අහු වෙනවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

නම කියනවා නම් කියපු කෙනාගෙන්ම අහගන්න. අහන කෙනාගෙන්. මේ අහන්නේ? මෙයා තමයි. ආණ්ඩුවේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියලා මම ගිය සභාවේ කිව්වේ. ඒ නම තිබෙන්නේ. දැන් මම නම නොකියා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාව කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තොප්පිය හරි නම් දාගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විවාදවලට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආණ්ඩුවේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආණ්ඩුවේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

තමයි දැන් මේ ඉන්නේ. මේ වැඩේද? හරිද? දූෂණ විරෝධී පෙරමුණ ඉන්නවා නේ තමුන්නාන්සේත් ඉන්නවාද දන්නේ නැහැ. කෑගහන්නේ නැතුව ඉන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අර්ජුන ඇලෝෂියස් නොවෙයි. තමුන්නාන්සේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විවාදවලට යන්න එපා. ඔබතුමාගේ ප්‍රකාශය කරලා අවසන් කරන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ඔබතුමා හරහා ඉල්ලන්නේ මේ මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරන්න. පළාත් සභාවේ ගෞරවය ආරක්ෂා කරන්න. මේ ප්‍රශ්නය සම්බන්ධව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අනවශ්‍ය වචන ඉල්ලා අස්කර ගන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම කියන්නේ අන්තර්ජාලයේ තිබුණු එක. අන්තර්ජාලයේ වෙබ් අඩවියේ තමයි මේක තිබුණේ. මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු දෙදෙනෙකුගේ නම් දෙකක් තිබ්බා. එක්කෙනෙක් කාන්තාවක්. එක්කෙනෙක් පිරිමි කෙනෙක්. ඒ අනුව (බාධා කිරීම්) වගකීමකින් තමයි කියන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ ප්‍රකාශය කරලා වාඩි වෙන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මෙහෙම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියලා කථා කරන්න බැහැ. මහරගම හොරකම් කරලා. ඒක ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තියෙනවා කියලා කිව්වේ නම මේගොල්ලන්ට -

[සභාවේ ඝෝෂා]

එතකොට පුළුවන්. දැන් 115 දෙනෙක් අල්ලන් ඉන්නවා. තුනදෙනෙක් -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ෆයිරෝස් මන්ත්‍රීතුමාටත් චෙක් එකක් හම්බ වෙලා තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකේ මහ මොළකරු උප සභාපති රවී කරුණානායක ඉන්නවා. එතකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ප්‍රකාශයක් නිකුත් කරලා තිබෙනවා මාධ්‍යයට. එතකොට මේ අනුව මේගොල්ලන් කැගහන්නේ මේ අයත් මේකෙන් සල්ලි අරගෙන තිබෙනවා කියලා මට සැකයක් තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කාන්ති කොඩිකාර කියන්නේ කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වහාම මේක -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අද රට දැනගන්න පුළුවන්. අද පාර්ලිමේන්තුවේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

කාන්ති කොඩිකාර කියලා තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කාන්ති කොඩිකාර සභාපති වුණේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ සහ වරප්‍රසාද ප්‍රශ්න තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බයිසිකලයෙන් සභාවට පත් වුණේ. හරිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අනුව ගරු අධ්‍යාපන ඇමැතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

*[නැඟී සිටියේය. ]*
*[Stood.]*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් මේක කරු ජයසූරියට බාර දීලා. එතකොට කරු ජයසූරිය මේක ප්‍රකාශ කරන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කාලය අවසන් වෙනවා. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

## අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/
MINISTERS' STATEMENTS

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එස්. කුහවර්දන් ගරු මන්ත්‍රීතුමා ඉතාම වැදගත් අදහස් කිහිපයක් මේ ගරු සභාවේ පළ කළා. විශේෂයෙන් දමිළ භාෂාවෙන් මුද්‍රිත විෂයය මාලාවල විෂයය නිර්දේශයේ තිබෙන අඩුපාඩු සැහෙන ප්‍රමාණයක් ඉදිරිපත් කළා. මමත් ඉතින් මේ භාෂාව පරිවර්තනය විධියට අහගෙන හිටියා. අවංකව මම කැමැති නැහැ. ඒ තත්ත්වය විසඳගන්න ඕනෑ. ඒ නිසාවෙන් එතුමා වෙනුවෙන් මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත් එක්ක සම්බන්ධ වෙලා අපි මේ සම්බන්ධව මධ්‍යම රජයේ අදාළ අය දැනුවත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඊටත් එහා අපෙන් යම්කිසි සේවයක් අවශ්‍ය නම් ඒක ඉෂ්ට කරන්නත් බලාපොරොත්තු වන බව මේ වෙලාවේ ගෞරවයෙන් සිහිපත් කරනවා.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා හැමදාම ඉදිරිපත් කරනවා හොරණ දරුවන්ගේ ප්‍රශ්නය. මේක ලෙහෙසි වැඩක් නොවෙයි. මේක අංගුලිමාල නැකත වගේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉපදිලා තිබෙන්නේ අංගුලිමාල නැකතින්. අහිංසක කුමාරයාව අංගුලිමාල කළේ සමාජයෙන්. ඒ නිසාවෙන් අහිංසක කුමාරයා අංගුලිමාල වෙලා අංගුලිමාල මහ තෙරුන් වහන්සේ බවට පත් වෙලා සැවැත්නුවර ජේතවනාරාමයේ ඉඳලා පිඬුසිගා වඩිනකොට - මේක වැදගත් ලස්සන කථාවක්. පිඬුසිඟා වඩිනකොට හැමදාම හිසෙන් ලේ ගලා වැටෙන, රුරා වැටෙන රුහිරු ධාරාවෙන් යුක්තව තමයි ආපහු විහාරස්ථානයට වැඩමවන්නේ. ඉතින් ඒ කාලේත් මේ වාගේ තමයි. ශාඛා සමිති. ප්‍රාදේශීය සභා මන්ත්‍රී. පළාත් සභා. අනුපිළිවෙළ අනුව ගිහිල්ලා තමයි බුදු රජාණන් වහන්සේට මේ කාරණාව ඉදිරිපත් කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා විෂයය ධාරාවට කථා කළා නම් හරි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විෂයයට තමයි මේ කථා කරන්නේ. මේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ බඩුත් හාමුරුවන්ගේ, නඩුත් හාමුදුරුවන්ගේ. ප්‍රශ්නය ඉදිරිපත් කරපු මනුස්සයාම මූලාසනයේ ඉන්නවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් රංජිත් සෝමවංශ බුදු වෙලා ඉන්නේ. ඒ නිසා දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ නිසා ඔබතුමා සදාචාර සම්පන්නව අනෙක් කෙනාට ඉඩ දෙන්න ඕනෑ. ඔබතුමාගේ ප්‍රශ්නයට මම උත්තර දෙනකොට ඔබතුමාට බාධා කරන්න සදාචාර සම්පන්න අයිතියක් තිබෙනවාද නැද්ද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා බඩුත් හාමුදුරුවන්ගේ, නඩුත් හාමුදුරුවන්ගේ. මම කෙටි උත්තරයක් දෙනවා. මේ සම්බන්ධව අපි හොරණ කලාපයට ගිහිල්ලා අපේ නිලධාරීන්, ලේකම්තුමා, පළාත් අධ්‍යක්ෂතුමා සියලු නිලධාරීන් එක්ක සාකච්ඡාවක් තිබ්බා. යළි මේ සතියෙන් පසු එළැඹෙන සතියේදී එවැනි දිනයක් දීලා මේ සම්බන්ධයෙන් විග්‍රහ කරන්න. හැබැයි එකක් කියන්න ඕනෑ. දීර්ඝ කාලයක් මේ සම්බන්ධයෙන් ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියට රජයේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දු ඔබතුමාගේ මනසේ තිබෙන විධියට - මම දන්නේ නැහැ නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මහත්තයාගේ මනසේ තිබෙන විධියට, පටු විධියට විසඳන්නට, නිරාකරණය කර ගන්නට ඒවාට වෙනත් විධියේ නිර්දේශ, අනුමැති ලබා දෙන්න බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට පුළුවන්කමක් නැහැ කියන එකත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ සියලුම මන්ත්‍රීතුමන්ලා එකඟ වෙනවා ඇති. මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දරුවන් සංඛ්‍යාව පන්තිවල අඩු වනකොට පන්ති සංඛ්‍යාව වැඩි නොවෙනවා නම් ඒ දරුවෝ කොහේ හරි යනවා ඇති කියන එක විශ්වාස කරන්න සිද්ධ වෙයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ, නැහැ. මේක මේ ඉන්න ගරු මන්ත්‍රීවරු ඔක්කෝම දන්නවා. මම කැමැතියි වෙලාව දෙනවා නම් ඔබතුමාත් එක්ක ටිකක් වැඩියෙන් කථා කරන්න. මොකද, මේක 2016 Superme Court Judgment එක. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ ළමුන් අඩු කරන එක හොඳයිද ඇමැතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේක මට තියා, ඔබතුමාට තියා කිරි අප්පටවත් බැහැ. ආපහු පුළුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට විතරයි. පන්ති වැඩි කරන්න පුළුවන්. පන්ති වැඩි කිරීමත් එක්ක අපි අධ්‍යාපනික ගුණාංග බලන්න ඕනෑ. මේ සිරස් අතට අධ්‍යාපනය ගොඩ නඟනකොට තිරස් අතට ගමේ ඈත දරුවෝ ඉන්න පාසල් වැහිලා යනවා. මේ නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා වැහුණු පාසල් අරපු ගරු මන්ත්‍රීවරයෙක්. මතක තියගන්න ඕනෑ. ඒ නිසා ගමේ කෙළවරේ ඈත පාසල් වැහිලා ඒ පාසල් දරුවෝ ටික ඔක්කෝම අඩු වුණාම නගරේ පාසල හැදුවාම ගමේ පාසල වැහෙනවා සරළ වචනයෙන්. අපට ගුරුවරු දෙන්න. අපට පහසුකම් දෙන්න. අපට පුළුවන් තරමින් ගුරුවරු දීලා තිබෙනවා. ඔබතුන්ලා දන්නවා මේ 07 වැනිදා ද්‍රවිඩ මාධ්‍ය සඳහා දෙවැනි වතාවටත් අපි ගුරු පත් වීම් දෙනවා. විභාග තියලා. මෙතුමන්ලා දන්නවා.

ඒ නිසාවෙන් තමන්ගේ පැත්ත ගැන හිතලා අධ්‍යාපනයේ තීන්දු ගන්න සූදානම් වෙන්න එපා. අපි මෙතැන ඉන්නේ කෙටි කාලයක්. මෙතැනින් එහාට ගියාම ගම්වල පන්තියේ අහිංසක දරුවෝ අඩු වෙලා. පන්ති 29 ක් තිබෙන බව ඇත්ත. මේ දරුවෝ අඩු වෙලා මැද නගරයට එකතු වෙලා, නගරය උතුරනවා. හොරණ නගරයේ ඉපදෙන ප්‍රමාණය, හොරණ නගරයේ ඒ පාසල් අවට සීමාවේම, බල ප්‍රදේශයේ ඉපදෙන ප්‍රමාණය හොරණ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් ගන්න පුළුවන්. මීට අවුරුදු 05 කට 06 කට කලින් ඉපදුණු ප්‍රමාණය. ඉතින් ඒවත් එක්ක බැලුවාම එකසිය ගණනයි තිබෙන්නේ. පාසල් අටට එක් දහස් හයසිය ගණනක් එනවා" පළමුවැනි වසරට. කොහේ හරි ඇවිල්ලා ගෙනැල්ලා වැරැදි තොරතුරු සපයලා, සම්මුඛ පරීක්ෂණවලට දාලා පාසලට ඇතුල් කරනවා. මම ඒවා කියන්න යන්නේ නැහැ. මොකද, ඔබතුමා මූලාසනයේ ඉන්න නිසා. සදාචාරාත්මක ඇමැතිවරයෙක් හැටියට මම සූදානම් මේ සතියෙන් එහා සතියේදී මේ ප්‍රශ්නය විධිමත්ව ඔබතුමන්ලාත් එක්ක සාකච්ඡා කරන්න. හැබැයි මම අර කලින් කියපු කථාව කියන්න ඕනෑ. ඒක කෙටි කරලා

කියන්නම්. මොනවත් එපා. මුගලන් හාමුදුරුවෝ රහත් වෙලත් ශරීරයේ ඇට සුන්සහල් වනකල් දත කෑවා. මේක මහ පාපකර්මයක්. මේ නියෝජ්‍ය සභාපති මන්ත්‍රී කාලයේ ඉඳලා නියෝජ්‍ය සභාපති වෙලත් මේක පස්සෙන්ම පහර දි දී අවතාර වාගේ හැමදාම එනවා. මේක ප්‍රශ්නය විසඳා දෙන්න මම සූදානම්. ඔබතුමා අනෙක් මන්ත්‍රීවරුත් එක්ක මේ සතියේ නොවෙයි, ඊළඟ සතියේදී හම්බ වෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මගේ විතරක් නොවෙයි. සියලු නගරවල තිබෙන ප්‍රශ්නයක්. ඒක ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අපේ අනෙකුත් ගරු ඇමැතිතුමන්ලාට අවස්ථාව ලබා දෙනවා. ගැටළු නැහැ වාගේ.

## පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු : I
PRIVATE MEMBER'S AFFAIRS : I

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා. ඒ අනුව ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට යෝජනාව යළිත් විවාදයට ගැනීමේ අවස්ථාව.

*"රට තුළ වෙසෙන වැඩ කරන ජනතාව ඇතුළුව මුළු මහත් ජනතාව මුහුණ දෙන ජීවන වියදම දරා ගන්නේ කෙසේද යන ගැටළුවට තවත් බරක් ලෙස ඩීසල්, පෙට්‍රල් හා භූමිතෙල් මිල වැඩවීමත්, ගෑස් මිල වැඩි වීමත් පිළිබඳව වගකිව යුතු පාලකයන් විසින් විශේෂ අවධානයට යොමු කළ යුතුය. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීමත් සමගින්ද බැඳී ඇති මෙම තත්ත්වය නිසා දරිද්‍රතා මට්ටම තවත් ඉහළ යමින් පවතී. නිෂ්පාදන ආර්ථිකය බිඳ වැටීම, අපනයන ආදායම් අඩුවීම, ණය, බදු හා දඩ මත යැපෙන රටක් බවට පත් කිරීම, වංචා දූෂණ තත්ත්වයන්, රැකියා වියුක්තිය මෙන්ම රැකියා අවස්ථා පිළිබඳව සමාජ ආකල්පයන් ද සමඟ බැඳී ඇති මෙම තත්ත්වයට පැවැති සහ පවතින පාලනය වගකිව යුතු අතර, ජනතාව මත බර පැටවීම වෙනුවට නාස්තියෙන් තොර පාලනයකට යොමු වන ලෙසත්, වහාම තෙල් හා ගෑස් මිල අඩු කරන ලෙසත් රජයෙන් ඉල්ලා සිටී."*

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed again.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගණපූරණය නොමැති පසුගිය සභා වාරයේදී අවසන් කිරීමට නොහැකි වූ ඉහත යෝජනාව සඳහා අදහස් දැක්වීමට අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා සභාව කල් තියන වෙලාවේ මම කථා කරන්න නැගිට්ටේ. එතකොට මන්ත්‍රීවරයෙක් නැඟිටලා සභාවේ ගණපූරණය නැහැයි කියලා කිව්වා. ඒක නිසා කථාවේදී ගරු සභාපතිතුමනි, කියන කොටම තමයි වුණේ. එතකොට මගේ අවස්ථාව නැතුව යනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ, දෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මට තේරෙන්නේ නැහැ, දැන් මේ සභාව ඇතුළේ වෙන වැඩ. විශේෂ ප්‍රකාශ කරන්න නැහැ. ඒවා කලින් දැනුම් දෙන්න ඕනෑ. එක එක්කෙනා නැඟිටලා ප්‍රකාශ කරනවා. මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තියෙනවාද නැද්ද කියලා විතරයි අහන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තියෙනවා. අසෝක සපුමල් ගරු මන්ත්‍රීතුමා මුලින් කථා කරන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔබතුමා කථා කරන්න.

[පූ.භා.10.57]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වැඩි වේලාවක් කථා කරන්නේ නැහැ. මොකද, එදා තිබුණු හැඟීම අද වනකොට ටිකක් අඩු වෙලා තිබෙන නිසා. කොහොම වුණත් මේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු හදිසි යෝජනාවට අපේ කිසිම විරෝධතාවයක් නැහැ. අපි සාමාන්‍යයෙන් මේ රටේ මහජනතාවට යම්කිසි සුභසාධනයක් වෙනවා නම් ඒකට කිසිම භේදයක් නැතුව, සහයෝගය දීලා පක්ෂව කථා කරන අය. නමුත් මේ යෝජනාව හදිසියේ ගේනකොට සාමාන්‍යයෙන් මේ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණටත් යම්කිසි වාසියක් ගන්න නිසා ඇති කරපු ප්‍රශ්නයක්. නමුත් ඇත්ත වශයෙන්ම අද වනකොට මේ රටේ තිබෙන තත්ත්වය දිහා බැලුවාම, මේ තිබෙන ජීවන වියදම දිහා බැලුවාම 2015 ජනවාරි මාසේ 08 වැනිදාට ඉස්සර තිබුණු තත්ත්වයයි, අද තිබෙන තත්ත්වයයි සංසන්දනය කරලා බලන්න ඕනෑ. මම දන්නේ නැහැ, අස් කන් තිබෙන, මොළය තිබෙන, දත්තයන් දන්න ඕනෑ කෙනෙකුට තේරෙනවා එදාට වඩා අද බොහෝ දේවල්වල මහජනතාවට සහනයක් වන යම්කිසි දේවල් සිද්ධ වෙලා තිබෙනවා කියන එක. උදාහරණයක් හැටියට සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත් එහෙම බෙහෙත් මිල මොන විධියට අඩු වෙලා තිබෙනවාද කියලා එදා තිබුණු තත්ත්වයට අද සංසන්දනය කරලා බලන්න. ගෑස් මිල රුපියල් 2600/- ට තිබුණේ. ඒ රුපියල් 2600 ට තිබුණු ගෑස් මිල අදටත්, අවුරුදු 3 ක් ගිහිල්ලා 3 ½ ක් වෙන්න එනවා. රුපියල් 1000 කටත් වැඩිය අඩුයි. පෙට්‍රල් මිල. ලෝක වෙළඳ පොළේ ඉන්ධන මිල එහාට මෙහාට වෙනකොට අඩු වෙනවා, වැඩි වෙනවා තමයි. නමුත් එදා තිබුණු තත්ත්වයට වැඩිය අද මේ රටේ ඉන්ධන මිල, භූමිතෙල්, ගෑස්, පෙට්‍රල්, ඩීසල් අඩු වෙලා තිබෙනවා. මේ වෙලාවේ වැඩි කිරීම නිසා යම්කිසි අපහසුතාවයකට පත් වුණා. විශේෂයෙන්ම මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල මැතිවරණ කොට්ඨාශයේ සම්පූර්ණයෙන්ම එක පැත්තක් වැහෙන්නේ මුහුදු බඩ තීරයෙන්. එතකොට මේ මුහුදුබඩ තීරය ආශ්‍රිතව රැකියාව කරන්නේ අපේ ප්‍රදේශවල ඉන්න දුප්පත් ධීවර ජනතාව. ධීවර ජනතාවට විශාල ප්‍රශ්නයක් වුණා. විශේෂයෙන්ම මේ තෙල් මිල, ඩීසල් මිට වැඩි වීමෙන්. මොකද, කලින් අපි දැක්කා, ඩීසල් මිල වැඩි කරන එකට විරුද්ධව මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේ මේ පිළිබඳව උද්ඝෝෂණය කරන්න ගිහිල්ලා තමයි හලාවත ඇන්ටනීලාට වෙඩි කාලා මැරෙන්න සිද්ධ වුණේ. නමුත් මේ යහපාලන ආණ්ඩුවේ අද මොනතරම් උද්ඝෝෂණ කළත්, අද ගංගාවල යනවා විදුලිය පත්තු කරගෙන. මිනිස්සු උද්ඝෝෂණ කරනවා. මේ ඇත්ත ප්‍රශ්නයක්. ඒ නිසා විශේෂ සහනාධාරයක් දෙන්න ඕනෑ. මේක අක්‍රමත් විධියට තමයි තවම සිද්ධ වෙන්නේ. ඊයේ පෙරෙයිදා මම දැක්කා මධ්‍යම රජයේ ධීවර ඇමැතිතුමා ප්‍රකාශයක් කරනවා මෙපමණ සහනාධාර දීලා, මෙපමණ මුදල් ගත්තා. නමුත් මේක ගෙවන, මේක ලබා දෙන ක්‍රමය පිළිබඳව තවම හරි විධිමත් සැලැස්මක් නැහැ. ඒක නිසා සැබැවින්ම මම කථා කරන්නේ ධීවර මුදලාලිලා ගැන නොවෙයි. සාමාන්‍ය එදිනෙදා රස්සාව කරන, බෝට්ටුව තියාගෙන ඉන්න අපේ ප්‍රදේශයේ ඉන්න දුප්පත් ධීවරයෝ ගැන. ඒ අය වෙනුවෙන් මම හිතන්නේ මේ තත්ත්වය වෙනස් කළ යුතුමයි. ස්ථිර වශයෙන්. මොකක් හරි ක්‍රමවත් වැඩ පිළිවෙළක්. මේ හැම එකේම සාධාරණය සියයට සියයක් නිවැරැදිව කරන්න බැහැ. නමුත් ඒ අයට යම්කිසි සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ.

දැන් මෙහෙම කථා කළාම ඇයි මේ ධීවරයෝ ගැන විතරක් කථා කරන්නේ? ධීවරයෝ විතරද ඉන්ධන පාවිච්චි කරන්නේ? නමුත් වෙන වෙන ක්ෂේත්‍රවල ඉන්න අය පුළුවන්. මම කථා කළේ අපේ ප්‍රදේශයට බලපාන නිසා. මේ අවස්ථාවේදී ඒ ධිවරයින්ට ඉන්ධන සහනාධාරය අනිවාර්යයෙන්ම ලබා දිය යුතුයි. දැන් මේකට සෑහෙන කාලයක් ගියා. මට තේරෙන්නේ නැහැ මේ ආණ්ඩුවේත් යම් යම් දේවල් තිබෙනවා. කරන්න ඕනෑ වෙලාවට ඒ වැඩේ හරියට කරන්නේ නැහැ. ප්‍රශ්න ඇති කරලා, උද්ඝෝෂණ කරලා කඳුළු ගෑස් ගහලා, මිනිස්සු එළවලා, පුළුවන් තරම් අවුල් කරලා, ඒකාබද්ධ විපක්ෂයට කථා කරන්න මාතෘකා හදලා දීලා තමයි වැඩේ කරන්නේ. ඉතින් ඒක අවශ්‍ය නැහැ. ඇත්ත වශයෙන්ම සල්ලි දීලා තිබෙනවා නම්

ක්‍රමවත් වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්. ඒක නිසා බඩු මිල අඩු කිරීම පිළිබඳව මම හිතන්නේ අපි හැමෝම ඉන්නේ එක ස්ථාවරයක. මම 1984 දී මහජන බැංකුවේ සේවකයෙක් විධියට ඉන්න කාලේ ඩොලර් එකේ ගණන රුපියල් 26 යි. ඩොලර් එකකට ලංකාවේ සල්ලි ගෙවන්න ඕනෑ රුපියල් 26 යි. දැන් අවුරුදු 34 ක් ගිහිල්ලා අද 160 යි. අද 160 ක් ගෙවනවා. ඒක තමයි ඇත්ත කතන්දරේ. එතකොට මේක මේ ආණ්ඩුව කාලයේම මේ ඩොලර් එකේ අනුපාතය එහාට මෙහාට ගියේ නැහැ. මේක ක්‍රමයෙන් ඒ ඒ වකවානුවල, ඒ තිබුණු රජයන් යටතේ ඉතා සීඝ්‍රයෙන් රුපියල බාල්දු වෙලා තිබෙනවා. ඒක නිසා තමයි විශේෂයෙන්ම මේ බඩු මිල එහාට මෙහාට වෙලා තිබෙන්නේ.

දැන් උදාහරණයක් හැටියට ගත්තොත් පසුගිය කාලයේ එළවළු විසි කළා. රූපවාහිනියෙන් පෙන්නනවා දැක්කා නේ? වට්ටක්කා ගොඩ ගහලා තිබෙනවා. තක්කාලි විසි කරනවා. අලින්නට ගෙනැල්ලා කන්න දෙනවා. අද ගිහිල්ලා බලන්න. මම නම් දවස ගාණේම ඒකට සහභාගී වන පුද්ගලයෙක් නිසා අපි ආර්ථික මධ්‍යස්ථානවලට ගියාම අද එළවළු මිල වැඩියි. අද උඩරටින් එන එළවළුවල මිල වැඩියි. පාරිසරික හේතු නිසා, දේශගුණික විපර්යාස නිසා යම් යම් දේවල් සිද්ධ වෙනවා. ඒවා පාලනය කරන්න බැහැ. නමුත් ඒවා පාලනය කරන්න බැහැයි කියලා නැහැ. මේ පළාත් සභාවටත් වගකීමක් තිබෙනවා. මේවායේත් කෘෂිකර්ම අමාත්‍යාංශ තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ පළාතේ ජනතාවට හරි මේවා සංරක්ෂණය කරගන්න පුළුවන් ක්‍රම හදන්න පුළුවන්. නමුත් එහෙම ක්‍රියාදාමයක් මේ පළාත් සභාව තුළ, කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා යන්නේ නැහැ. පොල් හිඟ කාලයට පොල්වල මිල අඩු වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කෘෂිකර්ම ඇමැතිතුමා දෝෂාරෝපණය කරනවා. ඇහුම්කන් දෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කෘෂිකර්ම ඇමැතිතුමා හොඳ වෙන්න පුළුවන්. කෘෂිකර්ම ඇමැතිතුමාටත් විකල්පයක් කියන්නේ. දෝෂාරෝපණයක් නොවෙයි මම කියන්නේ. යෝජනාවක් විධියට අපි මේවා ඉදිරිපත් කරන්නේ. එතුමාට මම ජීවිතේ කිසිම දවසක දෝෂාරෝපණය කරන්නේ නැහැ. ඔහොම නොවෙයි, කොපමණ වැරදි කෙරුවත් කරන්නේ නැහැ. ඒක නිසා අපේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා හරි පුළුවන් අපේ තිබෙන එළවළුවල, අපේ තිබෙන නිෂ්පාදනවල යම්කිසි සංරක්ෂණයක් ඇති කරලා ඒවා හිඟ කාලයට - දැන් මේ කාලයේ දෙහි ලාභයි. දෙහි කුණු වෙවී යන කාලේ. ඉතින් ඒවා සංරක්ෂණය කරන්නේ නැහැ. අන්න එවැනි ප්‍රශ්න නිසා තමයි එදිනෙදා මහජනතාවගේ ජීවන වියදම යම් යම් ආකාරයෙන් වැඩි වෙලා තිබෙන්නේ. නමුත් සාපේක්ෂව ගත්තොත් එහෙම 2015 ජනවාරි මාසේ 08 වැනිදාට ඉස්සෙල්ලා කවුරු මොන විධියට තර්ක කළත්, අර ඩොලර් එක එහාට මෙහාට ගිහිල්ලා යම් යම් ප්‍රමාණවලින් වෙනස් වුණා මිසක්, ඉන්ධන ගත්තත්, ගෑස් ගත්තත්, ආහාරවල මිල ගත්තත්, මේ හැම එකක්ම යම්කිසි ප්‍රමාණයකට අඩු වෙලා තිබෙනවා. හැබැයි ඉතිහාසයත් එක්ක සංසන්දනය කරලා බලද්දී හරි නම් මේවා වැඩි වෙන්න ඕනෑ. ඒක නිසා අපිත් ඉල්ලීමක් කරන්නේ විශේෂයෙන්ම පුළුවන් නම් අර බෙහෙත් මිල අඩු කරන්න. ඒ මාෆියාව නැති කරන්න. බෙහෙත් කොම්පැණිකාරයොත් එක්ක සෞඛ්‍ය ඇමැතිතුමා ජීවිතයත්, මරණයත් එක්ක සටනක යෙදිලා, ඒ එඩිතර තීන්දුව ගත්තා වාගේ අනෙක් අයටත් පුළුවන් එවැනි තීන්දු අරගන්න. මේ හුඟක් දේවල්වලට මුහුණ දීලා තිබෙන්නේ කොයි ඇමැතිවරයා ආවත්, කොයි අමාත්‍යාංශය භාර ගත්තත්, කොයි රාජ්‍ය නායකයා ආවත් හුඟක් වෙලාවට මේ ඩීල් එක්ක යන කතන්දරය නිසා තමයි. ඒක තමයි ඇත්ත කතන්දරය. අපි මේක විවෘතව කථා කරන්න ඕනෑ.

දැන් මම සභාවට එනකොට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා බැඳුම්කරයෙන් සල්ලි දීපු ඒවා ගැන කථා කර කර හිටියා. ඒවා ඩීල්. දැන් සමහර වෙලාවට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා දන්නෙත් නැතුව ඇති, ඒ කොම්පැණියකින් ඇවිල්ලා එතුමාගේ මැතිවරණ ව්‍යාපාරයට සල්ලි දෙන්න ඇති. එතකොට ඒ මිනිස්සුන්ට හිතවත් විධියට ඒ ඒ පාලකයින්ට කටයුතු කරන්න සිද්ධ වෙනවා. එහෙම එකක් නොවෙයි අපි මේ කියන්නේ. ඒක නිසා වැරැද්ද කවුරු කළත් මේ රටේ මහජනතාව ගැන හිතන්න ඕනෑ. දැන් අද අපේ ප්‍රදේශයේ මාළු ව්‍යාපාරය, ධීවර ව්‍යාපාරය. මේ ගොඩ බිමට මාළු කොපමණද එන්නේ? අනෙක් ඔක්කෝම ජාත්‍යන්තර මුහුදේදී යුරෝපයට අපනයනය වෙනවා. වෙනත් යාත්‍රාවලින් අරන්

[ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා]

යනවා. අපට හම්බ වෙන්නේ බොහොම සීමිත ප්‍රමාණයයි. හැබැයි ඒකත් මම හිතන්නේ 30% කට අඩුවෙන් තමයි නෙළා ගන්නේ. දැන් මේවාවලට විධිමත් වැඩ පිළිවෙළවල් හැදුවා නම්, මේවා ශක්තිමත් කරලා ජනතාව ශක්තිමත් කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් දැනුවත් කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් මීටත් වඩා ජීවන වියදම අඩු කරගන්න පුළුවන්. ඒක නිසා එතුමාගේ යෝජනාව දේශපාලන කථිකාවක් හැටියට මේ වෙලාවේ හොඳයි. සංසන්දනාත්මකව බැලුවොත් එහෙම පසුගිය ආණ්ඩුවට වැඩිය මේ රජය මේ රටේ ජනතාවගේ ජීවන වියදම අඩු කරන්න හැම ක්ෂේත්‍රයකින්ම කටයුතු කරලා තිබෙනවා කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.11.06]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙනවා මේ රටේ ජනතාවට ජීවන වියදම බර දරා ගන්න බැරි මොහොතක යම් සහනයක් ලබා දීමට යෝජනාවක් එක පැත්තකින් ආණ්ඩුවක, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ඒ වාගේම අදාළ අමාත්‍යාංශය මගින් කැබිනට් තීරණයක් අනුව ඉන්ධන මිල වැඩි කරන්න තීන්දුවක් ගත්තා. මේ තීන්දුව ගන්න මොහොත වනකොට මේ රටේ ජනතාව මුහුණ දීලා තිබෙන ජීවන වියදම වාගේම එක පැත්තකින් රුපියල බරපතළ අවපාතයකට පත් වෙලා තිබෙන තත්ත්වයක් තුළ තමයි මේ යෝජනාව ගෙන එන්නේ. මේ යෝජනාවට කථා කරන මන්ත්‍රීවරුන්ගෙන් කියැවුණු කාරණාවක් තමයි මේ ඉන්ධන මිල සම්බන්ධ ජනප්‍රිය මාතෘකාවක් නිසා තමයි මේක ඉදිරිපත් කළේ කියලා. ඒ නිසා මේ ඉන්ධන අර්බුදය, ඉන්ධන මිල වැඩි වීම සම්බන්ධව පොඩි පැහැදිලි කිරීමක් කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඉන්ධන අර්බුදය, ඉන්ධන මිල වැඩිවීම සම්බන්ධව භාණ්ඩාගාරයේ බංකොළොත්භාවයත් ඒ විධියටම බලපානවා. මේක අපි හඳුන ගන්නේ, රටේ ආර්ථික අර්බුදයක් විධියට. මේ අර්බුදය ගොඩ නැගෙන්නේ ඉන්ධන ආශ්‍රිතව මේක විසඳන්න උත්සාහ කිරීම තුළ තමයි, ඒක ජනතාව පෙළෙන, ජනතාව පීඩාවට පත් වන ගැටළුවක් බවට පරිවර්තනය වෙන්නේ. අපි බලමු ඛනිජ තෙල්, නැත්නම් පොසිල ඉන්ධන මේ රටට හඳුන්වා දුන්නේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් සමාගම් හතරක් මගින්. කැල්ටෙක්ස්, මොබිල්, එෂෝ, ෂෙල්. මේ ප්‍රධාන සමාගම් හතර තමයි ඛනිජ තෙල් ඒකාධිකාරය සහිතව රටට ඛනිජ තෙල් ගෙනැල්ලා, බෙදා හැරලා, විකුණන්න කටයුතු කළේ. මේ කටයුතු කරලා අවුරුදු 10 ක් 15 ක් යනකොට නිදහස ලැබුවාට පස්සේ එක්තරා අවස්ථාවකදී මේ ඛනිජ තෙල් අවශ්‍යතාව මත මේ රටේ ජනතාව බරපතළ පීඩාවකට පත් වෙනවා කියලා අවබෝධ කරගෙන ඒ මොහොතේදී තීන්දුවක් ගන්නවා ඛනිජ තෙල් ඒකාධිකාරය රජයට ගන්නවා කියලා. 1961 අංක 28 දරන පනතින් තමයි රජයේ ඒකාධිකාරය යටතට ඛනිජ තෙල් ගන්නේ. ඒ ඒකාධිකාරය යටතට ගත්තාට පස්සේ 1962 - දැන් වාගේ නොවෙයි. ජනතා හිතකර පනතක් ක්‍රියාත්මක වනකොට අවුරුද්දක් ගත වෙන්නට කලින් ඒකේ ප්‍රතිලාභ ජනතාව වෙත කටයුතු කරන්න මැදිහත් වෙනවා, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විධියට. 1962 මාර්තු මාසේ වනකොට තෙල් විකිණීමට, බෙදා හැරීමට රජය විධියට සංස්ථාව මැදිහත් වෙනවා. මැදිහත් වෙලා මෙන්න මේක තමයි ඉතාමත් පැහැදිලිව මේ ආර්ථික අර්බුදයේ තිබෙන ඇත්ත තත්ත්වය අවබෝධ කරගන්න පුළුවන් කාරණය.

මේ මැදිහත් වෙලා තෙල් විකුණනකොට, තෙල් බෙදා හරින කොට බරපතළ ගැටළුවක් බවට පත් වුණා තෙල් ගන්නේ කාගෙන්ද? ආයිමත් තෙල් ගන්න සිද්ධ වෙලා තිබුණේ මුහුද මැද පාවෙන කැල්ටෙක්ස්, එෂෝ, මොබිල් ඒ වාගේම ෂෙල් සමාගම්වල නැව්වලින්. නැව්වලට ඇනවුම් කරලා මේ තෙල් ලබාගෙන රටට විකුණන්න සිද්ධ වුණාට පස්සේ ඒ සමාගම් බරපතළ වාසයක් අත්පත් කර ගන්නවා. ඔවුන් බෙදා හරින්නෙත් නැහැ. විකුණන්නෙත් නැහැ. ඩීල් කමිෂන් නැහැ. ගබඩා කරගන්නේ නැහැ. ඒ ඔක්කෝම රජය කරගෙන, ඒ තෙල් ටික රට ඇතුළට ගෙනැල්ලා ඉවර වෙලා බෙදලා, ඒ සමාගම්වලට මුදල් ලබා දෙනවා. මෙන්න මේ තත්ත්වය අවබෝධ කරගෙන 1964 මේ පනත සංශෝධනය වෙනවා. ඒ සංශෝධනය වෙලා බොරතෙල් ගෙනැල්ලා මේ රටේ නිෂ්පාදනය කරලා තෙල් බෙදා හැරීමේ කටයුතු ආරම්භ කරන්න 64 පනත සංශෝධනය වෙනවා. අවුරුදු 04 යි යන්නේ. ටැංකි එකසිය පනස් ගණනක් නිර්මාණය වෙලා. මහ දැවැන්ත යන්ත්‍රාගාරයක් නිර්මාණය වෙලා අවුරුදු 04 න් පිරිපහදුව 1969 අගෝස්තු මාසේ ගිනි දැල්ල Start කරලා ඉවර වෙලා තෙල් බෙදා

හැරීමේ කටයුතුවලට අවතීර්ණ වෙනවා. මෙන්න මේ අවස්ථාවේදී බොර තෙල් ලබා ගන්න රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් රටවල් අතර එකඟතා ඇති කර ගන්නවා. ප්‍රධාන කොටම පිරිපහදුව නිර්මාණය වෙන්නේ ඉරානයේ අජාජාරී කියලා බොර තෙල් වර්ගය කෲඩ් oil වලින්. ඒක නිසාම ඉරානයත්, ලංකාවත් අතර මිතුදමක් ගොඩ නැගෙනවා. අපේ රටෙන් තේ ලබා දෙනවා. ඒ රටෙන් තෙල් ලබා දෙනවා. අපේ රටෙන් පොල් නිෂ්පාදන ලබා දෙනවා. ඉරානයෙන් අපට තෙල් ලබා දෙනවා. ඉරානයත්, මැද පෙරදිග රටවල්, ඔපෙක් සංවිධානය විධියට Oil Producing and Exporting Country කියලා රටවල් අතර සම්බන්ධතාවයෙන් තෙල් සම්බන්ධව මැදිහත්වීමක් සිද්ධ කර ගන්නවා. මෙහෙම තමයි රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනු කරන්නේ. මේ ගනුදෙනුවලට flight එකක් පුරවලා ඒ රටවල්වලට ගියත් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. හැබැයි රාජ්‍ය නායකයෝ සමත් වෙන්න ඕනෑ මේ රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනු වෙද්දී බොර තෙල් සම්බන්ධයෙන් ගිවිසුම ගහගෙන අඛණ්ඩ බොර තෙල් සැපයීමක් කරන්න. අඩුවැඩි වෙන්නේ නැතුව දීර්ඝ කාලීනව අඛණ්ඩව බොර තෙල් සපයනවා. බොර තෙල් පිරිපහදු කරනවා. දවසකට මෙට්‍රික් ටොන් 5500 කින් ආරම්භ කරන්නේ. හැබැයි ක්‍රමානුකූලව රටේ ඉල්ලුම් ධාරිතාව වැඩි වනකොට 5500, 6500 කරනවා. 7500 දක්වා වැඩි කරනවා. ඊට අදාළව රටට කොහොම වුණත් විදේශ විනිමයක් යන නිසා එය අවම කර ගන්න ඛණිජ තෙල් ආශ්‍රිතව නව නිෂ්පාදන ඉදිරිපත් කරනවා. එකක් තමයි ඉටි පන්දම් කාර්මාන්තයට ඛණිජ තෙල් ක්ෂේත්‍රය ප්‍රවිෂ්ට වෙනවා.

දෙවැනි එක තමයි නයිලෝන් නිෂ්පාදනයට ඛණිජ තෙල් ක්ෂේත්‍රය මැදිහත් වෙනවා. තුන්වැනි කාරණය යූරියා පොහොර හදන්න පොහොර සංස්ථාව මගින් දැවැන්ත යන්ත්‍රාගාරයක් නිර්මාණය කරනවා. දැන් අර රටට යන විදේශ විනිමය පැති ගණනාවකින් ඉතුරු වෙනවා. එක පැත්තකින් බොර තෙල්වලට යන වියදම ආවරණය කර ගන්න පොහොර ගෙන්වීම නවත්වනවා. ඒකට බොර තෙල්වලින් තිබෙන අපද්‍රව්‍යයක් විධියට ඒ වෙලාවේ එළියට දාන රසායනික නැත්තා ප්‍රයෝජනයට අරගෙන ඉවර වෙලා ඒ යූරියා නිෂ්පාදනය කරනවා. මෙන්න මේ විධියට ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛණිජ තෙල් අවශ්‍යතාවයේ ස්වර්ණමය යුගය විධියට 70 දශකයත්, 80 දශකයත් හඳුන්වා දෙන්න පුළුවන්. හැබැයි 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නාට පස්සේ ඉතාමත් බරපතළ ශෝචනීය තත්ත්වයකට මේ ඛණිජ තෙල් ක්ෂේත්‍රය ඇද වැටෙනවා. පොහොර සංස්ථාව වහලා දානවා. නයිලෝන් යන්ත්‍රාගාරය වහලා දාලා වහලයත් ගලවාගෙන යනවා. ඒක ලංකාවෙන්ම ලංකා බැංකුව හරහා ණය මුදලක් දීලා කොරියානු සමාගමකට භාර දෙනවා. මට වඩා හොඳට ජෝර්ජ් මන්ත්‍රීතුමා මේ සම්බන්ධව දන්නවා. එතකොට Nylon Silk යන්ත්‍රාගාරය සම්පූර්ණයෙන්ම අද වහලක් නැති සහ දැවැන්ත ගොඩනැගිල්ලක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ලිහිසි තෙල් අංශය සම්පූර්ණයෙන්ම වහලා දානවා. කෘමිනාශක අංශය සම්පූර්ණයෙන් වහලා දානවා. දැන් බොර තෙල් වියදම සමනය කර ගන්න තිබුණු සියලු අත් ටික කපලා දාලා තමයි පිරිපහදුව හුදෙකලා කරන්නේ. මේ පිරිපහදුව හුදෙකලා වෙද්දී අර පරණ තිබුණු සමාගම් නැවත ඉස්මතු වෙනවා. කැල්ටෙක්ස්, මොබිල්, ෂෙල්, එෂෝ කියන සාමගම් නැවත හිස ඔසවලා ලංකාවට ඛණිජ තෙල් නිෂ්පාදන විධියට ඔපෙක් ගිවිසුම් පැත්තට දාලා, බොර තෙල් සම්බන්ධයෙන් තිබෙන ගිවිසුම් කඩලා බිඳලා දාලා කෙලින්ම සිංගප්පූරු වෙළඳ පොළෙන් ලංකාවට තෙල් ගෙන්වන්න කටයුතු කරනවා, නිමි නිෂ්පාදන විධියට.

මෙන්න මේ නිමි නිෂ්පාදන විධියට ගෙන්වද්දී පිරිපහදුව දුවන්න බැරි ශෝචනීය තත්ත්වයකට පත් වෙනවා. එක පැත්තකින් පිරිපහදු යන්ත්‍රාගාරය අවුරුදු 60 කින් විතර නවීකරණය කරලා නැහැ. ඒක නිසා දුවන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අදට සරිලන අවශ්‍යතාවය අනුව, ඒ අවශ්‍ය පරිදි තෙල් වර්ගය වැඩියෙන් නිෂ්පාදනය කරන්න ඕනෑ. Modification වලට ගිහිල්ලා නැහැ. ඒ වාගේම ඛණිජ තෙල් ධාරිතාව, ඒ සම්බන්ධව වන වෙනස්කම් මේ කිසිම දෙයක් කරන්නේ නැතුව, ඒකට වියදම් කරන්නේ නැතුව පිරිපහදුවට ශෝචනීය මරණයක් අත්පත් කරලා තිබෙන්නේ. ලංකාවට බොර තෙල් ගෙන්වන එක නවත්වලා නිමි නිෂ්පාදන ලෙස අර මුහුදේ පා වෙන නැව්වලින් ලබා ගැනීම උදෙසා. ඒ නිසා මේ ඛණිජ තෙල් අර්බුදය නිකම් ඇති වුණු දෙයක් නොවෙයි. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විධියට. මේක ජනප්‍රිය සටන් පාඨයක් නොවෙයි. එහෙම නැත්නම් සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට. මේකේ ඇතුළේ තිබෙන ඇත්ත හරය, ආර්ථික අර්බුදය ඇයි මේ විධියට පුපුරා යන්නේ කියලා තේරුම් ගන්න ඕනෑ. මේ බොර තෙල් ගෙනැල්ලා පිරිපහදු කරන ඔපෙක් සංවිධානය,

[ගරු අසෝක සපුමල් රන්වල]

ඊට පස්සේ ඔපෙක් සංවිධානයේ නම වෙනස් කරනවා. Oil Producing වෙනුවට Oil Organization of Petrolium Exporting Country's කියලා වෙනස් කර ගන්නවා. ඒ වෙලාවේදීවත් රජය රාජ්‍ය තාන්ත්‍රිකව මැදිහත් වුණේ නැහැ. ඉරානයේ ගමන් වාර ගණනාවක් - මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඉඳිද්දී flight එක පුරවලා ඉරානයට ගියත්, ඒ වාගේම මේ ළඟදී මහින්ද රාජපක්ෂ මැතිතුමා වාගේම මෛත්‍රීපාල ජනාධිපතිතුමාත් ගියා. flight පුරවලා ගිහිල්ලා අඩුම තරමින් ඛනිජ තෙල් සම්බන්ධව ගිවිසුමක් අත්සන් කර ගන්න බැරි වෙලා තිබෙනවා. එක්තරා මොහොතකදී ඉරානයේ අහමඩිනෙජාඩ් කියන ජනාධිපතිවරයා ලංකාවට ගෙන්නගෙන දවස් ගණනක ඉඳලා මහ දැවැන්ත මුල් ගලක් තියනවා පිරිපහදු නවීකරණය කරන්න කියලා. ඒ මුල් ගලට ලක්ෂ ගණනක් වියදම් කරලා අද වනකොටවත් ඒ නවීකරණ කටයුතුවලට ඉඩම් පවරා ගත්තා විතරයි. ඒ ඉඩම් අහිංසක මිනිස්සුන්ගෙන් කුණු කොල්ලයට අරගෙන ඒ ඉඩම්වලින් පිරිපහදු නවීකරණය කළේ නැහැ. පිරිපහදු නවීකරණ Project එක භාරව ඉන්න ඉංජිනේරුවරයාට ලක්ෂ 4 ගණනේ අඛණ්ඩව අවුරුදු 4 ක් විතර ලබා දුන්නා. හැබැයි Project එක ආරම්භ කළේ නැහැ. ඉස්ලාම් Project කියලා. ඒක නිසා ඛනිජ තෙල් සම්බන්ධ අදහස බොර තෙල් මගින් විසඳන්න කියන අදහස සම්පූර්ණයෙන්ම අතහැරලා තිබෙන්නේ බහුජාතික සමාගම්වල උවමනාවට. එතකොට අන්න ඒ විධියට තමයි මේ ඛනිජ තෙල් ක්ෂේත්‍රයට මැදිහත් වුණේ. ප්‍රශ්නය විසඳන්න නොවෙයි, ප්‍රශ්නය උඩුදුවන ආකාරයට මේ රටේ ජනතාව මේ බර වැටෙන්නේ අන් කිසි දෙයක් නොවෙයි, මේ දක්වා පැවැති රජයන් ගත්තු වැරැදි තීන්දු තීරණ නිසා තමයි මේ අසරණ තත්ත්වයට පත් වෙන්නේ.

ඊළඟට මම ඉදිරිපත් කරන්නම් මේ බොර තෙල් මිල වැඩිවීම එහෙම නැත්නම් ඛනිජ තෙල් මිල වැඩි වීම නිසාද මේ ඉන්ධන මිල වැඩි කරන්න සිද්ධ වුණේ කියලා? මම ඒකට දත්තයන් ටිකක් ඔබට ඉදිරිපත් කරන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සිංගප්පූරු වෙළඳ පොළේ flat rate එක තමයි අපි තෙල් ගෙන්වන්න පාවිච්චි කරන්නේ. අප්‍රේල් මාසේ average එක රුපියල්වලින් ගත්තොත් 78.431 යි. ශතවලින් ගත්තොත් එහෙම ශත 43 යි. ඒ වරායට ඇවිල්ලා ගොඩ බාන මොහොත වනකොට සිංගප්පූරු වෙළඳ පොළ අනුව 90 ඔක්ටේන් ලීටරයක මිල 78.43 යි. වරායේ ගොඩ බාන අවස්ථාවකදී වරායට ගොඩ බෑම සඳහා යම් මුදලක් ගෙවන්න ඕනෑ. ඒකට අපි එකඟ වෙනවා. ගොඩ බාන්න බැහැ නේ නිකම්. මිනිස් ශ්‍රමය අවශ්‍යයි. යන්ත්‍රෝපකරණ අවශ්‍යයි. වරායට වියදම් තිබෙනවා. ඒ සඳහා 2.76% ක් වෙන් කරනවා. ඒකේ ප්‍රමාණය ගත්තාම රුපියල් 1.72 යි. දැන් රුපියල් 79 ක් විතර වෙනවා ලීටරයේ මිල. 90 ඔක්ටේන්. ඊට පස්සේ Excise Tax එකක් තිබෙනවා. මේ තෙල්වලට සුරාබද්දක් තිබෙනවා. මොකක්ද තෙල්වලට තිබෙන සුරාබද්දේ සම්බන්ධය. තෙල්වල සුරාබද්දේ සම්බන්ධය අනුව Excise Tax රුපියල් 27 ක් ගහනවා කව හතරකින්. ඊළඟට ගහනවා රේගු බද්දක්. Custom Duty එකක් ගහනවා ඒක රුපියල් 25.54 යි. ඊළඟට ගහනවා වරාය හා ගුවන් සේවා බද්ද, PAL. Port and Aviation Levy එක. ඒක 7.5% ක්. රුපියල් 5.80 ක් ගහනවා. රුපියල් 78.43 ක් වන පෙට්‍රල් ලීටරයට සම්පූර්ණ බදු මුදල - මට සමාවෙන්න නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා. එදා ඔබතුමාට මම කිව්වා රුපියල් 43 ක් කියලා. ඒක වැරැදියි. නියම ගණන තමයි රුපියල් 60.19 ක් සම්පූර්ණ Tax එකක් ගහනවා.

මෙන්න මේ වෙලාවට තමයි අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව, ජනතාවට මළ බද්ධය බවට පත් වෙන්නේ මේ බදු කියලා. ලෝක වෙළඳ පොළේ ඇත්තටම තෙල් මිල වැඩි වුණා නම් මේ රුපියල් 78 සංස්ථාවට ආවරණය කරන්න නේ මුදල් දෙන්න ඕනෑ. එහෙම මුදල් දුන්නේ නැහැ. රුපියල් 60 ක මුදලක් ගත්තා භාණ්ඩාගාරයට. භාණ්ඩාගාරයට ගත්තාට පස්සේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මෙහෙයුම්, බෙදා හැරීම සහ commission රුපියල් 12 ක් යනවා. එතකොට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ණය වෙලා තිබෙන දේවල් බේරන්න රුපියල් 6 ක් වෙන් වෙනවා. සම්පූර්ණ මුදල 158 ක් වෙනවා. සංස්ථාව රුපියල් 18 ක් පාඩු ලබලා තෙල් ටික දෙනවා. භාණ්ඩාගාරයට රුපියල් 60 ක් බදු ගෙවලා. මෙන්න මේ විධියට තමයි ඛනිජ තෙල් මිල සම්බන්ධව තිබෙන ඇත්ත තත්ත්වය. දැන් ජනතාවට සහන දෙන්නේ කොහොමද? බොර තෙල් ගෙන්වීම සම්පූර්ණයෙන්ම නැවැත්තුවා. සිංගප්පූරු වෙළඳ පොළේ flat rate එකට ගෙන්නුවා. ගැහුවා බදු. මොකද, මේ ඛනිජ ක්ෂේත්‍රයේ තිබෙන, රවුමක් ගිහිල්ලා එනකොට ඛනිජ තෙල් දැවැන්ත ලාභයක් ක්ෂණිකව ලැබෙනවා. කෑෂ්වලට තමයි මේ බිස්නස් එක කරන්නේ. බදු එකතු කිරීමේ මාධ්‍යයක් විධියට පාවිච්චි කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

IOC එක.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මම කියන්නම්. මෙන්න මේ විධියට තමයි බදු එකතු කිරීම සම්බන්ධව මැදිහත් වෙන්නේ. ඇයි මේ කඩිමුඩියේ මේක වැඩි කරන්නේ? එක පැත්තකින් භාණ්ඩාගාරයේ බංකොලොත්භාවය වහගන්න දොස්තරවරුන්ට, ඉංජිනේරුවන්ට, මේ රටේ රාජ්‍ය සේවකයන්ට පඩි දෙන්න බැරි අසරණ තත්ත්වයට පත් වුණු, කෙටි කාලීනව මුදල් එකතු කිරීමේ මාධ්‍යයක් විධියට වැඩි කරනවා. අනෙක් පැත්තෙන් IOC සමාගම රජයට බලපෑම් කරනවා තමන්ට බදු මිල වැඩ කර ගැනීමේ උවමනාව මත. රජයට බලපෑම් කරනවා ලෝක බැංකුව හරහා ඇයි මිල සූත්‍රයක් ගේන්නේ නැත්තේ? කියලා. ආණ්ඩුවට බැලපෑම් කරනවා වැඩි කරහල්ලා කියලා. මොකද, ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ කීර්ති නාමය ඉතාමත් බරපතළ තත්ත්වයන් යටතේ හරි ආරක්ෂා කරගෙන හිටියා. මේ කීර්ති නාමය නිසාම CPC ෂෙඩ්වලට වැඩි ජනතාවක් ඇදෙන නිසාම IOC කාරයෝ ඉන්ධන මිල වැඩි කළාම මේ CPC එකට විශාල වාසියක් එනවා. මේ වාසිය බලාගෙන ඉන්න බැරි බහුජාතික සමාගම් ඉන්දියාව මගින් ආණ්ඩුවට බලපෑම් කරනවා. ඛණිජ තෙල් සංස්ථාවේත් මිල වැඩි කරහල්ලා කියලා. මෙන්න මේක සම කරන්න තමයි, ලෝක වෙළඳ පොළේ තිබෙන තෙල් මිල නිසා නොවෙයි, ඇත්තටම මේ සම කිරීමයි භාණ්ඩාගාරය මුහුණ දීලා තිබෙන බරපතළ ආර්ථික බංකොලොත්භාවය වහ ගන්න තමයි මේ තෙල් මිල වැඩි කළේ කියලා මම සංඛ්‍යා ලේඛන අනුවම ඉදිරිපත් කරනවා.

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා සාධක අනුව පැහැදිලි කළා. ඒ පැහැදිලි කිරීමේදී එක කාරණයක් කියැවුණා. මේ රටේ නිදහස් අධ්‍යාපනය දෙන්න, නිදහස් සෞඛ්‍ය දෙන්න, පාසල් හදන්න, පුටු හදන්න ඇත්ත තමයි රටේ භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් වෙන්න ඕනෑ. මුදල් නැත්නම් මොකද කරන්නේ? නිදහස් අධ්‍යාපනය කඩා වැටෙයි. ඒ වාගේම අනෙක් පැත්තෙන් සෞඛ්‍ය. උපකරණ ටික ගෙන්වන්න, බෙහෙත් හේත් ගෙන්වන්න සෞඛ්‍යයටත් මුදල් ඕනෑ. ඒ මුදල් හොයා ගන්නද මේ වැඩේ කළේ? මම ඒකත් පැහැදිලි කරන්නම් ඒ මුදල් සොයා ගන්නද කියලා. ඔබ දන්නවා මේ රටේ පොදු වෙළඳ පොළෙන් තෙල් ගෙන්නද්දී අනුගමනය කරන ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමය තමයි ටර්ම් ටෙන්ඩර්ස් දානවා. වාරිකව යම් කාල පරිච්ඡේදයකට තෙල් ගෙන්වීම සඳහා තෙල් ගෙන්වන අයගෙන් tender call කරනවා. ඒකට තමයි term tenders කියන්නේ. ඒ වාගේ shipment 23 කට තෙල් ගෙන්වීම සඳහා tender call කරනවා. 2017.06.01 වැනිදා තමයි tender call කරන්නේ. ඒ ටෙන්ඩර් එක close කරනවා 2017.07.12 වැනිදා. ඊට පස්සේ මේ ටෙන්ඩර් එකට TRC approval එක ලැබෙනවා 2017.07.27 වැනිදා. ඊළඟට ජාත්‍යන්තරව මේ ටෙන්ඩර් එකට තාක්ෂණික සැපයුම ඕනෑ. ඒ සම්බන්ධව SACATC කියන ආයතනයෙන් approval එක ගන්නවා අගෝස්තු මාසෙට කලින්. දැන් ටෙන්ඩර්කරුවෝ හරි. තාක්ෂණික මෙහෙයුම හරි. ඒ ටෙන්ඩර්කරුවා මගින් තෙල් ටික රට ඇතුළට ගෙන්න ගන්නවා. ඒ තෙල් ටික ගෙන්න ගත්තොත් ඒ තෙල් ටිකට යන වියදම මම කියන්නම්. CPC එකට යන වියදම. ඒ වියදම සම්පූර්ණයෙන්ම එනවා. මම මේ ඩොලර්වලින් කියන්නේ හතළිස් දෙකෝටි හැට තුන් ලක්ෂ තිස් හත් දහස් හාරසිය හතළිස් හතරක් යනවා. මේ term tender එකෙන් ගෙන්න ගත්තොත්. හැබැයි term tender එකෙන් ගෙන්න ගන්න ඇමැතිතුමා කටයුතු කරන්නේ නැහැ. ඊට පස්සේ term tender එක දියාරු වෙන්න ඇරලා වෙනම ස්පෝර්ට් ටෙන්ඩර්වලින් ඒ මොහොතේදී ගැනුම්කරුවා සොයාගෙන, ගෙන්වීම සඳහා මිල ගණන් කැඳවන්නේ නැතුව ගෙන්වනවා.

ඒ නිසා සංස්ථාවට සිද්ධ වෙනවා, ඩොල්ර්වලින් ගත්තොත් US ඩොල්ර් පනස් එක්කෝටි අනූ දෙලක්ෂ පනස් දෙදහස් නවසිය අනූ අටක වියදමක් දරන්න. ටර්ම් ටෙන්ඩර් නැතුව spot tender වලින් ගෙන්වන්න කටයුතු කිරීම නිසා. ඩොලර්වලින් ගත්තොත් එහෙම මොකක්ද වෙනස? ඩොලර් නව කෝටි විසි නව ලක්ෂ පහළොස් දහස් පන්සිය හතළිස් හතරක් වැඩිපුර යනවා term tender වලින් නැතුව spot tender වලින් ගෙන්වීම නිසා. මොකද, ගෙන්වන්න බලාපොරොත්තු වුණු පුද්ගලයාටත් දෙනවා. ඒ පුද්ගලයා අපට තොරතුරු ටික දෙනවා. ඒ පුද්ගලයාට ටෙන්ඩර් ටික හරි. අවමානය වහ ගන්න එයාටත් කියනවා ගෙන්වන්න කියලා. එයා කියනවා ඉස්සර ගණන්වලට ගෙන්වන්න බැහැ මහත්තයෝ. දැන් අලුතෙන් ගෙන්වනවා නම් මෙන්න මිල ගණන්. දැන් ලෝක වෙළඳ පොළේ මිලත් එක්ක වෙනසයි, මට ටෙන්ඩරේ දුන්නා නම්

[ගරු අසෝක සපුමල් රන්වල]

මම ගෙන්වනවා shipment විසි තුනයි ගණනයට. දැන් එහෙම ගෙන්වන්න බැහැයි කියලා ඔහුත් මිල වැඩි කරනවා තමන්ට ඕනෑ විධියට. අනෙක් ටෙන්ඩර්කාරයොත් මිල වැඩි කරනවා තමන්ගේ හිතවතුන්, ඥාතීන්, අසල්වාසීන්. ඒක නිසා මිල වැඩි කරගෙන තමන්ට ඕනෑ විධියට ගෙන්වීම නිසා අවසානයේ US ඩොලර්ස් නව කෝටි විසිනව ලක්ෂ පහළොස් දහස් පන්සිය හතළිස් හතක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩිපුර වියදම් වෙනවා මේ ස්පොට් ටෙන්ඩර් ක්‍රමය නිසා. ඊළඟට මේක ශ්‍රී ලංකා රුපියල්වලට convert කළාට පස්සේ කෝටි එක්දහස් හාරසිය විසි එකයි, ලක්ෂ හැටයි, හැත්ත නව දහස් හත්සිය හැත්තෑ පහක්. බිලියන 14.2 ක්. මිලියන නොවෙයි. බිලියන 14.2 ක් ලංකාවේ ආණ්ඩුවට පාඩු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට ඉදිරිපත් කරනවා දැන් කොහොමද ඒ ඉතුරු කර ගත්තු මිල වැඩිවීම තුළ නිදහස් අධ්‍යාපනයට භාණ්ඩාගාරයෙන් සල්ලි වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා නම් මේ සල්ලි යටි පාරේ ගිහිල්ලා බිලියන 14.2 ක් 2018 දී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට පාඩු වෙනවා. හොඳයිද වැඩේ? බරපතළ අසාධාරණයක්. මේ මිල වැඩි කරලා ඒ ගත්තු මුදලින් ඛණිජ තෙල් සේවකයාගේ පඩි වැඩි කරන්නේ නැහැ. ඛණිජ තෙල් ෂේත්‍රයේ තාක්ෂණික දේවල් කරන්නේ නැහැ. US ඩොලර්ස් 99 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ 99 තවම පිරිපහදු යන්ත්‍රාගාරය නවීකරණය කරන්න භාවිතා කළේ නැහැ. 2002, 2003 වර්ෂයේදී. ඒ අසල්වැසි ආණ්ඩුව විසින් කරපු බරපතළ අගතිගාමී වැඩක්. තෙල් සංස්ථාව තුනකට කඩලා, හරකාගේ ඉස්සරහායි, පස්සයි වෙන් කරනවා වාගේ එක පැත්තක් දුන්නා තෙල් බෙදා හැරීම. අනෙක් පැත්ත තෙල් විකිණීම. මෙන්න මේ විධියට දීලා එක පැත්තකින් IOC එකට දෙනවා. කෑලි තුනකට කඩලා. තෙල් සංස්ථාව සතු දේපළ, ඉන්දියානු ඔයිල් සමාගමට දෙන තෙල් ටැංකි ටික මේ ඔක්කෝම කරන්නේ මේ රටේ ජනතාවට ආදරයෙන් නොවෙයි. මාරුවෙන් මාරුවට ආපු ආණ්ඩු, මාරුවෙන් මාරුවට ආපු අනුරුද්ධ රත්වත්තේ ඇමැතිතුමා, ඒ වාගේම ෆවුසි ඇමැතිතුමා, ඒ වාගේම සුසිල් ප්‍රේමජයන්ත ඇමැතතුමා, ඊට පස්සේ චන්දිම වීරක්කොඩි ඇමැතිතුමා, දැන් අර්ජුන රණතුංග ඇමැතිතුමා, මේ රටේ ජනතාවට ආදරය කරන මිනිස්සු විධියට මේවා නතර කරලා කටයුතු කරන්න මැදිහත් වෙලා නැහැ. ඒක නිසා මේවා බරපතළ ප්‍රශ්න. මේ රටේ ජනතාව මත සම්පූර්ණ පීඩනය දාලා, මේක ජනප්‍රිය සටන් පාඨයක් නොවෙයි. අපි මේක විවාදයට ගත්තේ කැලණි ගඟ සම්බන්ධව ඉදිරිපත් කරලා තිබුණු දූෂ්‍යාකරණය සම්බන්ධ එකක් කල් තියලා. ඒ වෙලාවේදී මම ගෙනාපු යෝජනාවට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම දීර්ඝ ලෙස සාකච්ඡා කළා. අපි එකඟ වුණා. මේ කැලණි ගඟේ ප්‍රශ්නයට වඩා බරපතළ ප්‍රශ්නයක් තමයි මේ ඛණිජ තෙල් ප්‍රශ්නය. ඛනිජ තෙල් මිල වැඩිවීම කියන්නේ ජනප්‍රිය සටන් පාඨයක් නොවෙයි. මේ රටේ ජනතාව තුළ උඩුදුවපු, නැවත මේ රටේ ජනතාව ගොඩ නඟන්න බැරි විධියට විනාශ කරපු දෙයක් බවට පත් වෙලා තිබෙනවා.

ඒක නිසා අපි ඔබතුමා මගින් රජයට ඉදිරිපත් කරන්නේ මේ ශෝචනීය තත්ත්වයට අපේ රටේ ජනතාව තවදුරටත් ගොදුරු කරන්න එපා. මේ ගොදුරු කිරීම තුළ අපට උරුම වෙලා තිබෙන්නේ දීන ජාතියක් බවට පත් වෙන්න. නැව්වලට පාවෙන දේවල්වලට කෝල් දාලා ස්පොට් වෙළඳ පොළෙන් නොවෙයි ගන්නේ. ලංකාව වටේම මුහුදේ නැව් පාවෙනවා. මේ නැව් එක්ක ඩීල් යනවා. මන්ත්‍රීවරුන්, ඇමැතිවරුන් ඔය අර්ජුන ඇලෝෂියස් කියන්නේ පුංචි එකක් විතරයි. තෙල් Industry එකේදී තෙල් ලීටරයකින් එක රුපියලක් තිබුණොත් මහ දැවැන්ත බිලියන ගණන්, මම පෙන්නලා දුන්නේ. බිලියන 14.2 ක පාඩුවක් සිද්ධ වෙනවා ස්පොට් ටෙන්ඩරයයි, සාමාන්‍ය ටෙන්ඩරයයි අතර වෙනස තුළ. ඒක නිසා මේ තෙල් කියන්නේ මේ රටේ දැවැන්ත ජාවාරමක් බවට පත් වෙලා තිබෙනවා. ඒක රිසි ලෙස ජනතාවගෙන් සූරා කනවා. හරියට ජනතාවගේ ලේ උරා බොනවා වාගේ වැඩක් තමයි කරන්නේ. මේ මාෆියා එකක්. සියලු ඇමැතිවරුන්ට ඉතාමත් පැහැදිලිව කියනවා ඛණිජ තෙල් ක්ෂේත්‍රයට නායකත්වය දුන්නු සියලු ඇමැතිවරුන් මේ ඛේදවාචකයට වග කියන්න ඕනෑ. පිරිපහදුව විනාශ කරලා, කෑලි තුනකට කඩලා, තෙල් ටැංකි ටික දීලා අර පැත්තෙන් මුහුදේ නැව් ටික ගෙනැල්ලා තෙල් ගහන්න බංකරින්වලට තිබුණු, හාබර් එක ඇතුළෙ තිබුණු තෙල් ටැංකි ටික CPC එකේ හාබර් එකත් එක්කම චීනයට පූජා කළා. මෙන්න මේ කටයුතු කරමින් මේ රටේ ජනතාවට මේ ශෝචනීය තත්ත්වය උදා කරන සියලු ඇමැතිවරුන් එක්සත් ජාතික පක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, සන්ධානයේ මාරුවෙන් මාරුවට කළේ

මේ ජාවාරමයි. මේ ජාවාරම නැවැත්විය යුතුයි. නවත්වන්න මැදිහත් විය යුතුයි. ඒ නිසා සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා ඛණිජ තෙල් මිල අඩු කරන්න කියලා කෑගහන්නේ ජනප්‍රිය සටන් පාඨයක් නිසා පමණක් නොවෙයි. මීගමුවේ ධීවරයෝ කළු කොඩි දාලා අද ධීවර ගමන් ගියේ නැහැ. මුහුද රළු නිසා නොවෙයි ගමන් ගියේ නැත්තේ. ඔවුන් විරෝධය පාමින් අද දැවැන්ත විරෝධතාවයක. ඒක නිසා මේක සාමාන්‍ය සටන් පාඨයකට එහාට ගිහිල්ලා මේක ඇතුළේ තිබෙන ආර්ථික හරය, ආර්ථික මූලයෙන් අල්ල ගන්න ඕනෑ, ඇත්ත පදනම සොයා ගන්න. ඒ සම්බන්ධව මැදිහත් වීමක් කරන්න කියලා ඉල්ලා සිටිනවා මේ සභාවෙන්. ඒ වාගේම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගෙනාපු යෝජනාව ඉතාමත් සාධාරණීය සාධාරණ යෝජනාවක් කියලා මම විශ්වාස කරනවා. එතුමාට ස්තුතිය පුද කරනවා මේ යෝජනා සම්බන්ධව. මම අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම ස්තුතිය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. දීර්ඝ විස්තරයක් කළා. මම හිතන්නේ දැනුවත් කිරීමක් කළා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට බොහොමත්ව ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති පොතේ රීති ඔක්කෝම වෙනස් කරලා රීතිවලට යනවා නම්, පෞද්ගලික පැහැදිලි කිරීම්, වරප්‍රසාද ප්‍රශ්න ඔක්කෝම පිළිවෙළට නේ යන්නේ. ඒ නිසා අපිත් මතක් කරනවා 16(1) යටතේ මේ සභාවේ ගණපූරණයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනීගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති විය.***
*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, a Quorum being present.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ ගණපූරණය සම්පූර්ණ වූ බැවින් පිළිතුරු කථාව සඳහා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා.11.29]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව මම ගියවර සභාවේදී රීති අත්හිටුවීමේ යෝජනාවක් හැටියට ගෙන ආවේ. ඒ යෝජනාව ගෙනාපු අවස්ථාවේදීත් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය මතු වූ නිසා තමයි අද මේ සභාවට ආවා. දැන් මෙහෙමයි අපේ සභාවේ වුණත් එක එක මන්ත්‍රීවරු කැමැති සංවේදී කාරණා තිබෙනවා. ඉතින් ඒක නිසා මම හිතන්නේ, මේ යෝජනාවට එපමණ සංවේදී කමක් මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමාගේ එදා තිබුණේ නැහැ. පාතාලයේ මැර තර්ජන සම්බන්ධ මොකක් හරි යෝජනාවක් තිබුණා නම් එතුමා ඔය ගණපූරණය සම්බන්ධ ප්‍රශ්නය අදින්නේ නැහැ. ඉතින් ඒක නිසා එතුමාට මේ තෙල් මිල සම්බන්ධව එපමණ සංවේදී කාරණාවක් නොවෙයි. එතුමා ඒ සම්බන්ධව මතු කළා. ඒක නිසා අපට මේ යෝජනාව දාලා එදා ගෙදර යන්න වුණා. අද මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මතු කළේ ඊට වඩා වෙනස් එකකට. අපට ඒක තේරුණා. අපට තේරුණා වෙනත් දෙයක් මතු කළා. නමුත් එදා වුණේ ඒකයි. ඉතින් මේ යෝජනාව සම්බන්ධව එදා මම පිළිතුරු කථාව කළා නම් ඒ පිළිතුරු කථාව කරන්න තිබුණු තත්ත්වය දැන් මගේ ටිකක් වෙනස් වෙලා තිබෙන්නේ. ඒ වෙනස් වුණාට අනිවාර්යයෙන්ම උත්තර දෙන්න ඕනෑ කාරණා ටිකක් තිබෙනවා. මේ යෝජනාව සම්බන්ධව කොයි පැත්තකින් හරි කථා කරපු මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය පුද කරනවා. ඒ මොන කාරණාව ඇතුළේ හරි අපේ මේ යෝජනාවට ප්‍රතිවිරුද්ධව අදහස් දැක් වූ ඒවා ඇතුළේත් මේ යෝජනාව තහවුරු කරන්න, මෙවැනි යෝජනාවක් සාකච්ඡාවට ලක් වෙන්න ඕනෑ කියන අදහස තමයි ආවේ. මට ඇත්තටම පහසු වුණා අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කළාට පස්සේ. ඒක නිසා මගේ කථාව අඩු කරන්න පුළුවන්. එතකොට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා උද්සෝෂණ කරලා තෙල් මිල අඩු කරන්න බැහැයි කියලා. ඒ කියන්නේ එහෙම ඕනෑ නැහැ. මේක කථා කරන්න ඕනෑ නැහැ. මොකද, අපි උද්සෝෂණය

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

කරනවා නේ? මේ කථා කරනවා විතරක් නොවෙයි. ඒ නිසා උද්ඝෝෂණ කරලා තෙල් මිල අඩු කරන්න බැහැ. එහෙම වෙන්නත් පුළුවන්. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක අපේ ඩියුටිය. අපි ආණ්ඩු කරන්නේ නැහැ. ඒ නිසා ජනතාවගේ පැත්තෙන් මෙවැනි ප්‍රශ්නයක් ආවට පස්සේ ඒක ප්‍රශ්නයට අදාළ නම්, ඒක මේ පළාත් සභාවේ සාකච්ඡා කරන එක නම් අපේ ඩියුටිය, ඒ වාගේම උද්ඝෝෂණය කරන එකත් අපේ ඩියුටිය. ඒ වාගේම එතුමා කියනවා නම් ඒක හරහා කිසි දෙයක් වෙන්නේ නැහැ කියලා. ආණ්ඩුවට කිසි බලපෑමක් නැහැයි කියලා. ඒක එහෙම නොවෙයි ගරු මන්ත්‍රීතුමා. මේවායේ බලපෑම තිබෙනවා. ඒ විතරක් නොවෙයි. උදාහරණයක් විධියට ගත්තොත් එහෙම උද්ඝෝෂණය කරලා රටවල්වල ආණ්ඩු පෙරළලා තිබෙනවා. බඩු මිල අඩු කරනවා නොවෙයි. ආණ්ඩු පෙරළිලා තිබෙනවා. පසුගිය කාලයේ ටියුනීෂියාවේ ආණ්ඩුව පෙරළුවේ මිනිස්සු උද්ඝෝෂණය කරලා තමයි. ඊජිප්තුවේ ඒ මුබාරක්ලා ගෙදර යැව්වේ උද්ඝෝෂණය කරලා තමයි.

ඒ නිසා ඔබතුමාගේ පැත්තෙන් ඇත්තටම දැන් මම දන්නවා, මගේ යෝජනාවේ තිබෙනවා පැවති හා පවතින ආණ්ඩු. පැවැති හා පවතින ආණ්ඩු කිව්වාට පස්සේ මෙතැන එකක් තමයි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා පැවැති එකටත් වග කියන්න ඕනෑ. පවතින එකටත් වග කියන්න ඕනෑ. මේ දේශපාලන ඉතිහාසයේ අපි දැකලා තිබෙන්නේ, කවදත් ආණ්ඩුව තුළ ඉන්නේ සෞම්‍යමූර්ති තොණ්ඩමාන්න මහත්තයාලා තමයි. ආණ්ඩුව කොතැනද? තොණ්ඩමාන් එතැනය. අපි දැකලා තිබුණේ එහෙමයි. දැන් ඒක වෙනස් වෙන්න ඕනෑ. ආණ්ඩුවක් කොතැනද? එතැන නිශාන්ත ශ්‍රී වර්ණසිංහලා ඇත. එතුමන්ලාට අපි මේ කරන යෝජනා ඇතුළේ මොකක්ද හරි චෝදනාවක් මතු වෙනවා නම් ඇත්තටම එතුමන්ලාට හදවතට දැනෙනවා. ඇයි? පැවැති ආණ්ඩුවලටත්, පවතින ආණ්ඩුවලටත් එතුමන්ලා වග කියන්න ඕනෑ. ඒ නිසා මට හිතෙන්නේ, එතුමාට එහෙම එකක් දැනෙනවා. දැන් මේකේ බලන්න කෝ? මෙතැනින් එළියට ගියාට පස්සේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ රටේ ආණ්ඩුව නියෝජනය කරනවා. දැන් මේ බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුව UNP නොවෙයි නේ? හැබැයි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මෙතැන ආණ්ඩුවට වග කියන්න ඕනෑ. ඉතින් හරි නේ මම කියන එක. ආණ්ඩු කොතැනද? නිශාන්ත ශ්‍රී වර්ණසිංහලා එතැන ඇත. හරි පැහැළියි නේ?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

හොඳයි නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි මතු කරන්නේ. ඔබතුමියලාට පොඩි වේදනාවක් එනවා නම් එක සාමාන්‍ය දෙයක්.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඒවා අපි ගණන් ගන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි. ඉතින් ඒ නිසා එතුමාගේ කථාවේදී මතු වුණා රටක් දියුණු වෙන්න ඕනෑ නම් තෙල් මිල, ගෑස් මිල වැඩි කරන්න ඕනෑ. දැන් මේකට උත්තරය ආවා. අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා මේක බොහොම හොඳින් පැහැදිලි කළා. මේ තෙල් මිල වැඩි වෙන්න හේතුව මොකක්ද කියලා. ඒ පැත්තෙන් බලන කොට ඒක හරියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස් කොන්දොස්තරයි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහයි දෙන්නම එකයි. බස් කොන්දොස්තර කියන්නේ මොකක්ද? බස් කොන්දොස්තර කියන්නේ බස් එකේ යනවා නම් තැලෙන්න පොඩි වෙන්න ඕනෑ. පෞද්ගලික වේවා, ලංගම වේවා බස් එකේ කවුරු හරි කියනවා නම් කකුල් පාගනවා අරවා මේවා කියලා අකමැති ප්‍රතිචාරයක් එනවා නම් බස් කොන්දොස්තර මොකක්ද කියන්නේ? කොන්දොස්තර කියනවා තැලෙන්න පොඩි වෙන්න බැරි නම් ඔයා ටැක්සියක් අරගෙන යන්න. ඒ කොන්දොස්තර කියන්නේ තැලෙන්න පොඩිවෙන්න බැරි නම් මේ බස් එකේ නඟින්න එපා. කකුල පාග ගන්න අකැමැති නම්, මිරිකෙනවාට අකමැති නම් මේකේ නඟින්න එපා. ඒකයි කොන්දොස්තර මහත්තයා කියන්නේ. ඒකත් හරියට ඒ වාගේ. මට දැනුනු දේ මම කිව්වේ. ඉතින් ඒක නිසා නිශාන්ත ශ්‍රී වර්සිංහ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරපු දේශපාලන කාරණා ටික පිළිගන්නේ නැතුව නොවෙයි. ඒවා ගැන අපි හිතන්න ඕනෑ. මොකද, එතුමන්ලා ආණ්ඩුවක් හැටියට හිතන්නේ. ඒක නේ මම කිව්වේ. ආණ්ඩුවක් හැටියට කල්පනා කරලා ඒවා තිබෙන්නේ. නමුත් ආණ්ඩුවක් හැටියට හිතන්න ඕනෑ ඊට වඩා වෙනස්. මේ රටේ මහජනතාව වෙනුවෙන් පත් වුණු ආණ්ඩු. මධ්‍යම

ආණ්ඩුව වේවා, පළාත් සභා ආණ්ඩුව වේවා. ඒකයි මට මතු කරන්න උවමනාව තිබුණේ.

ඊට පස්සේ මේ යෝජනාව සම්බන්ධව කථා කරපු රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය අද නැහැ. මෙතැන නැහැ. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ කථාවේදී එතුමිය බොහොම ග්‍රාම්‍ය වචනයක් පාවිච්චි කළා. කරන්න දෙයක් නැහැ මටත් ඒ වචනය පාවිච්චි කරන්න වෙනවා මේක කියන්න. මොකක්ද රෝස් මන්ත්‍රීතුමිය පාවිච්චි කළේ. රෝස් මන්ත්‍රීතුමිය පාවිච්චි කළා ජනතා විමුක්ති පෙරමුණ ඕන පඩයකට යෝජනා ගේනවා කියලා. පඩයක් කියලා කිව්වේ. ඒක හරි ග්‍රාම්‍යයි. නමුත් එතුමිය ඒක පාවිච්චි කළා නේ? ඒ නිසා මටත් කරන්න දෙයක් නැහැ. මමත් අකමැත්තෙන් හරි ඒක පාවිච්චි කළා. ඒ නිසා දැන් මේක ඒ ජාතියේ පඩයක්ද? එතුමිය කියන්නේ JVP එක ඔහොම තමයි. JVP එක ඔය ජාතියේ පඩවලට උද්ඝෝෂණය කරනවා. ඔය ජාතියේ පඩවලට යෝජනා ගේනවා කියලා. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රනිල් වික්‍රමසිංහ මහත්තයා අධ්‍යාපන ධවල පත්‍රිකාව ගේන කොට අපි පාසල්වල. අපි ශිෂ්‍යයෝ විධියට එළියට බැස්සා. එළියට බැහැලා උද්ඝෝෂණය කරලා තමයි ඒ අධ්‍යාපන ධවල පත්‍රිකාව අපි නතර කර ගත්තේ. ඒක වෙන විධියකට ක්‍රියාත්මක වුණා. ඒක හරි. නමුත් ඒ වෙලාවේ අපි ශිෂ්‍යයෝ හැටියට එළියට බැස්සා. එතකොට එදා ඒ අධ්‍යාපන ධවල පත්‍රිකාව රෝස් මන්ත්‍රීතුමිය කියන විධියට අර ජාතියේ එකක්. ඊට පස්සේ ඉන්දු - ලංකා ගිවිසුම. අපි උද්ඝෝෂණය කළා. රටේ ජනතාව උද්ඝෝෂණය කළා. අපි ඒවා මෙහෙයවුවා. එතකොට ඒකත් ඒ ජාතියේ එකක්. ඒවාට තමයි අපි මේ උද්ඝෝෂණය කරලා තිබෙන්නේ. ඒ වාගේම 2002 රනිල් වික්‍රමසිංහ ප්‍රභාකරන් එක්ක ගිවිසුමක් ගහලා යනකොට අපි නුවර ඉඳන් කොළඹට පයින් ආවා. ගාල්ලේ ඉඳන් කොළඹට පයින් ආවා. පයින් ඇවිල්ලා ආණ්ඩු පෙරළුවා. ඒකත් රෝස් ගරු මන්ත්‍රීතුමිය කියනවා වාගේ ඒ ජාතියේ. නැහැ. අපට එහෙම නම් ඒ ජාතියේ ඒවා අල්ලන්න ගොඩක් දේවල් තිබෙනවා. එතුමිය කියන ජාතියේ දේවල් ඕනෑතරම් තිබෙනවා. ඇත්ත මේ රටේ මිනිස්සු මුහුණ දෙන ප්‍රශ්න. ඒවාට අපි අපේ පැත්තෙන් අපේ ඩියුටිය කරන්න ඕනෑ. ඊළඟට හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා කිව්වා ඇත්තටම ජනතා විමුක්ති පෙරමුණට තිබෙන්නේ යෝජනා ගේන්න නොවෙයි. මගේ හිතවත් ගෙවල් පැත්තේ මන්ත්‍රීතුමා. නමුත් එතුමා කියපු කාරණාවේදී එතුමා කියන්නේ අපට තිබෙන්නේ මේවාට යෝජනා ගේන්න නොවෙයි. අපට තිබෙන්නේ මේවා වෙනස් කරන්න පුළුවන් යෝජනා මෙතැනට ගේන්න. කොහොමද කරන්නේ කියලා? ඒකට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දේශපාලනික උත්තරයක් තිබෙන්නේ. ඒක අපි දේශපාලනිකව හඳුනාගෙන තිබෙනවා. අද අපේ රට අරාජිකත්වයට ගිහිල්ලා තිබෙන්නේ. එතුමා එහෙම අහිංසකව හිතන එක හරි. එතුමා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉඳන් තවමත් විශ්වාස කරනවා මේ තත්ත්වයන් වෙනස් කරගන්න පුළුවන් කියලා. අපි හොඳට තේරුම් අරගෙන තිබෙනවා ඒ තත්ත්වයන් වෙනස් කරන්න බැහැයි කියලා. ඒ නිසා අද අපේ රට ගිහිල්ලා තිබෙන්නේ අරාජිකත්වයට. අද මේ රටේ ධනේශ්වර දේශපාලන පක්ෂ දෙකම බංකොලොත් වෙලා තිබෙන්නේ. ඒ ධනේශ්වර දේශපාලන පක්ෂ දෙකම වැටිලා තිබෙන්නේ. ඒ ධනේශ්වර දේශපාලන පක්ෂ දෙකටම මේ කිසිදු ප්‍රශ්නයකට උත්තර නැති වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අරාජිකත්වයක් නිර්මාණය වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමා කථා කරන හැම වචනයක් ගාණේම රටේ මිනිස්සුන්ට දැනෙන්නේ මේ මිනිහා ජනාධිපති කියලා දැනෙන්නේ ඕකත් එක්ක. හත් දෙයියනේ මේ ජාතියේ ජනාධිපති කෙනෙක්ද ඉන්නේ කියලා හිතෙන්නේ අන්න ඒකත් එක්ක.

ඒ වාගේම රටේ ආණ්ඩුවක් නැහැ නේ කියලා හිතෙන්නේ ඒකත් එක්ක. අන්න ඒ අරාජිකත්වයට අපේ රට ඇවිල්ලා තිබෙන්නේ. අපට එතැනින් එහා කල්පනා කරන්න තිබෙන්නේ මෙන්න මේ අරාජිකත්වය වෙනස් කරගන්න ලෝකයේ වේවා, අපේ රටේ වේවා වමේ ව්‍යාපාරයට ලොකු කාර්ය භාරයක් තිබෙනවා. ඒ වම අපි නියෝජනය කරන්නේ. අපටත් තිබෙනවා අපි ඒ කාර්ය භාරය ඉෂ්ට නොකළොත් මේ රට යන්නේ පැසිස්ට්වාදයට. එවැනි පැසිස්ට්වාදයකට තමයි අපේ රට ගමන් කරමින් තිබෙන්නේ. අපි දන්නේ නැහැ අද ජනතාව සමහරක් ඔය පැසිස්ට්වාදී ලක්ෂණ සහිත නායකයෙක් හරි කමක් නැහැ රටේ බලයට එන්න ඕනෑ කියන තැනට රට ගමන් කරන්නේ ඔන්න ඕකත් එක්ක. ඒක මේ තිබෙන තත්ත්වයට වඩා අන්ත භයානකයි. අන්ත භයානකයි කියලා කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ පැසිස්ට්වාදයට JVP ඒකේ අපි භය වෙලා නොවෙයි. ඔයිට වඩා පැසිස්ට්වාදීන් එක්ක අපි හැප්පිලා තිබෙනවා. අපට නොවෙයි භය තිබෙන්නේ. හැබැයි රටක් විධියකට අපට භයක් තිබෙනවා ඔන්න ඔය පැසිස්ට්වාදයට රට ගමන් කළොත් එහෙම මීට වඩා දරුණු

[ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි]

වුණු රටක තමයි අපට ජීවත් වෙන්න සිද්ධ වෙන්නේ. අන්න ඒ පැසිස්ට්වාදයෙන් අපි වෙනස් කර ගන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

2020 ට බය වෙලාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම කියන්නේ ඇත්තටම බය වෙන්න ඕනෑ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. ඒක බයක් නොවෙයි. මේක දේශපාලනිකව හඳුනගන්න ඕනෑ. ඕනෑම රටක් - අපේ රටේ හිට්ලර් කොහොමද ඇති වුණේ? මුසලෝනිලා ඇති වුණේ කොහොමද? මේ සියලුම පැසිස්ට්වාදී නායකයින් මතු වුණේ මෙන්න මේ වාගේ ඇති වුණු අරාජිකත්වයක් එක්ක. ඒක පුද්ගලිකව අපට තිබෙන බයක් නොවෙයි ඒකේ තිබෙන්නේ. පොදුවේ රටක ප්‍රජාතන්ත්‍රවාදයට තිබෙන බයක් තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පාඨලී චම්පික නේ එන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පුද්ගලයා ගැන නොවෙයි මම මේ කියන්නේ. එන පුද්ගලයා කවුද කියන එක නොවෙයි මම කියන්නේ. හැබැයි වඩා ඉඩකඩ රටක තිබෙන්නේ - දැන් ඔබතුමා ඔබතුමාගේ ආසනයේ කිහිප දෙනෙක් අල්ලගෙන කථා කරන්න, ඒ අයගේ උත්තරය මොකක්ද කියලා. ඒ ගොල්ලෝ කියන්නේ, කමක් නැහැ. මොකෙක් හරි කමක් නැහැ. ඒකාධිපතියෙක් හරි මේකේ බලය ගන්නයි දැන් ඕනෑ කියලා කියයි. ඒ තත්ත්වය අන්තිම භයානකයි. අන්න ඒ පැසිස්ට් වාදයට තමයි අද ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය කියලා කියන්නේ ආර්ථික කළමනාකාරීත්වය ගැන උපාධි පිට උපාධි ගහපු මිනිස්සු ඉන්න තැනක්. උපාධි පිට උපාධි ගත්ත අය. ඒ අය එක වෙලාවක කිව්වා, ආර්ථික කළමනාකාරීත්වය තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ කියලා. අන්න ඒ එක්සත් ජාතික පක්ෂය ඇතුළේ, ඒ අය කියන්නා වූ පරිදි ආර්ථික කළමනාකාරීත්වය තිබෙනවා කියන එක ඇතුළේ අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා නම් අර කොස්තා ගරු මන්ත්‍රීතුමා කියන විධියට අපට පුළුවන්ද යෝජනා කරලා, ඒවා වෙනස් කරන්න. එහෙම වෙනස් කරන්න බැහැ. ඒක නිසා තමයි ඇත්ත අපට උවමනාවක් වෙලා තිබෙන්නේ අපේ ඩියුටිය හරියට කරන්න. ඒ නිසා තමයි අපි පළාත් සභාවේත්, පාර්ලිමේන්තුවේත්, පිටතත් කොතැනත් අපේ රාජකාරිය අපි කරන්නේ. ඒ වෙනුවෙන් අපි සමාජ මතය ගොඩනගනවා. ඒ නිසා අපි කියනවා, මේ යෝජනාව හරහා ආණ්ඩුව කළ යුත්තේ - තෙල් මිල අඩු කරන්න පුළුවන්. අද මේ මොහොත වන විට මේ යෝජනාව සති දෙකකට ඉස්සෙල්ලා ගේනවාටත් වඩා ලෝක වෙළඳ පොළේ තෙල් මිල අඩු වෙලා තිබෙන්නේ. ඒක නිසා අර අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ ඔන්න ඔය තෙල් මාෆියාව නැති කරලා ආණ්ඩුවක් හැටියට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නවා නම් අද අපේ රටේ මිනිස්සුන්ට මේ තෙල් මිල නිසා, ගෑස් මිල නිසා ඇති වෙලා තිබෙන පීඩනය වෙනස් කරගන්න පුළුවන්. ඒක නිසා තමයි මේ යෝජනාව ගේන්නේ. ඒ නිසා තමයි මේ යෝජනාව තියෙන්නේ. ඔන්න ඔය දේ රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට, මධ්‍යම ආණ්ඩුවක් හැටියට ඉෂ්ට කරන්නය කියලා කියන්නේ. ඉතින් ඒක නිසා මේ සම්බන්ධව අදහස් දක්වපු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තූතිය පුද කරමින් මම අවසන් කරනවා. ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තූතියි. ඔබතුමා ගෙනෙන ලද යෝජනාව බොහොම පැහැදිලි වුණා. එම යෝජනාව සඳහා එකඟතාවය මම විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට අපි දෙවැනි යෝජනාවට යනවා. යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාව ඉදිරිපත් කරන්න පෙර, රීති අංක 16(1) යටතේ මෙම සභාවේ ගණපූරණය පිළිබඳව අවධානය යොමු කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කැන්ටිමටත් ඇහෙන්න සීනුව නාද කරන්න.

සභාවේ ගණපූරණය සම්පූර්ණ නොවෙන බවයි පෙනෙන්නේ. ඒ අනුව සභාවේ ගණපූරණය සම්පූර්ණ වන තුරු කෙටි වේලාවකට සභාව කල් තියනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 12.01 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Sitting, Suspended and. it resumed at 12.01 p.m with Hon Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. තැන් තැන්වල හිටගෙන ඉන්න එපා. වාඩි වෙන්න කෝ. මම ඉතාම කනගාටු වෙනවා. මේ නීති දන්න, රීති දන්න මන්ත්‍රීවරුන්ගේ සභාවේ හැසිරීම පිළිබඳව. අර රීතිය නැහැ, මේ රීතිය නැහැ, මේක මෙහෙමයි කියලා ලොකුවට කථා කරනවා. නමුත් සභාපතිතුමා - සුනිල් විජේරත්න වෙන්න පුළුවන්. නොවෙන්න පුළුවන්. සභාපතිතුමා මූලාසනයට එන කොට මන්ත්‍රීවරු දැනගන්න ඒ හැසිරීම කරන්න. මේක විහිළුවක් කරන්න එපා. මූලාසනයට ගරු කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ මන්ත්‍රීවරු අයින් කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පක්ෂයට කියන්න ඕනෑ, ඒ වාගේ මන්ත්‍රීවරු ටික අයින් කරන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද? නම කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනික් එක ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රශ්නයක් තිබෙනවා. අද උදෙත් මම මේ ප්‍රශ්නය යොමු කළා. අධ්‍යාපන ඇමැතිතුමා දැන් මේ සභා ගර්භයේ නැහැ. එතුමාත් සිටියා නම් හොඳයි. අධ්‍යාපන ලේකම්තුමා සභාවේ ඉන්නවාද? මම මේ උත්සවයට අනිවාර්යයෙන් එනවා. ජනාධිපතිතුමාත් සම්බන්ධ වෙනවා නේ? නමුත් මේකේ මට නිකන්වත් ආරාධනාවක් නැහැ. මම උදෙත් කිව්වේ,

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා නොවෙයි. අපි දන්නෙත් ඊයේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්න ඒකයි. ඔබතුමා කියන්න. ඔබතුමා අපේ පළාත් සභාවේ නායකයා. මේ වැඩේ මොකක්ද? ආරාධනා පත්‍රය උදේ මගේ මේසය උඩ තිබුණා. මම හරියට කියෙව්වේ නැහැ. දැන් කියවලා බලනකොට මේකේ මට ආරාධනාවක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා එයත් එක්ක තරහයි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම එකක් නොවෙයි. එහෙම තරහක් නොවෙයි. මුල සිටම වැරැද්දුවා. මම උදෙත් කිව්වේ එහෙමයි. අපි කියන්න ඕනෑ. මේවා කොහේ ගිහිල්ලා කියන්නද? මේ වැරැදි හදාගන්න ඕනෑ. වැරැද්ද නිවැරැදි වෙන්න ඕනෑ. කවුරු හරි කමක් නැහැ. ආරාධනා පත්‍රයක් හදාගන්න හැටි දන්නේ නැත්නම් ඒක කියා දෙන්න ඕනෑ. දන්න කෙනෙක්ගෙන් අහගන්න ඕනෑ. කවුද ආරාධනා කරන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කියලා දෙන්න පුළුවන් මිනිහෙක් වෙන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි. ඒක හරි. මම කනගාටු වෙනවා. මම උත්සවයට යනවා. ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නියපොත්තේ ඉඳලා මොළේ වැඩියි. ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව.

## පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු : II
## PRIVATE MEMBER'S AFFAIRS : II

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, "*කැලණි ගඟ මධ්‍යම කඳුකරයෙන් ආරම්භව බස්නාහිර පළාත් සහා බල ප්‍රදේශයට ප්‍රවිෂ්ටව කොළඹ, ගම්පහ දිස්ත්‍රික්ක මැදි කරමින් මුහුද කරා ඇදෙද්දී කොළඹ, ගම්පහ දිස්ත්‍රික්ක තුළදී ඉතා දැඩි දූෂ්‍යකරණයට ලක්වීම සිදුවේ. ඉතා විෂ රසායනික ද්‍රව්‍ය, ඩයි වර්ග, දූෂ්‍යකාරක රසායනික මුසු වීම තුළ මෙම බේදවාචකය සිදු වීම ඉතා බරපතළ පාරිසරික හා සෞඛ්‍ය ගැටළු රාශියක් මතු කරයි. කොළඹ නගරය ඇතුළු තදාසන්න ප්‍රදේශ ගණනාවක ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය වන්නේද කැලණි නදියයි. දූෂ්‍යකරණයට ලක්ව ඇති මෙම පානීය ජල මූලාශ්‍රය සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරිව සහ පාරිසරික වශයෙන් ජෛව විවිධත්වයට වැදගත් මෙහෙවරක් ඉටු කරනු ලබන පරිසර පද්ධතිය සුරක්ෂිත කිරීම සඳහාත්, ඒ තුළින් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහාත් මධ්‍යම පරිසර අධිකාරිය, බස්නාහිර පළාත් සභාවේ පරිසර අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, කර්මාන්ත දෙපාර්තමේන්තුව, සංචාරක අමාත්‍යාංශය යන ආයතන ඒකාබද්ධ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි.*" මෙම යෝජනාව සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට නැවත විනාඩි 10 ක කාලයක් දෙනවා. ඔබතුමා කථා කරන්න.

[ අ.භා.12.05 ]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, අපි මේ ජීවත්වන ශ්‍රී ලංකාව කියන පරිසර පද්ධතිය මෙකේ ජාතික විවිධත්වය සිංහල වෙන්න පුළුවන්. දෙමළ වෙන්න පුළුවන්. ද්‍රවිඩ වෙන්න පුළුවන්. ඒ වාගේම උඩරට, පහත රට වෙන්න පුළුවන්. හැබැයි සමස්ත පරිසර පද්ධතියක් විධියට සලකද්දී, මේ පරිසර පද්ධතිය නිර්මාණය වීමට අදාළ වන කාරණා 09 ක් ගැන පරිසර විශේෂඥයින් අවධානය යොමු කරනවා. ප්‍රධාන කාරණයක් තමයි, අපේ රටේ සුවිශේෂී හු ගර්භ පිහිටීමක් වන මධ්‍ය කඳුකරයක් පිහිටා තිබීම. මේ මධ්‍ය කඳුකරය දෙපාර්ශවයකින්, නිරිත දිග මෝසම් සුළංවලින් සුළං දහරා දෙකකුත් වර්ෂය පුරාම දිවෙන ආකාරයට අන්තර් මෝසම් සුළං වාර දෙකකිනුත් සමන්විත වන මහා දැවැන්ත මිලිමීටර් 2500 ත්, 3200 ත් අතර වර්ෂා පතනයක් සහිත භූමියක් බවට පත් වී තිබීම. ඊළඟ කාරණය තමයි, මේ මධ්‍යම කඳුකරයේ දෙපාර්ශවයකින් ඒ වාගේම අනික් පාර්ශවවලින් අන්තර් මෝසම් වැසිවලින් පෝෂණය වෙද්දී එහි ජලය අරීය ජල වහන පද්ධතියක් විධියට කරත්තයක රෝදයක තිබෙන ගරාදි විධියට රට පුරාම බෙදා හරින ගංගා පද්ධතියකින් සමන්විත වෙලා තිබෙනවා. ගංගා 108 ක් තිබෙනවා. අතු ගංගා 43 ක් තිබෙනවා. මෙන්න මේ විධියට අරීය ජල වහන පද්ධතියක් නිර්මාණය වීම තුළ අපේ පරිසර පද්ධතියේ ශ්‍රී ශ්‍රැස්තතියක් නිර්මාණය වෙලා තිබෙනවා, ලාංකීය පරිසර පද්ධතිය විධියට ගත්තාට පස්සේ. ඒ වාගේම තවත් විශේෂකම් තිබෙනවා, අපේ උෂ්ණත්ව පරාසයන්වල වෙනස. කිලෝ මීටර් 20 ක් ඇතුළත සෙන්ටිග්‍රේඩ් අංශක 8 ක්, 9 ක් වැල්ලවායේ සෙන්ටිග්‍රේඩ් අංශක 32 යි.

බොරලන්ද සෙන්ට්‍රිග්‍රේට් අංශක 10 යි. සෙන්ට්‍රිග්‍රේට් අංශක 20 ක, 30 ක විචල්‍යයක් දකින්න ලැබෙනවා. මෙන්න මේ සියලු භූ ගර්භ සහ භූ විද්‍යාත්මක, ඒ වාගේම පරිසරයේ කාලගුණික මේ තත්ත්වයන්වල විශේෂ දේ ලබා ගැනීමට නම් සමස්ත පරිසර පද්ධතියක් විධියට මම මේ ඉදිරිපත් කරන කාරණා නවය ගැනම ඒකාබද්ධව සිතීමට අපට බල කරලා තිබෙනවා, අනාගතයේ මේ පරිසර පද්ධතිය සුරක්ෂිත කිරීමට නම්. මේ පරිසර පද්ධතිය පත්වන අවධානම නිර්මාණය වන මොහොතේම නිර්මාණය කරගත්ත කාරණා ටිකක් තිබෙනවා. එකක් තමයි මධ්‍යම කඳුකරයේ පවතින දැඩි ලිහිල් භාවය. පස්වල සහ මාතෘ පාෂාණයේ පවතින දැඩි ලිහිල් බව. ඕනෑම වෙලාවක මේ මධ්‍ය කඳුකරයේ ගංගා පද්ධතිය ආවරණය අවහිර වෙන්න, ඒ වාගේම ගංගා පද්ධති සිඳී යන්න, ඒ වාගේම නායයෑම්වලට, විවිධ දේවල්වලට බලපාන්න ඉඩ තිබෙනවා. මේ මධ්‍ය කඳුකරයේ ලිහිල් බව. ඒ වාගේම අනික් පැත්තකින් තිබෙනවා, මේ ගංගා දාරවල තිබෙන දැඩි ලිහිල් බව. විශේෂයෙන්ම පහත් බිම්වලට ගංගා ගලාගෙන එන කොට දෙපස ඉවුරු දැඩි ලිහිල් බවකින් සම්බන්ධිත වෙලා තිබෙනවා. ඒ වාගේම තව පැත්තකින් මේ උෂ්ණත්ව පරාසය නිසාම ජලය සම්බන්ධව, අභ්‍යන්තර ජලවල තිබෙන විවිධත්වයන් දකින්න ලැබෙනවා.

ඒ වාගේම මුහුද වටේ තිබෙන කොරල් පරය. මේ කොරල් පරය ලාංකීය භූමිය නිර්මාණය කරන්න සුවිශේෂී මෙහෙවරක් වී තිබෙනවා. මේ ලාංකීය භූමිය හිර වෙලා ගොඩනැඟිලා තිබෙන්නේම වටේම පවතින ජීවී කොරල්පරයක් මඟින්. මේ ජීවී කොරල්පරය සජීවීව තබා ගැනීම සඳහා නිර්මාණය වෙලා තිබෙන පාරිසරික හේතුන් වලින් ප්‍රධාන තැනක් ගන්නේ අරීය ජලවහන පද්ධතියක් තිබෙන ගංගා 108 ක් මුහුද කරා දිවීමයි. මේ ගංගා මුහුද කරා දිවෙන කොට, ලවණතාවය වැඩි වෙන කොට ඒකේ තිබෙන ලවණතාවයන් අරන් ඇවිල්ලා විවිධ ජෛව විවිධත්වයක් සහිතව ඒ කොරල්පරය සජීවීව පවත්වා ගන්නවා. මෙන්න මෙවැනි පරිසර පද්ධතියේ සුවිශේෂී පිහිටීම් ජෛව විවිධත්වයටත්, අනික් පැත්තෙන් ගත්තාට පස්සේ පරිසර පද්ධතියක් විධියට ගංගා දෙපස ඉවුරුවල ශක්තිමත් භාවය ආදී මේ සියල්ලම රඳා පවතින්නේ ගංගා සම්බන්ධව නිර්මාණය වෙලා තිබෙන ස්වභාවික පිහිටීම මත කියලා ඉතාමත්ම ඉහළින් විද්‍යාඥයන් විශ්වාස කරනු ලබනවා. ඒ වාගේම මේ මත වගුරු බිම් ප්‍රමාණයත්, ජල රැඳවුම් ප්‍රදේශ, water retention area ඒ වාගේම විල්ලු ප්‍රමාණයක් මේ ගංගා ආශ්‍රිතව නිර්මාණය වෙලා තිබෙනවා. මේ ගංගා පෝෂණය වෙන්නත්, ගංගාවලට එක පාරටම ජලය මුදා හැරීම පාලනය වෙන්නත් මධ්‍යම කඳුකරයට එකවර ජල දහරා පතිත නොවීමටත් කඳුකරයේ තිබෙන වියන් ස්ථර ඉතාමත් වැදගත් වෙනවා. ඒ වාගේම පොළව මත තිබෙන ආවරණ ඉතාමත් වැදගත් වෙනවා. මේ සියලු දේවල් එකතු වෙලා තමයි මේ ගංගා 108 නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ ගංගා 108 න් කැලණි ගඟ ගැන තමයි මම මේ කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. මේ කැලණි ගඟේ ඉවුරු දෙක ගත්තාට පස්සේ ඉතාමත් දැඩි ලිහිල් බවකින් සමන්විත වෙලා තිබෙනවා. ඒ වාගේම මේ කැලණි ගඟේ - කැලණි ගං කොමලිය කියලා අපි කථා කරනවා. ඒකට ලලනා ගුණයක් එකතු කරමින් ඒක ගලන ස්වභාවයත්, ඒ නිසාම කැලණි ගං කොමලිය කියලා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සාකච්ඡා නවත්තන්න. විශේෂයෙන්ම ගරු ඇමතිතුමන්ලා මේක අහගන්න කෝ. හරි වැදගත් දේශනයක් එතුමා කරන්නේ. කෘෂිකර්මයට, සෞඛ්‍යයට හරි වටිනාම දේශනයක් එතුමා කරන්නේ. හරි වැදගත් ඒක. අහගන්න කෝ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ නිසා කැලණි ගං කොමලිය දෙපැත්තේ තුරුල් කරගෙන ඉවුරු දෙකක්, ගම්පහ දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය තුරුල් කරගෙන තමයි මේ ගමන් කරන්නේ. හැබැයි කැලණි ගඟ ඉතිහාසය තුළ ගමන් කරද්දී මේ මාවත දිගේ කවදාවක්වත් විශ්වාස කළේ නැහැ, දෙපස සිටින ජනතාවගෙන්, දෙපස තිබෙන ප්‍රදේශයේ ජනතාවගෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ දිස්ත්‍රික්කයේ දෙපස සිටින ජනතාවගෙන් මේ ගං කොමලිය දූෂණය කරයි කියලා. ආරක්ෂා කරයි කියලා විශ්වාස කරපු දේ දූෂණය කරමින් පවතිනවා. මේ දූෂණය තුළ කැලණි ගඟට වෙලා තිබෙන ඛේදවාචකය ඉතාමත් බරපතළයි. එක පැත්තකින් මහා කර්මාන්ත ශාලා විධියට හඳුන්වා දීලා තිබෙන්නේ, අපේ රටට වෙනත් රටවල්වල කාබන් ඉතුරු කිරීමට දායක වෙන්නේ නැති ඉතාමත් බරපතළ දූෂ්‍ය කාරක කර්මාන්තශාලා. විශේෂයෙන්ම බෝතල් කිරීම, බෝතල් ඇඹිරීම සම්බන්ධ කර්මාන්ත ශාලා. එක බෝතලයක් සුද්ධ

[ගරු අසෝක සපුමල් රන්වල ]

කරන්න වතුර බෝතල් 10 ක් යනවා. මොකද, ඒ බෝතලේ ඇතුළේ ශුද්ධ කරන්න නම් කෝකාකෝලා වෙන්න පුළුවන්. බියර් වෙන්න පුළුවන්. වෙනත් බෝතලයක් ශුද්ධ පවිත්‍ර කරන්න නම් කෝස්ටික්වලින් තමයි සුද්ධකරන්නේ. කෝස්ටික් දැම්මාට පස්සේ බෝතලේ ඇතුළේ දිය වෙලා ගිහිල්ලා තමයි සුද්ධ වෙන්නේ. එහෙම නැතිව බ්‍රෂ් දාලා බෝතල් සුද්ධ කරන්නේ නැහැ. ඒක නිසා බෝතලේ ඒ තික්නස් එක අඩු කරමින්, දිය කර හරිමින් තමයි දැඩි දූෂ්‍යකාරකයක් විධියට කෝස්ටික් සෝඩා භාවිතා කරන්නේ. ඒක නිසා බෝතල්වලින් ඇසුරුම් කරන ලද බීම වර්ග වෙන්න පුළුවන්. වෙනත් ද්‍රව්‍ය වෙන්න පුළුවන්. අදාළ කර්මානශාලා අධික ජලය අවශ්‍ය කර්මාන්තශාලා බවට හඳුනාගෙන තිබෙනවා. ඒක නිසයි ගඟ දාරයේ නිර්මාණය වෙලා තිබෙන්නේ මෙන්න මෙවැනි කර්මාන්තශාලා. ඒක නිසා කෝස්ටික්වලින් ශුද්ධ කරන කොට, ඒ අපතේ යන කෝස්ටික් ප්‍රමාණය තනුක කරන්න එක බෝතලයකට බෝතල් 10 ක් පාවිච්චි කරන්න සිද්ධ වෙනවා. මේ dilute කරපු සියලු කෝස්ටික් වර්ග කැලණි ගඟට තමයි මුසු වෙන්නේ. ඒ එක අපරාධයක්. ඒක දූෂ්‍යකරණයක්. දෙපැත්තේ තිබෙන, විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි මේ කර්මාන්ශාලාවලින් මේ දේ සිද්ධ කරනවා.

දෙවැනි එක තමයි රෙදි ඇතුළු ද්‍රව්‍ය ඩයි කරන්න භාවිතා කරන ඩයි නිෂ්පාදනය කරන ද්‍රව්‍ය දැඩි දූෂ්‍ය කාරක ද්‍රව්‍ය බවට පත් වෙලා තිබෙනවා. රසායනික ද්‍රව්‍ය විධියට. ඒක නිසා අද විදේශ රටවල්වල ඇඳුම් ඩයි කරන, එහෙම නැත්නම් ඩෙනිම් ඩයි කරන, වෙනත් ඇඳුම්වල තිබෙන තද පාටවල් ගන්න ඩයි වර්ග එම රටවල්වල පාවිච්චි කරන්නේ නැතිව ඒ අමු රෙදි ගෙන්නවලා ඩයි කරන ව්‍යාපාරයට ලංකාව ප්‍රවිෂ්ට වෙලා තිබෙනවා. ඒ ඩයි ප්‍රමාණය නැවත dilute කිරීමට නම් කැලණි ගඟට මුදා හරින්න ඕනෑ. කවුරු හරි කියනවා නම් ඩයි වර්ග ටික ප්‍රතිචක්‍රීය කරලා, නැත්නම් ඒවා අපද්‍රව්‍ය කළමනාකරණයට ලක් කරලා මුදා හරින්න පුළුවන් කියලා, ඒක අමූලික බොරුවක්. ඩයි වර්ගවලට එහෙම කරන්න බැහැ. ඩයි වර්ගවල ස්වභාවයම තමයි ජල අංශුවේ හයිඩ්‍රජන්, ඔක්සිජන් එක්ක දැවැන්ත බැඳීමක් තිබෙනවා, ඩයිවර්ගවල රසායනික ද්‍රව්‍ය. ඒක නිසා ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් හෝ එහෙම නැත්නම් අප්‍රද්‍රව්‍ය කළමනාකරණය කිරීමෙන් මේ ඩයි වර්ග වෙන් කරගන්න බැහැ. වෙන් කර ගත්තත් ඒ ද්‍රාවණවලට කරන්න දෙයක් නැහැ. පොළවට දානවා මිසක්. ඒ නිසා මේ ඩයි වර්ග ඉතාමත් තදබල විධියට රණාල ප්‍රදේශයේ, හංවැල්ල ප්‍රදේශයේ කර්මාන්තශාලාවලින් මුදා හරිනවා. ඒ වාගේම බියගම වෙළඳ කලාපය තුළ ඒ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් පැවතුණත් ඔවුන්ට ඒ පාට කළමනාකරණය කරගන්න බැරි අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. 13 කනුව, ප්‍රසිද්ධයේ හඳුනන සියඹලාපේ colour light කිට්ටුවෙන් තිබෙන ඒ ඇළ මීට අවුරුදු 20 කට, 30 කට කලින් තිබුණේ ඉතාමත් නිල්වන් වතුරවලින් පිරුණු එකක්. අද කළුම කළු, මී හරකෙකුටවත් බහින්න බැරි දැඩි දූෂ්‍යකරණයට ලක් වුණු ඇළක් බවට පත් වෙලා තිබෙනවා. මේ ඇළ කොට්ටුන්න ඔය හරහා අනික් පැත්තෙන් ගමන් කරලා රත්ගහවත්තෙන් කැලණි ගඟට වැටෙනවා. ඒ ශුද්ධ කරපු වතුර. තව වතුර ප්‍රමාණයකින් 30% කට වැඩිය මල්වානයි, බියගමයි අතර තිබෙන යබරලුව ගම මැද්දෙන් ගිහිල්ලා කැලණි ගඟට ප්‍රවිෂ්ට වෙනවා. මෙන්න මේ විධියට කැලණි ගඟට විවිධ තැන්වල අධි දූෂ්‍යකාරක රසායනික ද්‍රව්‍ය අතහරිනවා.

ඒ වාගේම කැලණි ගඟ ඉවුරේ මීට වසර 10 කට පමණ කලින් වෛද්‍යවරුන් කිහිපයක් එකතු වෙලා මේකේ අනතුර ඉදිරිපත් කළා. වෛද්‍යවරුන් හය දෙනෙක් අත්සන් කරලා පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවකට තමන්ගේ අදහස් ඉදිරිපත් කළා. ඒ ලියවිල්ලේ තිබෙන්නේ කැලණි ගඟේ ඉවුර ඉතාමත් දැඩි ලිහිල් බවකින් යුක්තයි. මේ ඉවුර මත පොල් ගහක්වත් වවන්න එපාය කියලා. පොල් ගසේ ස්වභාවය තමයි කැලණි ගඟට නැඹුරු වීම. මොකද ආලෝකය සොයාගෙන යනවා. ඒ ආලෝකය සොයාගෙන ගිහිල්ලා පොල් ගහ නැඹුරු වුණාම ඊළඟ ගං වතුරේදී විශාල ඉවුරේ ප්‍රදේශයකුත් එක්ක කැලණි ගඟට පතිත වෙනවා. කැලණි ගඟ අයිනේ වැවෙන්න පුළුවන් අත්තික්කා වැනි ශාක, වෙනත් ශාක වර්ග, ඒ වාගේම ස්වාභාවික පිහිටීමත් - ඒ වාගේම ඉතාමත්ම බර - අද වන කොට කොළඹ නගරයේ තිබෙන ගබඩා සංකීර්ණ ඉවත් කරන්න කියලා තීරණයක් අරගෙන තිබෙනවා. දැන් මේ ගබඩා සංකීර්ණ ස්ථානගත කිරීමට කැලණි ගඟ ඉවුරේ භූමි සොයාගෙන මහා දැවැන්ත ගබඩා සංකීර්ණ ඉදි කරනවා. කැලණි ගඟේ ඉවුර මතට මෙතරම් ලොකු ගබඩා සංකීර්ණවල බර දරා ගන්න බැහැ. කන්ටේනර් පෙට්ටිවල බර දරා ගන්න බැහැ. ටික කාලයකින් දැඩි වතුරක් හමුවේදී ලිහිල් වුණාට පස්සේ විශාල ප්‍රදේශයක් කැලණි ගඟට ප්‍රවිශ්ට වෙනවා. දෙරණ රූපවාහිනියේ මම ඒක දැක්කා.

දෙරණ රූපවාහිනිය මගින් මේ ළඟදී පෙන්නුවා, ඩෝනර් කැමරා මගින් ගත්ත කැලණි ගඟේ ඡායාරූප ප්‍රමාණයක්. මම හිතන්නේ දවස් තුනකට, හතරකට කලින්. කැලණි ගඟේ පටු වීම, කැලණි ගඟ ගොඩ කරමින්, ඒ වාගේම නව ගොඩනැගිලි සෑදීම නිසා යම් යම් තැන්වලදී කැලණි ගඟ පටු වෙලා තිබෙනවා. මේ පටු වීම තුළ කැලණි ගඟ පතුළ ගොඩවෙන්න පටන් ගන්නවා. අනික් පැත්තේ හැරෙන්න පටන් ගන්නවා. ඒක තමයි ගඟේ ස්වභාවය. ඩෙල්ටාවක් නිර්මාණය නොවී කැලණි ගඟ පටු වීම මේ මිනිස් ක්‍රියාකාරකම් නිසා සිද්ධ කළොත් මෙන්න මේ බරතළ අනතුරට පත් වෙනවා. එහෙම පටු වූ තැනකින් කැලණි ගඟ වෙන පැත්තකට හැරෙන්න ඉඩ තිබෙනවා. දැන් ඒකේ අනතුරු හඟවනවා. මල්වාන ප්‍රදේශය, ඒ වාගේම වෙනත් පහත්බිම් හරහා කැලණි ගඟේ දිශාව වෙනස් වෙන්න පුළුවන්. මේ තිබෙන්නේ කැලණි ගඟේ භාරසිය ගමනක් වෙනස් වුණු දිශාව. ඔය උස්වැටකෙයියාව ආසන්නයෙන් කැලණි ගඟට මුහුදට සමාන්තරව කිලෝ මීටර් 04 ක් ගිහිල්ලා, ඒ උස්වැටකෙයියාවෙන් කැලණි ගඟට ප්‍රවිශ්ට වෙන්නේ ඔය භාරසිය අසූ ගණනක වෙනස්වීම තුළ. නව ආකාරයකට අලුත් වෙනස්වීමකට කැලණි ගඟ භාජනය වුණොත් මල්වාන ප්‍රදේශයෙන් වෙන්න පුළුවන්.

එහෙම නැත්නම් අනික් පැත්තෙන් හංවැල්ල ප්‍රදේශයෙන් වෙන්න පුළුවන්. මේ පටු තීර නිසා කැලණි ගඟේ දිශා වෙනස් වුණොත් මහා දැවැන්ත ජනතා හානියක් සිද්ධ වෙනවා. ඔබ දකින්න ඇති ගරු සභාපතිතුමනි, අනික් මන්ත්‍රීවරුත් Internet එකේ දකින්න ඇති. සමහර වෙලාවට ගංගා මහා නගර මැද්දෙන් ගලනවා. නගරවල ගෙනිපෙට්ටි වාගේ ගෙවල් අතු ගෑවිලා යනවා. අපි ඒවා දකිද්දී නිකන් රූපරාමු විතරයි. ඒවා හැමදාම සිද්ධ වෙන දේවල් නොවෙයි. ස්ථාවර නගර නිර්මාණය කරගෙන, මිනිස්සු ජීවත් වන කොට ගංගාව ගැන හිතුවේ නැහැ. ගංගාවේ දිහාව වෙනස් වන මොහොතකට අර සියලු මිනිස්සු ඉදි කරපු නගර මුහුදට බිලි වෙනවා. එය ඉතාමත් බරපතළ අනතුරක්. ඔය කිරිබත්ගොඩ ප්‍රදේශයෙන් ගඟ හැරිලා වත්තල දක්වා කෙටි ගමන් මාර්ගයක් සොයා ගත්තොත් එදාට මේ රටේ දැවැන්ත හානියක් වෙනවා. ඒ හානිය අද අපට ගණන් හදලා කියන්න පුළුවන්. ඒ ඉවුරු බෙහෙවින් බුරුල් වෙලා තිබෙනවා. බාධයක් හමු වුණු ඕනෑම මොහොතක සමහරවිට කඩුවෙල පාලම වෙන්න පුළුවන්. පාලමේ විශාල කොටන් රැඳිලා, මහ වතුරක් හමුවේදී ඒ කොටන් නිසා ජල දහරාව ගමන් කරන්න බැරි වුණොත් එහෙම, පටු ස්ථානයකින් කැලණි ගඟ - දැනට මල්වාන ප්‍රදේශය සම්බන්ධව අනතුරු හඟවලා තිබෙනවා. ගලාගෙන ගිහිල්ලා වත්තල ප්‍රදේශයේදී නැවත ගඟ වැටෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා නව ගඟක් නිර්මාණය වෙනවා. ඒ නිර්මාණය වෙන්නේ දැවැන්ත ජීවිත ප්‍රමාණයක් බිලි වෙලා. ඒ නිසා ගඟ සම්බන්ධව ඒ අනතුර තිබෙනවා. මේ අනතුර අපි දකින්න ඕනෑ. හඳුනාගන්න ඕනෑ. එවැනි හඳුනා ගැනීම සඳහා මහජන මන්ත්‍රීවරුන් අද අධ්‍යයනය කරමින් පවතිනවා. අපි සන්තෝෂ වෙනවා. ඔවුන් මට තොරතුරු ලබා දෙනවා. හැම කෙනෙක්ම සූදානම් වෙලා ඉන්නවා, මේ කැලණි ගඟේ ඛේදවාචකය සම්බන්ධව කථා කරන්න. ගියවර මේ යෝජනාව කල් තැබීම සම්බන්ධවත් යම් විධියට විවේචනයක් ආවා, මේ කථා කරන්න ඕනෑ යෝජනාවක් කියලා. ඊට වඩා යෝජනාවක් ආපු නිසා අපි ඒකට අවස්ථාව ගත්තා. හැබැයි, අපි දකින්නේ මේ කථිකාව මෙවැනි පළාත් සභාවක, විශේෂයෙන්ම දිස්ත්‍රික්ක දෙකකටම බද්ධ වෙනවා නම් ඒක දීර්ඝ ලෙස කථා කළාට ගැටලුවක් බවට පත් වෙන්නේ නැහැ. ඒක නිසා එක පැත්තකින් ඒ දූෂ්‍යකරණයට ලක්වීම, ඒ දූෂ්‍යකරණය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය නම් දැන් ගොඩක් අවසන්. ඔබතුමාට තව කාලය ඕනෑද? කාලය අවශ්‍යද?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

තව මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව විනාඩි 05 ක් විතර.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේ දූෂ්‍යකරණයට ලක්වීම තුළ ඊළඟට සිදුවන අපරාධය ගැනත් ඔබ හිතා බලන්න ගරු සභාපතිතුමනි. ගඟේ ඉහළින් මහා දැවැන්ත දූෂ්‍යකාරක ද්‍රව්‍ය, ඒ වාගේම විවිධ පරපෝෂිත ජීවීන් මේ ගඟට එකතු කරමින් අවසානයේ දී ගඟෙන් පහළින් වතුර අරගෙන මුළු කොළඹ තදාසන්න ප්‍රදේශයටම බොන්න දෙනවා. මොන රටක කුමන මිනිස්සුද මෙහෙම කරන්නේ? මෙහෙම වැඩ කරන්නේ කවුද?

[ ගරු අසෝක සපුමල් රන්වල ]

තමන් බොන වතුර. ඉතාමත් හොඳින් දන්නවා. ක්ලෝරීන් දාලා පිරිසිදු කළාට, පිල්ටර් කළාට ඒ ඩයිවර්ගවත්, ඒ වාගේම ඒ දූෂ්‍යකාරක රසායනික ද්‍රව්‍යවත්, කෝස්ටික් නිසා සිදුවන හානියවත් අවම කරගන්නවත් බැහැ. නැති කිරීම කොහොමටවත් කරගන්න බැහැ. අවම කිරීමක් කරන්න බැහැ. හැබැයි අපේ රටේ මිනිස්සු, අර මට මතක් වෙනවා. එක ගායකයෙක් කියලා තිබෙනවා, අපේ රටේ මිනිස්සු කියලා. ඇයි? අපේ රටේ මිනිස්සු මෙහෙම කරන්නේ? අපේ රටේ එහෙම ආයතනවලින් එහෙම දේ කරන්නේ ඇයි? පට්ටිවිල නව ජල පවිත්‍රාගාරයක් හැදුවා. ඊට කිලෝමීටරයක් කලින් මහා දැවැන්ත රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයක් ගඟට දානවා. පට්ටිවිල ප්‍රවිෂ්ටය තිබෙන්නේ, ජල පවිත්‍රාගාරයට යාබදව. මම හිතන්නේ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉතාමත් හොඳින් දන්නවා. දැන් මේ ළඟදීත් ඒක සම්බන්ධව පොම්ප දාගෙන තෙල් ටික ඉවත් කරන්න උත්සාහ කරනවා. විශාල තෙල් ප්‍රමාණයක් පට්ටිවිල ජල පවිත්‍රාගාරය ළඟ තිබෙන ඇළෙන් ගඟට ප්‍රවිෂ්ට වෙනවා. අර වතුර නළවලට මේක සම්බන්ධ වෙලා අදින්න පටන් ගන්නවා. ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට බොන්න බැහැ. ඉතාමත්ම බරපතළ ඛේදවාචකයක්. විශාල ජනතා ප්‍රමාණයක් බීමට ගන්නා ජලයට, ඊට කිලෝ මීටර් 02 ක්, 03 ක් උඩින් අති දූෂ්‍යකාරක ද්‍රව්‍ය ගඟට මුසු කරනවා. මේ අපරාධය නවත්වන්න ඕනෑ.

මහා පරිමාණ ව්‍යාපාරිකයින් රටේ ආර්ථිකය ගැන හිතලා, බදු ගැනීම ගැන හිතලා, බියර් කර්මාන්තය වෙන්න පුළුවන්. කෝකාකෝලා වෙන්න පුළුවන්. ස්ප්‍රයිට් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඩයි කර්මාන්තශාලා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් වෙළඳ කලාපයේ දූෂ්‍යකාරක කර්මාන්තශාලා වෙන්න පුළුවන්. මේවා තවදුරටත් අපේ රටේ ජනතාව පීඩාවට පත් කරනවා හොඳටම ඇති. අපි මේ ව්‍යාපාරිකයන් එක්ක තරහා නිසා නොවෙයි. ආයෝජකයන් එක්ක තරහා නිසා නොවෙයි කියන්නේ. අපේ පරිසර පද්ධතිය සුරක්ෂිත කිරීමේ වගකීම අප සතු කාර්යභාරයක්. කැලණි ගඟ දෙපස ඉන්න ජනතාව සතු වගකීමක්. ඒක නිසා බස්නාහිර පළාත් සභාව විධියට අපි මැදිහත් විය යුතුයි. මේ කැලණි ගඟට දූෂ්‍යකාරක එන්නේ කොහෙන්ද? ඒක කෙලින්ම නවත්වා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ඔය පරීක්ෂණ කරලා, වතුරේ තිබෙන්නේ මොනවද කියලා සොයලා, බැර ලෝහ තිබෙනාවද? ඩයි වර්ග තිබෙනවාද කියලා - ඒක ලෝකයේ දැන් පිළිගන්නේ නැහැ. ඒක යල් පැන ගිය ක්‍රමයක්. එන තැනින් හඳුනාගෙන - ජපානයේ තිබෙනවා ඇළවල්වලට වතුර වැටෙන කොට ඇළේ වතුර යන්තම් කහපාට වුණොත් ඒ නිලධාරීන් යනවා, කහ පාට වීමට බොර වතුර එන්නේ කොතැනින්ද? කොයි වත්තේද පස් පිඩැල්ලක් බුරුල් කරලා තිබෙන්නේ. එතැනට ගිහිල්ලා ඔවුන්ට දඩ ගහනවා. ඒක තමයි ක්‍රමය. වැස්සත්, වෙලාවකට ජනතාවට හෝ කර්මාන්තශාලාවලට පස නිරාවරණය කිරීම නිසා සෝදාපාළුවට ලක් වුණු වතුර ගඟට හෝ ඇළට එකතු කිරීමේ අයිතියක් නැහැ. ඒක තමයි ලෝකයේ දියුණුව. ඒක තමයි සදාචාරය. හැබැයි ඒ සදාචාරය අබමල් රේණුවකටවත් සලකන්නේ නැතිව මහා කර්මාන්තශාලා මේ විපත්තිය කරනවා.

මේක නිරාකරණය කරගන්න අමාරු නැහැ. ගඟ දෑලේ මිනිස්සුන්ට පොදුවේ ප්‍රවිෂ්ට වෙන්න පුළුවන් තැන් නිර්මාණය වෙලා තිබෙනවා. ඒවාට තොටුපලවල් කියලා කියනවා. ඒ තොටුපලවල් සංස්කෘතියක් තිබුණා. ගඟ ආරක්ෂා කරන්න. ඒ තොටුපලකින් තමයි පොදු ජනතාව ගඟට ප්‍රවිෂ්ට වෙන්නේ. දැන් මේ තොටුපලවල් ආවරණය කරලා විවිධ සමාගම් මේවා තමන්ගේ භාරයට අරගෙන. ගඟට විෂ ද්‍රව්‍ය එක පැත්තකින් මුදා හරින කොට තොටුපලෙන් මිනිස්සු ඇවිල්ලා නැවොත් ප්‍රශ්නයක් නිසා මේ තොටුපල පාවිච්චි කරන්න බැරි විධියට අබලන් කරනවා. කඩා බිඳ දානවා. ඒක නිසා ලෝකයේ බොහෝ රටවල්වල, සීත රටවල්වලත් ග්‍රීෂ්ම කාලයේදී ජනතාව විශාල වශයෙන් ගංගාවලට ඇවිල්ලා නානවා. ඒක ලෝකයේ සංස්කෘතියක්. අපේ රටේ කැලණි ගඟ ස්නානය සඳහාම භාවිතා කරපු ගඟක්. හැබැයි අද අපේ දරුවන්ට මේ අවස්ථාව නැහැ. මීට අවුරුදු 20 කට කලින් අපි පුංචි කාලයේ ගඟේ බැහැලා නැවා. ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. විශේෂයෙන්ම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගඟ දෑලේ හැදිලා, ගඟ දෑළත් එක්ක සම්බන්ධ වෙලා, ගඟේ බැහැලා නාපු අය. නමුත් අද ඒ අවස්ථාව අපේ දරුවන්ට උරුම වෙලා නැහැ. ගඟට බහින්න බැහැ. භීතියන් දෙකක් ඇති කරලා තිබෙනවා. ගඟට බැස්සොත් ඉතාමත් දූෂ්‍යකාරක ද්‍රව්‍යවලින් තමන්ගේ සම බාදනයට ලක් වෙනවා. දෙවැනි පැත්තෙන් භීතියක් ඇති කරලා තිබෙනවා, ගඟේ කිඹුල්ලු ඉන්නවාය කියලා. කිඹුල්ලු දාලා, කිඹුල්ලු නිර්මාණය කරලා තිබෙනවා.

මේ කිඹුල්ලු දැම්මේම ගඟට බැහැලා මිනිස්සු නාන්න පටන් ගත්තොත් එහෙම කර්මාන්තශාලාවලට බරපතළ උවදුරක්. මේ සියලු දේවල් එක කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක්. මේ ගඟ දැලේ කර්මාන්තශාලා විධියට දූෂ්‍යකාරක කර්මාන්තයක් බවට පත්වෙලා තිබෙන අවස්ථාවක් තිබෙන්නේ. ඒක නිසා මේ සියල්ල සම්බන්ධවම මැදිහත් වෙන්න නම් අපි විසින් කරපු දේ තමයි - බස්නාහිර පළාත් සභාව තුළ ඒ සම්බන්ධව තිබෙන ආයතන ගණනාවක් තිබෙනවා. එක ආයතනයක් තමයි අපි පැහැදිලි කරපු ආකාරයට බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය. දරුවන් මේ සම්බන්ධව දැනුවත් කරලා, පාසල් දැනුවත් කරලා, මේ දූෂ්‍යකරණයට ලක් වුණු දේ නැවත නිවැරැදි කිරීමට තොටුපලවල් භාවිතා කරන්නේ කොහොමද? ඒ පරණ ඉතිහාසය තුළ තිබුණු තොටුපල සංස්කෘතිය ගොඩනඟන්නේ කොහොමද කියලා හඳුන්වා දීමයි. දෙවැනි කාරණය තමයි අපේ කර්මාන්ත අමාත්‍යාංශයත් එක්ක බද්ධව යහපත් කර්මාන්ත ගොඩනඟන්නේ කොහොමද කියලා කටයුතු කිරීමයි. තුන්වැනි කාරණය තමයි සංචාරක අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන අමාත්‍යාංශයේ කවුරුවක්වත්ම නැහැ. ඔබතුමා කිව්වාට කවුරුවක්වත් නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක නිසා මම අවසානයේ ඉල්ලා සිටින්නේ මේ සියලු අමාත්‍යාංශ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙන අමාත්‍යාංශයකට කියන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

සියලු කර්මාන්තයන් ඒකාබද්ධ කරගෙන දැවැන්ත ප්‍රවිශ්ටයක් විධියට අරගෙන අපි සියලුදෙනාම කම්ටු හරි හදාගෙන දෙපැත්තේ ඉන්න මන්ත්‍රීවරුන් එක්ක එකතු වෙලා මේ ගඟ දැළ නිවැරැදි කරගෙන, ඉවුර නිවැරැදි කරගෙන ගඟට බැහැලා නැවත සැරයක් නාන්න පුළුවන්, ගඟේ වතුර දෝතක් අරගෙන බොන්න පුළුවන් ආකාරයට නිර්මාණය කරමු. මේ සඳහා මධ්‍යම රජයේ තිබෙන අමාත්‍යාංශ, මධ්‍යම පරිසර අධිකාරිය භාවිතා කරමු. ඒ සඳහා සියලු දෙනාම ඒකරාශි වෙන්නය කියලා ඉල්ලා සිටිමින්, මා සමුගන්නවා. ඔබ සියලු දෙනාටම ස්තුතියි.

[ අ.භා.12.33 ]

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, පළමුව ඉතාමත් කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ පරිසර අමාත්‍යවරයා හැටියට අපගේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය හා ගෞරවය පුද කරන්න කැමැතියි. ඒ අනුව අපේ අමාත්‍යාංශය මඟිනුත් සාකච්ඡා කරලා කැලණි ගඟ ද්‍රෝනියේ ඇළ මූලාශ්‍ර ආරක්ෂා කිරීම උදෙසා ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම සහ සුරක්ෂිත කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරලා දැනට වසර දෙකකට ආසන්න කාලයක් වෙනවා. ඒ යෝජනාව අපි ඇති කළෙත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු හැටියට තමුන්නාන්සේලා කරන ලද යෝජනාවට ගරු කිරීමක් හැටියට. කැලණි ගංගා ද්‍රෝණිය ලංකාවේ ජනගහනයෙන් 25% කට සේවය සපයනවා. කර්මාන්ත හා වෙළඳ ව්‍යාපෘති 10,000 කට ආසන්න ප්‍රමාණයකට මහ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල ජීවත්වන මිලියන 4 කට අධික ජනගහනයක් තවමත් කැලණි ගංගාව මඟින් පෝෂණය වෙනවා. මෙම තත්ත්වය මත කැලණි ගංගාවේ ගුණාත්මක භාවය පවත්වාගෙන යෑම ඉතා වැදගත් කරුණක්. බස්නාහිර පළාත් සභාව මෙම ව්‍යාපෘතිය කරන්නේ අදාළ සියලුම ආයතන සමඟ සහයෝගයෙන්. විශේෂයෙන්ම මධ්‍යම රජයේ අමාත්‍යාංශ ගණනාවක්, මධ්‍යම පරිසර අධිකාරිය, ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය, අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය, කැලණි ගඟ ආශ්‍රිත සියලුම පළාත් පාලන ආයතන ආදී බොහෝ ආයතන මෙයට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම කැලණි ගඟ සංරක්ෂණය කිරීම සහ කළමනාකරණයට අදාළව IUCN ආයතනය ද පරීක්ෂණාත්මක කටයුතු සිදු කරමින් තිබෙනවා. මේ වන විට කැලණි ගඟ සම්බන්ධයෙන් මාගේ අමාත්‍යාංශය මඟින් සිදු කළ පර්යේෂණ කටයුතු අවසන් කොට එම තොරතුරු පදනම් කරගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකසමින් පවතිනවා. මේ සම්බන්ධයෙන්

[ ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

උනන්දුවක් දැක්වීම සම්බන්ධයෙන්, මෙම සභාවට යෝජනා ගෙන එමින් අප උනන්දු කිරීම සම්බන්ධයෙන් ගරු අසෝක රන්වල මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෑ. අද දේශපාලන කරළිය තුළ ගත්තාම දේශපාලනඥයන්ව බල්ලට දාලා, විවේචනය කරලා විශ්ව විද්‍යාලවල ඉන්න ආචාර්යවරුන් විවිධ උගතුන්, බුද්ධිමතුන් අගය කරමින් කථා කරනවා. මම මේ රන්වල ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි. අපි මේ උගත්, බුද්ධිමත් ආචාර්ය මහත්වරුන්ව විවේචනය කරනවා නොවෙයි. හැබැයි මේක අපට අවුරුද්දකින් විතර ඉවර කරගන්න තිබුණා. නමුත් මේකට සම්බන්ධ වුණු ආචාර්ය මහාචාර්යවරුන්ගේ කඹ ඇදිල්ලක් තිබුණා. මම හිතන්නේ අසෝක ගරු මන්ත්‍රීතුමා කාරණා දන්නවා ඇති. රොඩනි ගරු මන්ත්‍රීතුමා අපේ රටේ අය හිතනවා, දැන් මාධ්‍ය සාකච්ඡාවක් තිබුණාම හිතන්නේ - අපි දැන් විවිධ ව්‍යාපෘතිවලට ශක්‍යතා වාර්තා ගන්නේ university වල ඉන්න ආචාර්ය, මහාචාර්යවරුන්ගෙන්. නමුත් ඒවාට ගියාම කරන arresment කවුරුත් දන්නේ නැහැ. හැබැයි ලංකාවේ විවේචනය වෙන්නේ දේශපාලන අධිකාරිය. මම හැම වෙලේම කියන්නේ දේශපාලන අධිකාරියෙන් වැරැදි සිද්ධ වෙන්න පුළුවන්. හැබැයි මේ රට මෙහෙමවත් තිබෙන්නේ දේශපාලනඥයන් නිසා කියන එක ගරු සභාපතිතුමනි, කියන්නම ඕනෑ. ඉන්නවා නේ අපි වාගේ උන් ටිකක්. ඔයයි මමයි වාගේ. ඒ වාගේම අර ඔබතුමා කියන කාරණය සම්බන්ධයෙන් මම එකඟ වෙනවා. මොකද, මම අපේ ජී.එල්. පීරිස් ඇමතිතුමා කර්මාන්ත ඇමති හැටියට ඉන්න කාලයේ එතුමා මාව සීතාවක zone එකට පත් කලා. මම එහිදී නිරීක්ෂණය කරපු ආකාරයට එක කර්මාන්ත ශාලාවක් වතුර අදිනවා. ඒ අයගේ ඩයි සමාගමට කැලණි ගඟේ අන්තිම බිංදුවත් අදිනවා. ඒ කර්මාන්තශාලාව බලන්න යන වේලාවේදී මම දැක්කා. එතකොට කැලණි ගඟේ ඒ ප්‍රදේශයේ ජල මට්ටමක් තිබුණේ නැහැ. බොහොම පොඩි එකක් තිබුණේ. ඒ ජල ප්‍රමාණයත් අදිනවා. තමුන්නාන්සේ කියපු කථාව ඇත්ත. අපි මහ ලොකුවට කර්මාන්තශාලා ගැන කථා කරනවා. zone ගැන කථා කරනවා. මේ කර්මාන්ත කලාප ගැන. හැබැයි අපේ රටේ භාගයක් දූෂණයට ලක් වෙන්නේ ඒ අයෝජන කලාප හරහා කියන එකත් මම තමුන්නාන්සේට කියන්න කැමැතියි. ඒ සම්බන්ධයෙන් මම එකඟ වෙනවා. විශේෂයෙන්ම ඩයි ආශ්‍රිත ව්‍යාපෘති - දැන් තමුන්නාන්සේ දීර්ඝ වශයෙන් කථා කරපු නිසා මේකේ තිබෙන පැත්ත කථා කරන්න යන්නේ නැහැ. දැන් අපට එක දෙයක් කරන්න පුළුවන්. තමුන්නාන්සේ කථා කරන කොට ඒක තමයි මම හිතුවේ.

අපේ ඊළඟ උපදේශක කාරක සභාවට, ඔබතුමා අනිවාර්යයෙන්ම සහභාගි වෙන්න. ඊළඟ උපදේශක කාරක සභාවට අපි මේ කැලණි ගඟ තුරුල් කරගෙන දෙපැත්තේ ඉන්න පළාත් පාලන ආයතන ටිකේ ඉන්න සභාපතිවරුන්ව අපි විශේෂයෙන්ම කැඳවීමක් කරන්නම්. අපට පුළුවන් දේ කරන්න අපි පළමුවෙන් පටන් ගමු. අර ඔබතුමා කිව්වා වාගේ ජපානයේ ක්‍රමයට ඒ ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ තිබෙන ගඟට සම්බන්ධවන ජලාශ දිගේ ගිහිල්ලා පරීක්ෂා කරලා ඒ අයට නීතිමය කටයුතු කරන්නය කියන එකත් අපි උපදේශක කාරක සභාව හරහා නියෝගයක් අපි ඊළඟ උපදේශක කාරක සභාවේදී නිකුත් කරලා - ගඟ කාටද අයිති? පරිසර අධිකාරිය තිබෙනවාද? ඒක කියන්නේ නැතිව පළාත් සභාව හැටියට අපට 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් පාලන ආයතන හරහා අපට කරන්න පුළුවන් දෙයක් තිබෙනවා. ඒ නිසා ඒ පළාත් පාලන ආයතන හරහා අපි කරමු. මොකද, විශේෂයෙන්ම මේ ළඟදී කැලණියේ රජමහ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ මට කථා කරලා හම්බ වෙන්න ඕනෑය කියලා කිව්වා. මම එදා හවසම ගියා. උන්වහන්සේ මාව කැලණි ගඟට එක්කගෙන ගියා. උන්වහන්සේගේ අරමුණ වුණේ. මොකද, ඉතාම කනගාටුදායක සිද්ධිය මේකයි. අපි කවුරුත් දන්නවා. අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩිය වෙලාවේදී, කැලණියට වැඩිය වෙලාවේදී බුදුහාමුදුරුවෝ කැලණි ගඟෙන් ස්නානය කරලා තිබෙනවා. හැබැයි, මොකක් හරි ප්‍රාතිහාර්යයක් වෙලා බුදුහාමුදුරුවෝ ආවොත් යළිත් කැලණි ගඟෙන් නම් නාන්නේ නැහැ. කැලණිය පන්සලේ නායක හාමුදුරුවන්ගේ කාමරයේ තිබෙන ෂවර් එකෙන් තමයි නාන්න වෙන්නේ. හරිද? ඒ වාගේම බොහොම සුපිරිසිදු අර මක්කම වාගේ කැලණිය රජ මහ විහාරය පැත්තෙන් අලුත් දිය උල්පතක් එනවා. ඒකත් ගිහිල්ලා අර මළාටත් පෙරලා වතුර බොන්න බැරි කැලණි ගඟටමයි ඒකත් එකතු වෙන්නේ. මම හාමුදුරුවන්ට කිව්වා, අපි මොකක් හරි ක්‍රමයකට ඒකත් සංරක්ෂණයක් කරමු

කියලා. මොකද මේ ස්ථානය නරඹන්න දෙස් විදෙස්වල ඉන්න බෞද්ධ ජනතාව එනවා. මම හිතන්නේ මේක ලංකාවේ අය කිච්චාට දන්නේ නැහැ. බුදුහාමුදුරුවෝ සිවුරු උනපු ගල තවම සුරක්ෂිතව කැලණිය රජමහ විහාරයේ තිබෙනවා. මොකද, එතැනට විදේශිකයන් හුඟක් අය එනවාලු. ලංකාවේ අය මේක දන්නේ නැහැ. විදේශිකයන් ඇවිල්ලා එතැනට යනවා. ඒ නිසා අපි ප්‍රතිපාදන වෙන් කරලා දැනටමත් අපි කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා ඒ ස්ථානය සංරක්ෂිත කරලා, ඒ ගල එන අයට බලන්න සූදානම් කරලා සංචාරක අමාත්‍යාංශය හරහා අපි ඒ කටයුතු කරලා තිබෙනවා. නමුත් කැලණි ගඟේ ඒ තිබෙන තත්ත්වය ඕක තමයි. මම දැකපු. එවැනි ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා මේ වැඩේ අපි පොඩියට පටන් ගනිමු. ඒ නිසා අපි පළාත් පාලන ආයතන හරහා පළමුවැනි පියවර තියමු. මේ වාර්තා මොනවා වුණත් පළාත් පාලන ආයතන හරහා මේ කර්මාන්තශාලාවලට දඬුවම් දීමේ හැකියාව අපට තිබෙනවා. ඒ නිසා අපි ඒ වැඩේ පටන් ගනිමු. ඔබතුමාට බොහොම ස්තුතියි.

[ අ.භා.12.30 ]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි. අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට පක්ෂපාතීව කථා කරන්න හොඳ යෝජනාවක්. එතුමා මූලිකව ආශ්‍රය කර ගත්තේ කැලණි ගඟ. ගරු මහ ඇමතිතුමාත් කැලණි ගඟ ආශ්‍රයෙන් තමයි කථා කළේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මහේෂ් ගරු මන්ත්‍රීතුමාට ඉස්සෙල්ලා මම කැලණි ගඟෙන් නෑවේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඒක තමයි. පේනවා. ගරු මහ ඇමතිතුමා කැලණි ගඟේ පීනපු කෙනෙක් කියලා පේනවා. ඊට එහාත් තරණය කරපු එක්කෙනෙක් නේ මහ ඇමැතිතුමා. මම කැලණි ගඟ ගැන කථා කරන්න යන්නේ නැහැ. මේ වාගේම තවත් ගංගා ගොඩක් බස්නාහිර පළාතේ තිබෙනවා. ඔබතුමාගේ යෝජනාවට මම එකඟයි. ඔබතුමා කැලණි ගඟ ගැන කථා කරපු එක බොහොම වටිනවා. මොකද, ලංකාවේ අපි ආරක්ෂා කරගන්න ඕනෑ ගංගාවක් තමයි කැලණි ගඟ කියන්නේ. ඒකට මූලිකත්වය දෙන්න. ඒ විතරක් නොවෙයි. අද දූෂ්‍යකරණයට භාජනය වෙලා බස්නාහිර පළාතේ සුවිශේෂී ගංගා, ඇළ දොළ රාශියක් තිබෙනවා. අපි මේවා දිහාත් බලන්න ඕනෑ. මම ජීවත්වන ප්‍රදේශයේ බොල්ගොඩ ගඟ ගැන කථා කළොත් මම හිතන්නේ, ඒක අපේ කෘෂිකර්ම ගරු ඇමතිතුමාත් දන්නවා. අපේ ජීවිතත් එක්ක බොහොම සම්බන්ධ වුණු ගඟක් තමයි බොල්ගොඩ lake එක කියන්නේ. එහෙම නැත්නම් මේකට කොල්පැලැනේ ගඟ කියනවා. මේක පානදුරටත් එහාට යනවා. මේ ගඟ දිහා අපි බැලුවොත් සංචාරක කලාපයක්. මේක බණ්ඩාරගම වැනි ගම් ගණනාවක් පසු කරගෙන යන අපේ කරදියානෙන් පටන් ගත්තාම පිළියන්දල හරහා පානදුර, බණ්ඩාරගම වැනි දීර්ඝ ගමනක යෙදෙන ගංගාවක්. අද ඒවා දිහාත් අපිත් අපේ බස්නාහිර පළාත් සභාව වශයෙන් ගරු ඇමතිතුමන්ලාත්, ගරු මහ ඇමතිතුමාත් ඇස් යොමු කරන්න ඕනෑ. ඒවා දිහාත් බලන්න ඕනෑ. කැලණි ගඟ විතරක් ආරක්ෂා කරලා හරි යන්නේ නැහැ. ඒක වෙන්නත් ඕනෑ. ගරු සභාපතිතුමනි, මෙතුමාගේ යෝජනාව දිහා බැලුවාම මම ඒක බොහොම සාධාරණයි කියන්නේ - දැන් කළුතර කළු ගඟ තිබෙනවා. බොහොම වටිනා ජලාශයක්. දැන් අපේ වාගේම තමයි. මේවා විනාශ වෙලා යනවා. අද අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා කැලණි ගඟ විනාශ වෙන්නේ කොහොමද කියලා කථා කළා. අද ව්‍යාපාරිකයන් ඇවිල්ලා, ව්‍යාපාර පටන් අරගෙන අපද්‍රව්‍ය සියල්ල ගඟට අතරිනවා. ඕකම තමයි කොස්පැලැනේ ගඟටත්, එහෙම නැත්නම් බොල්ගොඩ ලේක් එකටත් වෙලා තිබෙන්නේ. මෙතුමාත් එක්ක මම සමහර තැන්වලදී එකඟ වෙන්නේ නැහැ. අද මේ රට, ලෝකය බොහොම දියුණුයි. අද ෆැක්ට්‍රිවලින් එළියට දාන අපද්‍රව්‍ය පිරිපහදු කරලා එළියට දාන ක්‍රමවේද ලෝකයේ තිබෙනවා. නමුත් අපි පළාත් සභාවක් හරහා මේවා නිරන්තරවම පරීක්ෂා කරමින්, පරිසර අමාත්‍යාංශය සමඟ එකතු වෙලා, සංචාරක අමාත්‍යාංශය එකතු කරගෙන අපි එකට ගමනක් යන්නේ නැති එකයි තිබෙන ගැටලුව.

ගරු සභාපතිතුමනි, මම එක උදාහරණයක් කියන්නම්. මීට දශක 1 ½ ට, 2 කට විතර එහා පැත්තේ කොස්පැලැනේ ගඟේ ධීවරයන් ජීවත් වෙනවා. ඔය බොල්ගොඩ ලේක් එක කියන්නේ බහුතරයක් ධීවරයන් ජීවත්වන ගඟක්. ගඟ ජීවනෝපාය කරගෙන ඉන්නවා. ගරු සභාපතිතුමනි,

[ ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා ]

මේ ගඟේ එක කාලයක් තිබුණා, මාළු කන්න බැහැ. මේකේ හැදෙන්නේ ලූල්ලු, කොරලි, බට්ටෝ කියන මාළු වර්ග. මේ මාළු විකුණලා ජීවත්වන ධීවරයන් විශාල පිරිසක් අපේ ප්‍රදේශයේ ඉන්නවා. එක කාලයක් මේ ගඟේ ඉන්න මාළු පරිහරණයට, භෝජනයට ගන්න සුදුසු නැහැ. ඒ මාළු ඉව්වාම භූමි තෙල් රහයි. ඒ මාළුවා අරගෙන හොඳි හදලා කන්න යන කොට ඒක භූමි තෙල් රහයි. මම හිතන්නේ, ඒ පළාත්වල ජීවත් වන මන්ත්‍රීවරු මේක දන්නවත් ඇති. ඉතින් කාලයක් මාළු කන්නේ නැතිව සිටියා. ක්‍රමක්‍රමයෙන් ඒ භූමි තෙල් වහනය වන එක නවත්තලා - ඩයි වර්ගයක් ගඟට එන එක නවත්තලා, එය නිවැරැදි කළාට පස්සේ නිවැරැදි වුණත් දැන් තවමත් සමහර තැන්වල ඒ භූමි තෙල් රහ එනවා. මම විශ්වාස කරනවා, දැන් ඩයි වර්ග මුදා හරිනවා බොහොම අඩුයි. අවමයි. නමුත් නැත්තේ නැහැ. හැබැයි, මේවා පිරිපහදු කරලා එළියට දාන ක්‍රමවේද තිබෙනවා.

හොඳම උදාහරණයක් තිබෙනවා, මේ අපේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට. එහා පැත්තේ බලන්න, ලොකු filtering එකක් හදනවා, අලුත් ගොඩනැගිල්ලේ වතුර පිරිසිදු කරන්න. විපක්ෂයේ ඉන්න අපට පේනවා. ආණ්ඩු පක්ෂයේ ඉන්න අයටත් විපක්ෂයට ඇවිල්ලා පොඩ්ඩක් එහා පැත්තට ඔළුව දාලා බලන්න පුළුවන්. අපේ අලුතෙන් හදන ගොඩනැගිල්ලේ මම හිතන්නේ සේවකයන් බර ගණනාවක් වැඩ කරනවා.ඒ සියල්ලගේම මළපහ ඔක්කොම එන්න තැනක් හදලා තිබෙනවා. filtering එකක් හදලා තිබෙනවා. filtering system එකක්. මම හොඳාකාරවම දන්නවා. මේ නිර්මාණය කරන කොහේ හරි රටක හෝ ලංකාවේ හෝ කම්පැණියක උදව්ය මේ වැඩේ ඉවර කරලා, අපි පාවිච්චි කරලා අපේ මූත්‍රා මළපහ ආවාහම refiltering කරලා ඉවරලා වෙලා මේකේ වතුර බීලා පෙන්වනවා. අවසන් ප්‍රතිඵලය අරගෙන, ජලය බීලා අපේ පිල්ටර් එක මෙහෙමයි කියලා පෙන්වනවා. මේ වාගේ දේවල් ලෝකයේ තිබෙනවා. ඩයි සෙපරේට් කරගන්න පුළුවන් ක්‍රමවේද තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කිව්වා, එහෙම ක්‍රමවේද නැහැ. එහෙම වුණොත් ලෝකයේ ඩයි පාවිච්චි කරලා කරන ෆැක්ට්‍රි වහන්න වෙනවා. ලංකාවේ අපට ව්‍යාපාර කරන්න බැරි වෙනවා. එහෙම තාක්ෂණයක් තිබෙනවා. තාක්ෂණය ක්‍රියාත්මක කරන්නේ නැති එකයි අපට තිබෙන ගැටලුව. අපි පළාත් සභාවක් වශයෙන්, ගරු මහ ඇමතිතුමා ඉන්නවා. සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නවා. කෘෂිකර්ම ඇමතිතුමා ඉන්නවා. සියලුදනා එකතුවෙලා අපි මේවාට නීතියක් හදලා - නීතිය තිබෙනවා. නීතිය ක්‍රියාත්මක කරන තැනට යන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. ඒකයි විය යුත්තේ.

දැන් උදාහරණයක් වශයෙන් ගත්තොත්, අපේ පැත්තේ විශාල ෆැක්ට්‍රියක් තිබෙනවා. Antler Febric කියලා. ඒකට බ්‍රයිටෝල් සමාගම කියලා කියනවා. අපට, සෞඛ්‍ය අමාත්‍යාංශයට එහෙම ගොඩක් උදව් කරනවා. අපේ පැත්තේ මාතෘ සායන, අරවා මේවා ඔක්කොම හදලා දෙනවා. මේ ගමන MOH එකත් හදලා දෙන්නේ ඒ ආයතනයෙන්. මේ ෆැක්ට්‍රි එකේ විශාල ප්‍රමාණයෙන් ඩයි භාවිතා කරනවා. මම පෞද්ගලිකව දන්න දෙයක් . මේ ෆැක්ට්‍රි එකේ විශාල ව්‍යාපෘතියක් හැදුවා මේ වාගේ. Separate filtering system එකක්. ඒක ජපානයෙන් ඇවිල්ලා හැදුවේ. ජපනා හදලා ඔක්කොම මළපහ, ඩයි ඔක්කොම එකට දාලා ක්ලීන් කරලා, මම ඇස් දෙකට දැකපු දෙයක්. ඒක අරගෙන Separate කරලා ළඟ සති ගණනක් බි බී පෙන්නුවා. මෙන්න උඹලාගේ ඒවා මම බොනවා කියලා. හැබැයි, කම්පැණි එක බීම සඳහා ප්‍රයෝජනයට ගන්නේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒ මිනිහා මළාද?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැහැ. මළේ නැහැ. ඔබතුමන්ලාට කෙළවෙන්නෙත් ඕක නේ. යමක් කියද්දී විහිළුවට ගන්නවා නේ. මේ හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙක්. එහෙම අහන කොට අපට කනගාටුයි. බොහොම හොඳ කථාවක් කරගෙන යන කොට අපව ජෝකර් කෙනෙක් කරන්න එපා. ඔබතුමන්ලා දන්නේ නැති දේවල් අපි කියන්න උත්සාහ ගන්නේ. ගරු සභාපතිතුමනි, ඒ ආයතනයෙන් එම වතුර මල්වලට, ගස්වලට දාන්න තමයි ප්‍රයෝජනයට ගන්නේ. ඒ නිසා අපි ෆැක්ට්‍රිකාරයොත් එක්ක ගේම ඉල්ලන්න නරකයි. දැන් මමත් Service Station එකක් පවත්වාගෙන යනවා. අපෙත් re-filtering system එකක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගඟට දාන්නේ නැහැ නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මට වැවක් නැහැ. මට කුඹුරක් නැහැ. මම rewash කරන්න ගන්නවා. ඒකට කෙමිකල් දාලා filtering system එකක් හදලා තිබෙනවා. Oil separate tank තිබෙනවා. oil යන්නේ නැහැ. මඩ වතුර ආවාම, කෙමිකල් දැම්මාම මඩ ඔක්කොම කැටි ගැහෙනවා. අපට තිබෙන්නේ මාසයකට, දෙකකට සැරයක් අර කැටි ගැසුණු මඩ, රොන් මඩ Drinking water පාටට වතුර එන්නේ. ඒක බොන්න ගන්න තත්ත්වයට මම ක්ලීන් කරන්නේ නැහැ. මේකයි සත්‍ය තත්ත්වය. එහෙම නම් මේ වාගේ ක්‍රමවේද තිබෙනවා. අපට තිබෙන්නේ ඔය ගඟවල් අයිනේ ඉන්න ව්‍යාපාරිකයන්ව සොයාගෙන ගිහින් ඒ ඇත්තන්ගෙන් මේ කාර්යය සිද්ධ වෙන්නේ නැත්නම් නඩු දාන්නත් ඉස්සෙල්ලා අපි ඒවා සොයා බලලා, ඒ මිනිස්සුන්ව ක්‍රියාදාමයකට යොමු කරලා, මේ සමාජයට හඳුන්වලා දීලා හොඳ ව්‍යාපාරිකයෙක් බවට පත් කරන්න කියන එකයි මගේ අදහස. එහෙම නම් කැලණි ගඟ විතරක් නොවෙයි, බස්නාහිර පළාත් සභාවක් වශයෙන් අපි බලන්න ඕනෑ. අපට මෙහේ ගංගාවල් කීපයක් තිබෙනවා.වටිනා සම්පත්. අපට බොල්ගොඩ ලේක් එක සංවර්ධනය කරන්න පුළුවන්. සංචාරක පාරාදීසයක් කරන්න පුළුවන්. දැනටත් ගොඩක් තැන්වල සංචාරකයින්, අපේ ශ්‍රී ලංකාවේ සංචාරකයින් හවසට ගිහින් බොහොම භුක්ති විඳින තැන් තිබෙනවා. ඔබතුමා දන්නවා නේ? බණ්ඩාරගම පැත්තේ බොහොම සුපිරියටම හදපු තැන් තිබෙනවා. එහෙම කියමින්, ඒ අදහස් ටික අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට ඉදිරිපත් කරමින් මේ යෝජනාව සම්බන්ධව අපි එකඟ වෙමින්, ඇත්තටම කාලෝචිත යෝජනාවක්. මේක කැලණි ගඟට විතරක් හිතන්න එපා. බස්නාහිර පළාතේ අනික් ගංගාත් එක්ක එකතු කරගන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. ඇත්ත වශයෙන්ම මම එතුමා අදහස් කළේ, අර කථා කරන කොට කිව්වා, කැලණි ගඟේ නාපු කෙනෙක් කියලා. ඒ දවස්වල කැලණි ගඟේ නාලා ව්‍යාපාර කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි දන්නවා. ඒ නිසා එතුමාට අවස්ථාව දෙනවා. විනාඩි 10 ක කාලයක් එතුමාට දෙනවා.

[ අ.භා.12.39 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඉතාම වැදගත් කාලෝචිත යෝජනාවේදී අදහස් ප්‍රකාශ කරන්න සුළු අවස්ථාවක් ලබා දීම පිළිබඳව. එතුමා ඉතාම දීර්ඝව ඉතාම තාක්ෂණිකව, ඉතාම විද්‍යාත්මකව, පාරිසරික වැදගත්කමක් සහිතව කරුණු ඉදිරිපත් කරමින් මේ යෝජනාව සභාගත කරනු ලැබුවා. අපි ඒ පිළිබඳව බොහොම සතුටු වෙනවා. ඒ වාගේම අපි විශ්වාස කරනවා. බොහෝ යෝජනා පළාත් සභාව ඇතුළට එනවා. හැබැයි, ඒ බොහෝ යෝජනාවල තිබෙන්නේ ක්‍රියාත්මක කරන්න බැරි කරුණු සහ ක්‍රියාත්මක කළ නොහැකි යෝජනා විධියට තමයි ඒවා ඉදිරිපත් කරන්නේ. නමුත් මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම තිබෙනවා. කැලණි ගඟ ඇත්තටම වැඩිම ප්‍රමාණයක් ගලා බසින්නේ බස්නාහිර පළාත ඇතුළේ. අවිස්සාවෙල්ලෙන් ඇතුළු වුණාට පස්සේ කැලණි ගඟ මහ මුහුදට වැටෙන තුරුම බස්නාහිර පළාත ඇතුළු කොළඹ දිස්ත්‍රික්කයේ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ මායිමේ තමයි එතුමා කියපු විධියටම ගලා බසින්නේ. අපි දන්නවා, මානව ශිෂ්ටාචාර ආරම්භ වුණු කාලයේ සිටම මිනිස්සු තමන්ගේ මානව ශිෂ්ටාචාර බිහි කර ගත්තේ ගංගා ආශ්‍රිතව. ගඟ දෙපස තමයි මිනිස්සු පදිංචි වුණේ. මානව ක්‍රියාකාරකම් බහුලව සිද්ධ වුණේ ගංගා දෙපස. ජලය නැතුව මානවයාට පවතින්න බැරි නිසා තමයි, ජලය නැතිව මානව ක්‍රියාකාරකම් කරගන්න බැරි නිසා තමයි මානව ශිෂ්ටාචාර ගංගා ආශ්‍රිතව බිහි වෙන්න පටන් ගත්තේ. ඒ නිසාම ඒ කාරණා, ඒ පදනම කැලණි ගඟ ආසන්නයේත් කොළඹ දිස්ත්‍රික්කයේත්, ගම්පහ දිස්ත්‍රික්කයේත් පිහිටලා තිබෙන නිසා මේ ගඟ දෙපස විවිධ මානව ක්‍රියාකාරකම් සිද්ධ වෙමින් මානවයා තමන්ගේ කටයුතු කරගෙන යන්නේ. ඒ නිසාම තමයි ගඟට ඇත්තටම මේ හානි, විශාල දූෂණ, විශාල කාරණා සිද්ධ වෙන්නේ. මේකේදී මම මතක්කරන්න ඕනෑ. ගරු ප්‍රධාන ඇමතිතුමා කිව්වා වාගේම අපේ පළාත් සභාවේ හිටපු ප්‍රධාන ලේකම්තුමා, හිටපු ප්‍රධාන ලේකම්තුමා. දයා සෙනරත් මැතිතුමා, එතුමාගේ

[ ගරු මහේෂ් අල්මේදා ]

නායකත්වයෙන් පරිසර අමාත්‍යාංශය විධියට පවිත්‍ර ගංගා වැඩ සටහන බස්නාහිර පළාත තුළ ආරම්භ කරනු ලැබුවා. මේ පවිත්‍ර ගංගා වැඩ සටහනේදී කැලණි ගඟ සම්බන්ධ බොහෝ පර්යේෂණ සිදු කිරීම් කරනු ලැබුවා. කැලණි ගඟ කියලා කියන්නේ, අර රන්වල මැතිතුමා කිව්වා වාගේ අපි ඉපදුණු තැන. කැලණි ගඟේ තමයි අපේ පෙකනිය කැපුවේ. අපි කැලණි ගඟෙන් තමයි මුහුණ සේදුවේ. කැලණි ගඟේ තමයි හැම ක්‍රියාකාරකමක්ම කළේ. අපි පුංචි කාලයේ බොහොම පිරිසිදු ජල මූලාශ්‍රයක් කැලණි ගඟ. කැලණි ගඟ අද එහෙම නැහැ. ඉතින් කැලණි ගඟට වඳින මිනිස්සු ඉතිහාසයේ සිටියා. ගරු සභාපතිතුමනි, අපි හැමෝම දන්නවා. කැලණි ගඟේ පාරු පැදපු රන්වල මුත්තා කැලණි ගඟේ මැරුණු නිසා ඔහු රන්වල දෙවියෝ වුණා කියලා කැලණි ගඟ දෙපස ජීවත්වන මිනිස්සු විශ්වාස කරනවා. ඒ නිසා කැලණි ගඟට අධිපති දෙවියා විධියට රන්වල දෙවියාව මිනිස්සු විශ්වාස කරනවා. තවමත් හංවැල්ලේ, අවිස්සාවේල්ලේ කැලණි ගඟ දෙපස පොහොය දවසට පුහුල් පහන් පත්තු කරන්නේ රන්වල මුත්තාට කරන, රන්වල දෙවියන්ට කරන ගෞරවයක් විධියට. මිනිස්සු ඒ තරම් පූජනීය විධියට කැලණි ගඟ සලකනු ලැබුවා. හැබැයි, රන්වල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම අද කැලණි ගඟ පූජනීය තැනක් නොවෙයි. කැලණි ගඟ කාටවත් අත තියන්න බැරි, කාටවත් බහින්න බැරි, ජලය පාවිච්චි කරන්න බැරි, ඉතාම අපිරිසිදු තැනක් බවට පත් වෙමින් එනවා. මේක වළක්වා ගන්න පුළුවන්කම තිබෙනවා. මේකට බලපාන ප්‍රධානම කාරණාව තමයි විනයක් නැති දේශපාලනය විසින් කරන බරපතළ හානිය. දැන් අපි සියලු දෙනා දන්නවා. කැලණි ගඟ දෙපස තිබෙන සියලු කර්මාන්තශාලා ආරම්භකරලා තිබෙන්නේ යම් බලපත්‍ර ප්‍රමාණයක් අතේ තියාගෙන තමයි. හැබැයි, මේ එක බලපත්‍රයක්වත් දෙන කොට ඒ බලපත්‍ර කොන්දේසි නිවැරැදිව සම්පූර්ණ කළාද කියන කාරණය හරියටම අධීක්ෂණය කරන්න බලපත්‍ර දෙන ආයතන එකක්වත් කටයුතු කරලා නැති නිසා තමයි මේ දූෂණය ගඟට සිද්ධ වෙන්නේ.

දැන් රන්වල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවත් ඉතාම හොඳට කළා. ඉතාම හොඳ පැහැදිලි කිරීම් කළා. හැබැයි අවසානයේ යෝජනාව වරද්දා ගත්තා කියලා මට හිතෙනවා. ඒ තමයි එතුමා කිව්වා, අධ්‍යාපන අමාත්‍යාංශය හරහා වැඩ පිළිවෙළක් හදන්න කියලා. මම හිතන්නේ වැරැදුණේ එතැන තමයි. ඉතාම වැරැදුණේ එතැන. මේ අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළේ යෝජනාවක් හැදුනොත් අනිවාර්යයෙන්ම කැලණි ගඟට දෙයියන්ගේම පිහිටයි. අධ්‍යාපනයට වුණු දේම කැලණි ගඟට සිද්ධ වෙනවා. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තක තියලා අපි මැදිහත් වෙලා මේ වැඩේ කළොත්

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක නැති කරන්න බලාගෙන කිව්වාද දන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේක ඉස්සරහාට ගෙනියන්න. ගරු සභාපතිතුමනි, අපි ප්‍රධාන වශයෙන් කියන්නේ, දැන් අද තිබෙන පාරිසරික අමාත්‍යාංශය භාර ඇමැතිවරයා මේ රටේ ජනාධිපතිවරයා. රටේ නායකයා. අපි දැක්කා, එතුමා ඊයේ පෙරෙයිදා පරිසර දිනය සමරනවා. එතුමා කිව්වා, ලංකාවේ තමයි පොලිතින් භාවිතය තියන්න කියලා උද්ඝෝෂණය කරපු එකම රට කියලා. එතුමාට බලතල තිබුණා, ඒවා ක්‍රියාත්මක කරගන්න. එතුමා රටේ විධායක ජනාධිපතිවරයා. නිකන් ජනාධිපතිවරයා නොවෙයි. ඒ නිසා මේකට මැදිහත් වෙන්න එතුමාට පුළුවන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හැබැයි දින 100 දැකලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැබැයි එතුමා තවමත් එහෙම වැඩ පිළිවෙළක් හදන්නේ නැහැ. ඒ නිසා මේක පළාත් සභාවට දීලා, පළාත් සභාව හරහා විතරක් කරලා මේ වැඩේ යථාර්ථයක් බවට පත් කරගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ කටයුත්තට ජාතික රජය මැදිහත් වෙන්න ඕනෑ. මොකද, පරිසර බලපත්‍ර දෙන ප්‍රධාන ආයතන සියල්ල තිබෙන්නේ, ජාතික රජයේ වගකීම යටතේ. පරිසර අමාත්‍යාංශය තිබෙන්නේ එතැන. පරිසර දෙපාර්තමේන්තුව තිබෙන්නේ එතැන. වෙනත් රාජ්‍ය ආයතන සියල්ල තිබෙන්නේ, රාජ්‍ය අමාත්‍යාංශය හරහා ජනාධිපතිතුමාගේ පාලනය යටතේ. ඒ ආයතන නිවැරැදිව

ක්‍රියාත්මක නොවෙන තෙක් මේ වැඩේ හරියට කරන්න බැහැ. අද කැලණි ගඟ ඉවුරට වගකියන ආයතනයක් නැහැ. දැන් පසුගිය කාලයේම, අපි සියලු දෙනාම දන්නවා. කැලණි ගඟේ අසීමිතව වැලි ගොඩ දැමීමම සිද්ධ කළා. ඒ නිසා භූගත ජල මට්ටම පහළට ගියා. පරිසර පද්ධතියම. කැලණි ගඟ ආශ්‍රිතව තිබෙන දෙපැත්තේම භූගත ජල මට්ටම පල්ලෙහාට ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා කැලණි ගඟට වැටෙන ඇළ දොල සියල්ලේ ඉවුරු කඩා වැටීම සිද්ධ වෙනවා. පාලම් කඩා වැටීම සිද්ධ වෙනවා. පාරවල් නාය යනවා. ඒ ආසන්නවම තිබෙන කඳු නාය යනවා. මේ සියල්ල එකට බැඳුණු ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් විධියට තමයි ඉස්සරහාට එන්නේ. දැන් අපි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල මේ පිළිබඳව සාකච්ඡා කරන කොට ප්‍රාදේශීය ලේකම්වරු කියන්නේ ගඟේ පතුල විතරයි අපට අයිති. ඊට එහා කිසි දෙයක් අපට කරන්න බැහැයි කියලා. මේ කටයුතු හරියට කර ගන්න නම් ලංකාවේ නීති වෙනස් වෙන්න අවශ්‍ය වෙනවා. රන්වල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව යථාර්ථයක් කරන්න. ඕනෑම ගඟක, ඇළක, දොළක පතුල අයිති ප්‍රාදේශීය ලේකම්ටලු. ඉවුර මට අයිති නැහැයි කියලා ප්‍රාදේශීය ලේකම් සම්බන්ධීකරණ කමිටුවේදී කියනවා. අද ඉවුරු සියල්ල දූෂණය කරනවා. දැන් පසුගිය කාලයේ වතුර වැඩි වුණාට පස්සේ කැලණි ගඟ දෙපැත්තට විශාල ප්‍රමාණයක් පළල් වෙලා තිබෙන්නේ. ඉවුර හැම තැනින්ම කඩාගෙන වැටුණා. දැන් අපි ලෝ ලෙවල් පාරේ ඉස්සරහාට යන කොට අපට පේන්න තිබෙනවා, ඇඹුල්ගම හන්දිය. ආටිගල හන්දිය. හංවැල්ල පසු කරන කොට කැලණි ගඟේ ඉවුර කොයිතරම් ප්‍රමාණයක් දූෂණය වෙලාද? කඩාගෙන වැටිලාද? කියලා. මේ ඉවුරු කඩා වැටෙන්නේ, මේ ඉවුරුවලට වග කියන ආයතන නැති නිසා. ඉවුරුවල කරපු අනවසර ඉදි කිරීම් සහ අනවසර වැලි ගොඩ දැමීම් වාගේම අනවසරව කරපු කර්මාන්තශාලා නිසා තමයි මේක සිද්ධ වෙන්නේ. මේ කර්මාන්තශාලාම තමයි ආපසු අපවිත්‍ර ජලය කැලණි ගඟට මුසු කරන්නේ.

ගරු සභාපතිතුමනි, බැර ලෝහ විශාල ප්‍රමාණයක් තිබෙනවා කියලා පර්යේෂණ ගණනාවක ඔප්පු කරලා පෙන්නුවා. ජාතික ජලසම්පාදන මණ්ඩලය කැලණි ගඟේ වතුර පිළිබඳව පර්යේෂණ ගණනාවක් කළා. ඒ අය යම් සංසනනයක් කෙරුවා, කොයිතරම් ප්‍රමාණයක් කැලණි ගඟ ආශ්‍රිතව කර්මාන්තශාලා පිහිටුවලා තිබෙනවාද කියලා. ඒවායේ කොයිතරම් ප්‍රමාණයක් අපද්‍රව්‍ය කැලණි ගඟට එකතු කරනවාද කියලා. හැබැයි, ඒක වාර්තාවකට විතරක් සීමා වුණා. ඒවාට විරුද්ධව කටයුතු කරන්න ආයවනා තිබුණේ නැහැ. ඒ වාගේම ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. ඒ නිසා කැලණි ගඟ පිරිසිදු කරන්න අවශ්‍ය කරන මූලික පියවරයන් ඉස්සරහාට තියන්න නම් මේ ආයතන ශක්තිමත් කරන්න ඕනෑ. දේශපාලන බලපෑමකින් තොරව. අද තිබෙන පළාත් පාලන ආයතන සියල්ල - මේ වන විට පළාත් පාලන ආයතන පිහිටුවලා තිබෙනවා. මේ පළාත් පාලන ආයතන සියල්ල ගෙනැල්ලා නැවත වතාවක් - මට මතකයි ගරු මහ ඇමතිතුමා පවිත්‍ර ගංගා වැඩ සටහන කරන කොට පළාත් පාලන ආයතන අකර්මණ්‍යය වෙලා තිබුණේ. ඒ නිසා පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්වත්, ගඟ අයිනේ ඉන්න මන්ත්‍රීවරුන්වත් ඒකට සම්බන්ධ කරගන්න බැරි වුණා.

දැන් නැවත වතාවක් රන්වල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව හරහාම අලුතෙන් ඇවිල්ලා ඉන්න ප්‍රධාන ලේකම්තුමාට අපි යෝජනා කරනවා. මේ පරිසර අමාත්‍යාංශය තිබෙන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ නිසා මධ්‍යම රජයේත් දායකත්වය ඇතිව පවිත්‍ර ගංගා වැඩ සටහන නැවත පටන් ගන්න කියලා. කැලණි ගඟ පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය නැවත පටන් ගන්න කියලා. මහාචාර්යවරු ආවා. විශ්ව විද්‍යාලවල මේ සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ අය ආවා. ඒ සියලුදෙනා කිව්වා. අද කොළඹ නගරයේ ජීවත්වන බහුතරයක් මිනිස්සු පානීය ජලය විධියට ගන්නේ, අපිරිසිදු ජලය කියලා. ලංකාවේ පිරිසිදුම වතුර තිබෙන්නේ, ලබුගම සහ කලටුවාව ජලාශ දෙකේ කියලා ඒ පවිත්‍ර ගංගා වැඩ සටහනේදී කිව්වා. තවමත් දූෂණය නොවී තිබෙන්නේ මේ වැව් දෙකේ වතුර. ඒ වැව් දෙකත් කැලණි ගඟ ඉස්මත්තේ තිබෙන්නේ. නමුත් කැලණි ගඟේ වතුර ඒකට මුසු වෙන්නේ නැහැ. එතැනින් ගන්න වතුර අද කොළඹ නගරයට එන්නේ නැහැ. ඒක මැදදී නතර කර ගන්නවා. කොළඹට දෙන්නේ අඹතලෙන් එන වතුර. බහුතරයක්. අඹතලෙන් තමයි දූෂිතම වතුර පිරිසිදු කිරීම සඳහා ගන්නේ. මම දන්නේ නැහැ. මොන යන්ත්‍ර පාවිච්චි කළත් ඒ බැර ලෝහ ප්‍රමාණය අයින් කරන්න පුළුවන්කම තිබෙනවාද කියලා. යන්ත්‍රසූත්‍රවලට ඒක කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ නැහැ. අවසාන දූෂිත ද්‍රව්‍යය අයින් කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ අය දූෂණය අයින් කරන්න දාන සමහර රසායනික ද්‍රව්‍ය මේ වතුරත් එක්ක අපට බොන්න සිද්ධවෙනවා. ඒ නිසා රසායන ද්‍රව්‍ය දාලා පිරිසිදු කරන

[ ගරු මහේෂ් අල්මේදා ]

වතුර, පිරිසිදු වතුර විධියට පාවිච්චි කරන්න පුළුවන්කමක් නැහැ. එයට එරෙහිව අපට කරන්න තිබෙන්නේ, අපිරිසිදු කරන ප්‍රමාණය අඩු කරලා අර පිරිසිදු ස්වාභාවික වතුර පානය සඳහා ගන්න සලස්වන එක. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ගඟ දූෂණය නොවී තියාගන්න එක තමයි අපි සතු වගකීම. දූෂණය වුණු වතුර පිරිසිදු කරලා ජනතාවට දෙනවාට වැඩිය දූෂණය නොවී ගඟ තියාගන්න අපි කටයුතු කරන්න ඕනෑ. ඒකට ප්‍රධාන වශයෙන් කටයුතු කරන්න ඕනෑ, මේ හා සම්බන්ධ වුණු ආයතන. ඒ නිසා මේ ආයතන සියල්ල සම්බන්ධ කරලා සාකච්ඡාවක් ඇති කරන්න ඕනෑ, මේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ නොකර. මේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කළොත් මේවැඩේ වෙන්නෙත් නැහැ. ඒ සාකච්ඡාව වෙන්නෙත් නැහැ. වැඩක් නැති පණ්ඩිතකම් ටිකක් අහලා අපට යන්න සිද්ධ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් ගරු මන්ත්‍රීතුමා, එතුමා අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කරගන්න අදහස් කළේ දරුවන්ට මේ ගැන කියා දෙන්න. පරිසරය ගැන.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔව්. දරුවන්ට කියා දෙන්න ඕනෑ, මේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කරගන්නේ නැතිව. මම ඒකයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැතිව ඒක කරන්න බැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

විදුහල්පතිවරු හරහා අධ්‍යාපන අධ්‍යක්ෂවරු හරහා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමාත්‍යාංශය අනිවාර්යයෙන් සම්බන්ධ වෙන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අධ්‍යාපනයේ වෙනත් අය හරහා ඒක කරන්න. මේ බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශය කියන එක -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇමතිතුමායි, අමාත්‍යාංශයයි නැතිව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සම්බන්ධ කරගන්න එපාය කියන යෝජනාව මම කරන්නේ. ගුරුවරු සම්බන්ධ කරගන්න. දරුවෝ සම්බන්ධ කරගන්න. විදුහල්පතිවරු සම්බන්ධ කරගන්න. හැබැයි අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කරගත්තොත් නම් ශත පහක වැඩක් වෙන්නේ නැහැ. ඒක නිසා මේක දරුවන්ට කියලා දෙන්න ඕනෑ. ගඟ ආරක්ෂා කිරීම දරුවන්ට කියලා දෙන්න ඕනෑ. ගඟේ ජලයේ වැදගත්කම දරුවන්ට කියලා දෙන්න ඕනෑ. මේ රජයේ ආයතන සියල්ල ගෙනැල්ලා ඒවා නිසි පරිදි ක්‍රියාත්මක වීම ආරම්භ කළොත් අපට මේ ගඟ රැකගන්න පුළුවන්. ඒ ගඟ රැකුණේ නැත්නම් අපි කවුරුත් දන්නේ නැහැ, අපි සියලුදෙනා අප විසින්ම අපේ අවසානය ළං කර ගන්නවා කියලා. ඒ නිසා අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. ඉතාම කාලෝචිත යෝජනාවක්. ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක්. ඒ නිසා මේ සභාවේ අපි සියලුදෙනාම අවධානය යොමු කරලා ඒ යෝජනාව යථාර්ථයක් කරන්න අපට දෙන්න පුළුවන් දායකත්වය දශමයක්ද, ඒ දශමය එකතු කරන්න කටයුතු කරමු කියන කාරණය මතක් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා.12.51 ]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව පිළිබඳව කථා කරන්න ප්‍රථම අද පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී මගේ නම නියමින් සහ අනියමින් සඳහන් කරමින්, ඒ වාගේම මම නියෝජනය කරන පක්ෂයේ නම සඳහන් කරමින් අපේ කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරනු ලැබුවා. මම හිතන්නේ මගේ ගෞරවයට සහ කීර්තියටත්, මගේ දේශපාලන යහපැවැත්මටත් හානිකරවන විධියේ ප්‍රකාශයක්

තමයි සිදු කරනු ලැබුවේ. එතුමා කරනු ලැබූ ප්‍රකාශය තුළින් මගේ වරප්‍රසාද කඩවීමක් සිදු වෙලා තිබෙනවා. එතුමා මට දිගින් දිගටම කේවට්ටයා යන විශේෂණ පදයකින් හැඳින් වූවා. අපේ මහෞෂධ උපාලි කොඩිකාර මැතිතුමාගේ කථා පිළිබඳව මම දීර්ඝ වශයෙන් කාලය නාස්ති කරන්න කැමැති නැහැ. එතුමාගේ හැඩකාර, කටකාර ඒ වාගේම තව වචනයක් කියන්න වෙනවා. ඒ වචනය කිව්වොත් එතුමාටත් හොඳ නැහැ. මේ සභාවටත් හොඳ නැහැ. ඒක නිසා මම ඒවා පිළිබඳව යමක් කියන්න කැමැති නැහැ. ගෙවී දින කිහිපය තුළ අන්තර්ජාලයේ සහ සමාජ මාධ්‍යය තුළ නාම ලේඛනයක් පළ වුණා. ඒ තමයි මේ අපකීර්තිමත් මූල්‍ය අපරාධයක් වුණු බැඳුම්කර වංචාවට අදාළව. ඊකට ප්‍රධාන චූදිතයා විධියට ඉන්න මේ මූල්‍යය ආයතනය පර්පචුවල් ට්‍රෙසරිස් සමාගමෙන් මුදල් ලබා ගත්තාය කියන නාම ලේඛනයක් අන්තර්ජාලයට මුදාහැරලා තිබුණා. ඒක කිසිම වගකීමක් දරන එකක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේක පටලවා ගන්න එපා. දැන් ඔබතුමා කථා කරන්නේ යෝජනාව සම්බන්ධව. අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාගේ. යෝජනාවට කථා කරන්න. දෙක පටලවා ගන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

අන්තර්ජාලයේ සඳහන් වුණු නාම ලේඛනය තුළ මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු දෙදෙනෙකුගේ නම් සඳහන් වෙලා තිබෙනවා. ඉතින් මගේ නම විතරයි සඳහන් කළේ. තවත් මන්ත්‍රීතුමියෙකුගේ නමකුත් සඳහන් වෙලා තිබුණා. ඒක මට ප්‍රශ්නයක් නැහැ. ගැටලුව තිබෙන්නේ, මේ ඉදිරිපත් කරලා තිබෙන fake news එක ඒ කියන්නේ කූඨ ප්‍රවෘත්තිය පිළිබඳව මේ වන විට මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, සයිබර් අපරාධ කොට්ඨාශයට ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේක සයිබර් අවකාශයට, අන්තර්ජාලයට ඒ වාගේම වයිබර්, ෆේස්බුක් වලට කවුද මේක නිකුත් කළේ කියන එක පිළිබඳව සොයා බලන්න කියලා පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා ඒ පැමිණිල්ල මම කරලා තිබෙනවා. මේකේ සත්‍ය අසත්‍යතාවය ඉදිරි කාලයේදී පැහැදිලි කරගන්න පුළුවන්කම ලැබෙයි. ඒක නිසා මේ අසත්‍ය ප්‍රකාශ පදනම් කරගෙන අපේ කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කරන ප්‍රකාශ පිළිබඳව ඇත්ත වශයෙන්ම මගේ කනගාටුව පළ කරන්න කැමැතියි. ඒක ඇත්ත වශයෙන්ම හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න පුළුවන් නම් හොඳයි. නමුත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම ඒ වෙලාවේ සභාගර්භය තුළ සිටියේ නැහැ. මම නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමා සිටියේ. මම සොයලා බලලා ඔබතුමාට අපහසයක් වෙන ඒවා බලලා මම අයින් කරලා දාන්නම්.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

හොඳයි. දැන් අපේ අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ඉතාම කාලෝචිත, ඒ වාගේම ඉතා වටිනා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතුමා හැමවිටම අදහස් දැක්වීමේදී යම්කිසි විද්‍යාත්මක පදනමක් මත, තාක්ෂණික කරුණු මත තමයි අදහස් ඉදිරිපත් කරන්නේ. දැන් අපි සියලුදෙනාම දන්නවා, මේ කැලණි ගං මිටියාවත සහ කැලණි ගඟ පිළිබඳව ජනප්‍රවාදයේ කොතෙක් දේවල් තිබෙනවා. ජනශ්‍රැතියේ යම් යම් දේවල් තිබෙනවා. කවි සීපද තිබෙනවා. ඒ වාගේම මේ කැලණි ගඟ අපේ ප්‍රධාන ගංගා අතර ඉතාම වටිනා ගංගාවක් විධියට අපි හඳුනා ගන්නවා. දැන් අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන දේශපාලන පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර මැතිතුමා තමන්ගේ දේශපාලන පන්ති පහේ එක පන්තියක් විධියටම විශේෂයෙන්ම මේ ඉන්දියානු ව්‍යාප්ත වාදය කියන ඒ පන්තිය යටතේම ඉදිරිපත් කරන කාරණයක් තමයි, මේ මධ්‍යම කඳුකරය කොහොමද ජනාවාස වුණේ කියන එක. මේ වතු ආර්ථිකයත් එක්ක, ඒ වාගේම යටත් විජිත යුගය තුළ ඇති කරපු තේ වගාව, කෝපි වගාව සහ අනිකුත් වගාවන් නිසා කොහොමද මේ ජල පෝෂක ප්‍රදේශය සම්පූර්ණයෙන්ම විනාශ වුණේ. ඒ වාගේම සෝදාපාළුව සිදු වුණේ කොහොමද? ගං ඉවුරු ඛාදනය වුණේ කොහොමද? ඒ ප්‍රදේශවල හිටපු ජනතාව මේ ගංගා පල්ලෙහාට, මිටියාවත්වලට කොහොමද ආවේ කියන එක පිළිබඳව ඉතා කදිම පැහැදිලි කිරීමක් කරලා තිබෙනවා. ඒ වාගේම වාමාංශික ව්‍යාපාරයේ අපි පිළිගන්නා නායකයෙක්. ඒ තමයි එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා. "ඉදිරි මග" කියන එතුමාගේ පොතෙත් මේ ගංගා කොහොමද පැවතුණේ. ඒවායින් අපේ රට සාරවත් වුණේ කොහොමද? අපේ ජන පෝෂක ප්‍රදේශ මොනවාද කියන එක ඉතා

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

හොඳින් පැහැදිලි කරලා තිබෙනවා. දැන් අපි මේ කැලණි ගඟ දූෂණය වීම, එය රසායනිකකරණය වීම, ඒක අද භාවිතයට ගන්න බැරි තරම් සම්පූර්ණයෙන් විනාශකාරී තැනකට ගමන් කිරීම පිළිබඳව සාකච්ඡා කරනවා. ඉතින් අපි මෙතෙක් කලක් විශේෂයෙන්ම අපි අනුගමනය කරපු අපේ ආර්ථික ප්‍රතිපත්ති, අපේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති, ඒ වාගේම අපේ කර්මාන්ත ප්‍රතිපත්ති, ඒ වාගේම ජනාවාස ඇති කිරීම මේ සියල්ල පාදක වෙලා තිබෙනවා, මේ ගංගාව දූෂණය වෙන්න. ඒක නිසා අපට මේවායින් සම්පූර්ණයෙන් වියුක්ත වෙලා කථා කරන්න බැහැ. අපි ඒ ඒ අවධීන්වල අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්ති, සැලසුම් අවසාන වශයෙන් මේ ගංගාවල දූෂණයට ඍජුව හෝ වක්‍රව බලපාලා තිබෙනවා. අපි දන්නවා, විශේෂයෙන්ම එක්තරා කාලයකදී අපි පරිසරය ගැන එතරම් සැලකිලිමත් වුණේ නැහැ. අපි ඊට වඩා වැදගත් වුණේ විශේෂයෙන්ම කර්මාන්ත ඇති කිරීමයි. ඒ වාගේම ජනාවාස ඇති කිරීම. ඉතින් ඒ වෙනුවෙන් කර්මාන්ත පුරවර ඇති කළා.

ඒ වාගේම මේ ගංගා දෙපස ජනාවාස ඇති වුණා. ජනාකීර්ණ වුණා. ඒ වාගේම අන්ත දුගී පිරිස් ඇවිල්ලා පැල්පත් ඉදි කර ගත්තා. ඒවත් එක්ක ජීවනෝපාය මාර්ග ඇති වුණා. ඒ වාගේම ඒ ගංගාව තුළ අපි දැක්කා විශේෂයෙන්ම වැලි ගොඩදැමීම. මේකත් එක්ක ඇති වුණු ඉවුරු ඛාදනය. ඒ වාගේම විශේෂයෙන්ම මේ ගංගා දෙපස ඉදි කරලා තිබෙන කර්මාන්තශාලා. හොටෙල්. ආපනශාලා. මේ සියල්ල මේ ගංගාවත් එක්ක සම්බන්ධ වුණා. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි අපි පිළිගන්නවා, අද මේ ගඟ ඉතාම අපිරිසිදු තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියලා. දූෂිත තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ලෝකයේ බොහොමයක් රටවල්වල මේ තත්ත්වය ඇති වුණා. එංගලන්තය ගත්තත්, චීනය ගත්තත්, ජර්මනිය ගත්තත් - ප්‍රංශය ගත්තත්, ප්‍රංශයේ රයින් ගඟ. මේ හැම එකක්ම මේ ආකාරයෙන්ම දූෂිත වුණා. නමුත් පසුකාලීනව ඒ කට්ටිය පරිසරයට වටිනාකමක් ලබා දෙමින් ඒ ගංගා දියුණු කරන්න, සංවර්ධනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ තුළින් තමයි ඒ ගංගා ආරක්ෂා කරගන්න, ඒවා විධිමත් කරන්න පුළුවන්කම ලැබුණේ. ඒ වාගේම ඒ තුළින් යම්කිසි සාපේක්ෂ වටිනාකමක්, ආර්ථික වටිනාකමක් උපයා ගන් පුළුවන්කම ලැබුණේ. දැන් මොකක්ද මේ කැලණි ගඟෙන් අපි කරන්නේ. අද කැලණි ගඟ අපි පාවිච්චි කරන්නේ, සම්පූර්ණයෙන්ම අපද්‍රව්‍ය බැහැර කරන මාධ්‍යයක් විධියට තමයි කැලණි ගඟ අද පාවිච්චි කරන්නේ. ඉතින් ඒකේදී ප්‍රධානම දේ අද අපට අවශ්‍යයි, මේ කැලණි ගඟේ ගං ඉවුර සංවර්ධනය කරන්න ඕනෑ. කැලණි ගඟේ ගං ඉවුර සංවර්ධනය කරනවා කියන්නේ මේකේ පැති බැම් දාලා, ගල් බැම් දාලා ඒක විධිමත් ක්‍රමවේදයකට සකස් කළ යුතුයි. ලෝකයේ රටවල්වලට ගියාම අපේ සභාපතිතුමා නිරන්තරයෙන් මම හිතන්නේ විදේශ සංචාරවල නිරතවෙලා තිබෙනවා. එතුමාට මම හිතන්නේ මේ ආශ්‍රිතව තිබෙන ගංගා දැක බලා ගන්න පුළුවන් වෙලා ඇති. ඒ ගංගා හැම එකක්ම සංවර්ධනය කරලා තිබෙනවා. එහෙමනම් පළමුවැනි දේ තමයි විශේෂයෙන්ම මේ ගංගා ඉවුරු සංවර්ධනය කරන්න ඕනෑ. මම කියන්නේ නැහැ, මුළු කැලණි ගඟ දෙපසම මේ ආකාරයට සංවර්ධනය කරන්න පුළුවන් කියලා. අඩුම වශයෙන් පෑලියගොඩ - ඒ කියන්නේ මේ කැලණි ගඟ මුහුදට වැටෙන මෝය කට ගාව ඉඳලා අඩුම වශයෙන් කඩුවෙල දක්වාවත් මේ ඉවුරු දෙපස සංවර්ධනය කරන්න පුළුවන්කම ලැබුණොත් අන්න ඒ තුළින් අපට පුළුවන්කම ලැබෙනවා පළමුවෙන්ම මේ කැලණි ගඟට අවශ්‍ය රැකවරණය, ආරක්ෂාව මුලින්ම දෙන්න. මොකද, දැන් මේකේ ඉවුරු කැඩී කැඩී යනවා. මේ තුළ පාංශු ඛාදනයක් සිදු වෙනවා කියලා විශාල වශයෙන් අපට පේන්න තිබෙනවා. ගංවතුර කාලයට අපට පේනවා මේ ගඟේ පාට මොකක්ද කියලා. සම්පූර්ණයෙන්ම කහ ගඟ වාගේ. චීනයේ තිබෙන කහ ගඟ වාගේ. ඇත්ත වශයෙන්ම මේ තිබෙන පස තමයි සම්පූර්ණයෙන්ම සෝදාගෙන යන්නේ. ඒක සාරවත් පස වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මේ තිබෙන රසායනික ද්‍රව්‍ය, මේ සියලු දේවල් එකතු වුණු ඉතාම විෂ ගුලියක් විධියට මේ කැලණි ගඟට මේ සියලු දේවල් එකතු වෙනවා.

ඒ නිසා මේක මම හිතන්නේ නැහැ, පළාත් සභාවෙන්, ප්‍රාදේශීය සභාවෙන්, පළාත් පාලන ආයතනයෙන් හෝ මධ්‍යම රජයෙන්වත් මේ සඳහා අවශ්‍ය කරන පිරිවැය දරන්න හැකියාවක් අප රට සතුව තිබෙනවා කියලා. අනිවාර්යයෙන්ම අපට ආසියානු සංවර්ධන බැංකුව හෝ වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින් දිගුකාලීන ණය පදනමක් මත තමයි මේ ගං ඉවුරු සංවර්ධනය කරන්න පුළුවන් වන්නේ. ඉතින් ඒක අනිවාර්යයෙන්ම කළ යුතු දෙයක්. දැන් මේ වන විට ඒ සම්බන්ධයෙන් මහ නගර සහ බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ අවධානය යොමු

වෙලා තිබෙනවා. ඒ සඳහා යම්කිසි ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් එක්ක අපි අවබෝධතා ගිවිසුමක් අත්සන් කරමින්, ඒ හරහා තමයි මේ ගං ඉවුර සංවර්ධනය කරන්න පුළුවන් වන්නේ.

ඒ වාගේම අපි කියන්න ඕනෑ. දැනට තිබෙන පරිසර නීති අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන්න ඕනෑ. දැන් අපි කාටවක්වත් කියන්න බැහැ, බියගම නිදහස් වෙළඳ කලාපය එතැනින් අයින් කරන්න කියලා. ඒ වාගේම කඩුවෙල, බියගම ඒ අවට තිබෙන අනිකුත් සියලුම කර්මාන්ත, මෙතුමා ජීවත්වන ප්‍රදේශය අපි දන්නවා. අද විශාල කර්මාන්ත පුරයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ එක කාලයක් මමත් ජීවත් වුණා. ඒ කාලයේ තිබුණු තත්ත්වය නොවෙයි. අද තිබෙන්නේ. අද සම්පූර්ණයෙන්ම කාර්මීකරණය වෙලා. අද සම්පූර්ණයෙන්ම අපට පේනවා, ඒ ප්‍රදේශය ජනාකීර්ණ තත්ත්වයට පත් වෙලා. කාර්මීකරණය වෙලා. මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි පසුබිමක්, වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙනවා. බියර් කර්මාන්ත ශාලා ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තවත් බීම වර්ග නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලා ඇවිල්ලා තිබෙනවා. අද සම්පූර්ණයෙන්ම භූගත ජල ස්ථරයේ අසමතුලිතතාවයක් ඇති වෙලා තිබෙනවා. ඒවා නිසා සමහර තැන්වල ළිං සම්පූර්ණයෙන්ම හිඳිලා ගිහිල්ලා තිබෙනවා. මේ වාගේ විශාල පාරිසරික විපර්යාසයක් සහ ඒ වාගේම ඒ අවට සාමාජීය ජීවිතයේත් විශාල වෙනස්කම් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ සියල්ල පිළිබඳ අවධානය යොමු කරලා දිගු කාලීන සැලැස්මක් යටතේ මේ කැලණි ගං ඉවුරු සංවර්ධනය කිරීම අවශ්‍යයි.

ඒ වාගේම ගං ඉවුර දෙපස ඉන්න පැල්පත් වාසීන්. මේ පැල්පත් වාසීන් සම්බන්ධයෙන් යම්කිසි ක්‍රමවේදයක් අවශ්‍යයි. මේ අය අනවසර පදිංචිකරුවන්. ඔවුන් විවිධ හේතුමත ඇවිල්ලා මේ ගං ඉවුරේ තමයි පදිංචි වෙලා ඉන්නේ. ඒ වාගේම ගං ඉවුරට තිබුණු ස්වාභාවික රැකවරණය අද නැති වෙලා තිබෙනවා. එදා අපි දැක්කා උණ පඳුරුවලින්, මේ ගං ඉවුර ආරක්ෂා වුණා. විශාල උණ වගාවක් තිබුණා. උණ වගාවක් කියන්නේ, ඒක මේ කවුරුවක්වත් ඇවිල්ලා කරපු වගාවකට වඩා ස්වාභාවිකව ඇති වුණු උණ වගාවක්. උණ ගස්. උණ පඳුරුවලින් තමයි මේ ගං ඉවුරු ආරක්ෂා වුණේ. අද අපට පේනවා, ඒවා කැඩි කැඩී, කැඩි කැඩී යමින් ගඟ පළල් වෙමින් තිබෙනවා. ඒ නිසා මේ අති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව අපි විධිමත් සාකච්ඡාවක් ඇති කර ගනිමින්, විද්‍යානුකූල පදනමක් මත ඉඳගෙන, ක්‍රමානුකූලව, මම හිතන්නේ ඉදිරි වසර 20 තුළවත් මේ ගං ඉවුර සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළකට යන්න ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන්ම කැලණි ගඟට අපද්‍රව්‍ය බැහැර කරන මේ කර්මාන්ත සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න ඕනෑ. පරිසර නීති තිබෙනවා. නැතිවා නොවෙයි. හැබැයි, ඒ පරිසර නීති ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මධ්‍යම පරිසර අධිකාරිය වෙන්න පුළුවන්. අනිකුත් පරිසරයට සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන ආයතන වෙන්න පුළුවන්. නමුත් ඒවා නිසි පරිදි ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ වාගේම ඉතාම හානිකර කර්මාන්ත තිබෙනවා නම්, අකැමැත්තෙන් නමුත් ඒ කර්මාන්ත එහෙමනම් වසා දාන්න කටයුතු කරන්න ඕනෑ. අපි දන්නවා, රතුපස්වල ප්‍රදේශයේ ඇති වුණු ප්‍රශ්නයේදී අවසාන වශයෙන් ඒ කර්මාන්ත ශාලාව ඒ ප්‍රදේශයෙන් ඉවත් කරන්න සිද්ධ වුණා. ඒකට හේතු පාදක වුණු සත්‍ය කරුණු මොනවාද කියන එක විද්‍යානුකූල කරුණු ද කියන එක සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. ඒක පිටිපස්සේ දේශපාලනික අභිප්‍රායන් තිබුණා ද කියලා ප්‍රශ්නයකුත් තිබෙනවා. කෙසේ නමුත් මේවා පිළිබඳව විද්‍යාත්මක පදනමක් මත මේ ගංගා ඉවුරු සංවර්ධනය කිරීම තුළින් පමණයි කිසියම් ආකාරයකට හෝ මේ තත්ත්වය අපට පාලනය කරන්න පුළුවන් වන්නේ කියන එකයි මගේ අදහස. ඒ නිසා අපේ අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව ඉතාම කාලීන වැදගත් යෝජනාවක්.

ඒ වාගේම බස්නාහිර පළාත තුළ අපට වැදගත් ගංගා දෙකක් තිබෙනවා. එකක් කැලණි ගඟ. අනික් එක කළු ගඟ. දැන් අද කළු ගඟේ තත්ත්වය ගැන අපේ අවධානය යොමු කරන්නේ නැහැ. අද කළු ගඟ මොකද වෙලා තිබෙන්නේ? ස්වාභාවික වැලිපරයක් විධියට තිබුණු කැළිඩෝ වෙරළ තීරය අද සම්පූර්ණයෙන්ම අහිමි වෙලා ගිහිල්ලා තිබෙනවා. එදා ඇති වුණු ඒ ගං වතුර තර්ජනය නිසා කළු ගඟේ පාලම, කළුතර පාලම ඒ වෙලාවේ vibrate වුණා. ඒක නිසා මේක කඩාගෙන යයි කියලා අපි හිතුවා. ඒ නිසා කෘතිම විධියට මෝය කටක් හැදුවා. මෝය කට පළල් කළා. අලුත් මෝය කටක් හදලා ඉක්මණින් වතුර ටික බැස්සුවා. ඒකත් එක්ක අර තිබුණු වැලිපරය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගියා. අපි හිතුවා,ස්වාභාවික මේ වැලිපරය නැවත ඇති වෙයි

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

කියලා. නමුත් ඒක ඒ ආකාරයෙන් සිද්ධ වුණේ නැහැ. ඒක නිසා කැළිඩෝ වෙරළ තීරය කියන එක අද අපට අහිමි වෙලා තිබෙනවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? ඒ මෝය කටින් වැහෙන්නේ නැහැ. ස්වාභාවික වැලි පරය හැදෙන්නේ නැහැ. දැන් මුහුදු වතුර කළු ගඟ හරහා වේගයෙන් රට ඇතුළට කාන්දු වෙමින් තිබෙනවා. එහෙමනම් අපි ඒ අවස්ථාවලදී ගනු ලබන යම් යම් තීන්දු තීරණ නිසා මෙවැනි තත්ත්වයන් පිළිබඳව අපි කාටවත් පුරෝකථනය කරන්න බැහැ. මේකෙන් අනාගතයේ ඇති වන ප්‍රතිවිපාක මොනවාද? ඒකෙන් ඇති වන බලපෑම මොකක්ද අපි කාටවත් තක්සේරු කරන්න බැහැ. කෙසේ නමුත් අපි කිසියම් ආකාරයකට විද්‍යානුකූල කරුණු මත පදනම් වෙලා මේවාට අවශ්‍ය කරන පිළියම් යෙදීම අවශ්‍යයි.

ඒ නිසා මේ ගංගා දෙක ආරක්ෂා කර ගැනීම ඉතාම වැදගත්. අද මේ ගංගා දෙකටම ලවණ ජලය මුසු වෙලා තිබෙනවා. මුහුදු ජලය එකතු වෙමින් තිබෙනවා. පානීය ජල ප්‍රශ්නයක් අනාගතයේදී ඇති වෙන්න පුළුවන් විතරක් නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ ගංගාවලට දැන් බහින්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. ඉතාම විෂ රසායනික ද්‍රව්‍ය - මම හිතන්නේ සියදිවි නසාගන්නවත් කවුරුවක්වත් මේ ගංගාවලට පනින්න කැමැති නැහැ. ඒ වාගේ තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ගංගාවල ඉන්න මත්ස්‍යයින් ආහාරයට ගන්නත් බැහැ. මේවායේ ජීවනෝපාය මාර්ග විධියට කරපු වැලි ගොඩ දැමීම වාගේ දේවලුත් අද කරන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. විවිධ සමේ රෝග ඇති වෙමින් තිබෙනවා. වෙනත් ආසාදන තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. සංකූලතා ඇති වෙලා තිබෙනවා. ඒක නිසා මේ කැලණි ගඟ අපි අනිවාර්යයෙන්ම දියුණු කරන්න ඕනෑ. සංවර්ධනය කරන්න ඕනෑ. හැබැයි, මම එකක් පැහැදිලිව කියනවා. මේ සඳහා රජයක් විධියට අපට අවශ්‍ය කරන පිරිවැය දැරීමේ හැකියාවක් මේ මොහොතේ නම් නැහැයි කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. ඒ සඳහා ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් සමඟ අපි යම්කිසි එකඟතාවයක්, ගිවිසුමක් ඇති කර ගනිමින් මේ ගං ඉවුර සංවර්ධනය කිරීම තමයි පළමුවැනිම අදියර කියන එක අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට මතක් කර දෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අර රීති විධියට 16(1) යටතේ ඔබතුමාට මතක් කරනවා, සභාවේ ගණපූරණය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති හැදීම අපි කට්ටිය එකතු වෙලා හැදුවේ. මගේ තනි රීතියක් නොවෙයි. මාස ගණනක් සාකච්ඡා කරලා, සභාවට ගෙනැල්ලා, සභාවේ අදහස් අරගෙන තමයි රීති සම්මත කළේ. රීතිවලට එකඟ නැත්නම් ඔබතුමාට පුළුවන් අමුතුවෙන් ආපසු -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම කිව්වේ ගණපූරණය නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මමත් කිව්වේ ඒකයි. ඕනෑම කෙනෙකුට රීති හදන්න පුළුවන්. සංශෝධනය කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා කිසි ප්‍රශ්නයක් නැහැ. මම හදපු රීතියක් නොවෙයි මේ තිබෙන්නේ. හැදුවේ අපි කට්ටිය. රීති කාරක සභාවක් දාලා. බොහොම කාලයක් සාකච්ඡා කරලා තමයි මේවා ගෙනාවේ. සභාවටත් ගෙනාවා.

සීනුව නාද කරන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනීගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී. පසුව ගණපූරණය ඇති විය.***

*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung, Later, a Quorum being present.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කියපු කාරණා සම්බන්ධයෙන් මම හඬ පටයට ඇහුම්කන් දීලා, මම ඒවා ඉවත් කරනවා. ඔබතුමාට අපහසයක් වුණා නම් ඒක වහාම ඉවත් කරනවා. එතුමාට අපහස වුණු කාරණා තිබෙනවා නම් ඉවත් කරනවා. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා. අපට දැන් කාලය ප්‍රශ්නයක් නැහැ. මෙරිල් ගරු මන්ත්‍රීතුමා, දැන් අපට කාලය ප්‍රශ්නයක් නැහැ. මොකද අලුත් රීති පොත අනුව අපට ප.ව. 02.00 වනතුරු යන්න පුළුවන්. ප.ව. 01.30 නොවෙයි. ප.ව. 02.00 වනතුරු යන්න පුළුවන්. දිවා

ආහාරයත් දෙනවා. ඒ නිසා ප.ව. 02.00 වනතුරු යන්න පුළුවන්. අවශ්‍ය නම් තව පැය ½ ක් ගන්නත් පුළුවන්. තව කථික මහත්වරු දෙන්නයි ඉන්නේ. කාලය ගැන ප්‍රශ්නයක් නැහැ. කථා කරන්න.

[ අ.භා. 01.11 ]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, කැලණි ගඟ සම්බන්ධයෙන් අද අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඇත්තටම මීට වසර දහයකට එහා කථා කරපු, නමුත් අපට තවමත් ඒ සඳහා නිසි උත්තරයක් සොයා ගන්න බැරි වුණු කාරණයක්. අදත් මතු කරලා ඒ පිළිබඳව සභාවේ අවධානය යොමු කරලා මේක සමාජගත කරන්න අද දවස යොදා ගත්ත එක ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම තමයි මේ සම්බන්ධයෙන් ඉතාම සක්‍රීයව මැදිහත් වුණු මන්ත්‍රීවරයකු හැටියට මටත් කිසියම්ම සතුටක් දැනෙනවා. පසුගිය උපදේශක කාරක සභාවකදී, දැනට වසර දෙකකට පමණ පෙර උපදේශක කාරක සභාවකදී මේ සම්බන්ධයෙන් කරුණු මම ඉදිරිපත් කරපු අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළා. ඒ සඳහා විශේෂ කමිටුවක් පත් කළා. ඒ පත් කරපු කමිටුවේ සම්බන්ධ වුණේ විශ්ව විද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරු. ඒ උගත් විද්වතුන් සම්බන්ධ වුණු විශේෂ අධීක්ෂණ කමිටුවක් මේ උපදේශක කාරක සභාව මගින් නම් කරලා ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඒ සඳහා කටයුතු සැලැස්සුවා. දැන් මේ වාර්තාව ලබා ගැනීම - එතුමාගේ කථාවේදීත් පැහැදිලි කළා. ඒ සමීක්ෂණ වාර්තාව ලබා ගන්නත් තවමත් අපට බැරි වී තිබෙනවා. මේක ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා හැටියට මම උපදේශක කාරක සභාවේදී නිතර නිතර මතු කරනවා. නමුත් ඒ ඇති වෙලා තිබෙන ඔවුන්ගේ ඒ සමීක්ෂණ කණ්ඩායමේ තිබෙන අභ්‍යන්තර ප්‍රශ්නයක් නිසා තවමත් මේ සම්බන්ධයෙන් නිසි වාර්තාවක් මගේ අතට ලබා ගන්න සහ මන්ත්‍රීවරුන්ට ලබා ගන්න නොහැකි වෙලා තිබෙනවා. නමුත් මේකට බස්නාහිර පළාත් සභාවේ මම හිතන්නේ ලක්ෂ අටක විතර මුදලක් ඒ අමාත්‍යාංශය මගින් විය හියදම් කරලත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ස්තුතියක් තිබෙනවා. නමුත් මීට ඉහත, වසර පහකට වාගේ ඉස්සරහා මේ බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යධූරය දැරුවා උදය ගම්මන්පිල මැතිතුමා. කෘෂිකර්ම ඇමති. එතකොට එතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් සිටි කාලයේත් මම මේක එතුමාට පුද්ගලිකවත් ඒ උපදේශක කාරක සභාවලදීත් ඉදිරිපත් කළා. කැලණි ගඟ සම්බන්ධයෙන් මම කථා කරපු දවසක එතුමා කියනවා, මන්ත්‍රීතුමා මේක අපට අයිති නැහැ. නමුත් මධ්‍යම රජයට ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවාය කියලා. මම කිව්වා, නැහැ ඔබතුමාටත් මේකේ කොටසක් තිබෙනවා. ඒ අයිති කොටස තමයි කැලණි ගඟට ජලය එකතු වන, දෙපැත්තෙන්ම ජලය එකතු වන ඒ ඇළ මාර්ග පද්ධතිය. ඇළ මාර්ග පද්ධතිය ආවත් එන්නේ බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට. එතකොට එතුමාට වගකීමක් තිබෙනවා. මම ස්ථාන පැහැදිලිව සිතියමක් හදලා අහවල් ස්ථානයෙන්, පුස්සැලි ඔයෙන් මෙන්න මේ මේ ස්ථානවල එකතු වෙනවා අප ජලය. ඒ ජලය අපවිත්‍ර කරන ස්ථාන. මළ නාලිකා ඇළ මාර්ගවලට එකතු කරපු ස්ථාන එතුමාට පැහැදිලිව මම කිව්වා. හැබැයි, පපුවට ගහ ගන්නවා දේශප්‍රේමය ගැන කියලා. දේශ ප්‍රේමීත්වයෙන් එහා එතුමාට කථාවක් නැහැ. මාතෘ භූමියේ ඒකීයත්වය සහ ඔය කියන බර වචන දාලා රටේ දේශ ප්‍රේමය, දේශීයත්වය ගැන කථා කරනවා. පරිසරය ගැන කථා කරද්දී, එතුමාට අදාළ ඒ විෂයය ගැන කථා කරද්දී එතුමා මේකෙන් කර අරිනවා.

ගරු සභාපතිතුමනි, දේශප්‍රේමය කියලා කියන්නේ දෙමළ මිනිස්සු මරව්. මුස්ලිම් මිනිස්සු මරව් කියන සටන් පාඨයට නොවෙයි. මේ රටේ ඇළ දොළ ගංගා, මේ තිබෙන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම දේශප්‍රේමියෙකුගේ ප්‍රථම කාර්යභාරය වෙනවා. ඒ නිසා ඒ කාර්යභාරයට තවත් කවුරු හරි කියනවා නම්, මේකට ප්‍රතිපාදන ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ගඟ සංවර්ධනය කර ගන්න, ඉවුරු ඛාදනය වළක්වන්න ප්‍රතිපාදන ප්‍රශ්නයක් වෙනවා නම්. ගරු සභාපතිතුමනි, අපි මොහොතකට හිතමු අපේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය අනුව එතැනට යන්න බැහැ. නමුත් ගඟට එකතු වන, ඒ එකතු කරන අපවිත්‍ර විශේෂයෙන් කැලණි ගඟ අපට සම්බන්ධ වෙන්නේ, කොළඹ දිස්ත්‍රික්කයේ 80% ක් බොන්නේ, මේ වතුර. මම ඇතුළුව, ඔබතුමා ඇතුළුව ඔය බෝතල් කළ ජලය බොන, මහා පරිමාණ ඒ පැළැන්තිය ඇර රටේ බහුතර ජනතාවක්, කොළඹ දිස්ත්‍රික්කයේ බහුතර ජනතාවක් බොන්නේ මේ කැලණි ගඟේ වතුර. අඹතලේ පොම්පාගාරයේ පොම්ප කරනවා. අඹතලේ පොම්පාගාරයෙන් සමහර දවස්වලට

[ ගරු සරත් පතිරණ ]

මඩ වතුර අපේ ගෙදර ටැප් එකෙන් එනවා බොර පාට වතුර. මේකට වගකිවයුතු ආයතනයක් නැහැ. මේ පිළිබඳව අපට හරි නිසි කළමනාකාරීත්වයක් නැහැ. මිනිස් පරිභෝජනයට සුදුසු ආකාරයෙන් ඉතාමත් පවිත්‍ර වතුර වීදුරුවක් ජනතාවට ලබා දෙන වැඩ පිළිවෙළක් නැහැ. නමුත් අපේ බිල අය කරනවා. ඒ water board එකේ නිලධාරීන් අද වැඩ වර්ජනයකට ගිහිල්ලා තිබෙනවා. නමුත් මේ වන කොට ජලය සම්බන්ධයෙන් කෙරෙන විශේෂයෙන් අඹතලේ ජල පොම්පාගාරයෙන් කොළඹ දිස්ත්‍රික්කය පුරා බෙදා හරින, ගම්පහ දිස්ත්‍රික්කයේ ඒ කොටසකට බෙදා හරින ජලය අපවිත්‍ර වීම සම්බන්ධව සොයා බලන්න අපට වගකිවයුතු ආයතනයක් නැහැ. එක් අවස්ථාවක බහු ජාතික කොම්පැනියක් විසින් කැලණි ගඟේ ජලය මහා පරිමාණයෙන් දූෂණය කරද්දී අඹතලේ ජල පොම්පාගාරයේ ඒ ෆිල්ටර් සම්පූර්ණයෙන් අයින් කරන්න සිද්ධ වුණා. ඒ පද්ධතිය සම්පූර්ණයෙන් අකර්මන්‍ය වුණා. ඒ පවිත්‍ර කරන්න ගිහිල්ලා. ඒකට වන්දි වශයෙන් කෝටි ගණනක මුදලක් ජල සම්පාදන මණ්ඩලය ලබා ගත්තා. නමුත් එතෙක් ඒ ජලය පරිහරණය කරපු රටේ ජනතාවට ඒ බීපු මං ඇතුළු අපේ කොළඹ දිස්ත්‍රික්කයේ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට ඒ හරහා සිද්ධ වුණු ශරීරගත වුණු විෂ ප්‍රමාණයට වන්දියක් කාටද ලැබුණේ? එය ලබාගන්න පුළුවන් හැකියාවක් අපට තිබෙනවාද? ඒ ජලය පාවිච්චි කිරීමෙන්, ඒ විෂ සහිත ජලය පාවිච්චි කිරීමෙන් අපේ දරුවන්ගේ ජීවිත කොයි තරම් ප්‍රමාණයකින් වසර ගණනාවකින් තමන්ගේ වටිනා ජීවිත කාලය කෙටි වුණාද කියලා අපි දන්නවාද?

අද බෝ නොවන රෝගවලින් බහුතර ජනතාවක් පීඩා විඳින්නේ මේ කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි. ලෝකයේම ජල මූලාශ්‍ර අපවිත්‍ර කරන රටවල් අතරට ඉතාමත් වේගයෙන් අපේ රට එකතු වෙමින් තිබෙනවා. මේ තරම් ජලය දූෂණය කරන රටක් ලෝකයේ දැන් නැති තරම්. ඒ ආකාරයෙන් රටක ජල සම්පත රැක ගන්න බැරි පාලකයා - රෝහණ විජේවීර සහෝදරයා 1970අගෝස්තු මාසයේ හයිඩ්පාර්ක් එකේ කරපු කථාවකට කොටසක් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා ඒක මතක් කිරීම සම්බන්ධයෙන්. ඒ රෝහණ විජේවීර සහෝදරයා එදා කියපු දේ, 1970 දශකයේදී අද මොන තරම් ප්‍රායෝගිකව අපට දැනෙනවාද ගරු සභාපතිතුමනි. ඒ වාගේම අද අපි බස්නාහිර පළාත් සභාවේ කියන දේ තවත් වසර ගණනාවකින් මේ ජලය බොන්න බැරි තත්ත්වයට පත් වුණාට පස්සේ බෝතල් කළ ජලය, අර සිංගප්පූරුව වාගේ ලෝකයේ සමහර රටවල් වාගේ පිටරටින් ජලය අපට ගෙනෙන තත්ත්වයට පත් වෙන්න තව වැඩි කාලයක් ගත වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ඒ නිසා මෙන්න මේ තත්ත්වයට රට පත් වෙන එක වළක්වන්න තමයි බස්නාහිර පළාත් සභාවේ අපි මේ නගන හඬ අඩුම තරමින් ඇළ මාර්ග ටික ආරක්ෂා කර ගන්න, මළ නාලිකා ටික ඇළ මාර්ගවලට එකතු වන ස්ථාන ටික වළක්වා ගන්න ඔය කියන නිලධාරීන්ට මේ හැකියාව තිබෙනවා. ගරු සභාපතිතුමනි, නමුත් මුදලට අල්ලසට යට වුණු සමාජයක මෙන්න මේක කර ගන්න බැහැ. ඉහළ සිට පහළම දූෂණය පිරිලා. දැන් අද මේ සභාවේත් වැඩි කාලයක් ගත වුණා අර මහ බැංකුව කඩලා ගත්ත සල්ලි ටික බෙදා ගත්ත මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුව ගැන කියලා තියෙන්නේ. ඉතින් මෙන්න මේ ඉහළ සිට අල්ලසට, දූෂණයට ලක් වුණු රටක පරිපාලනයේ මුදුන් පරාලයට හෙණ ගහලා තිබෙද්දී, පහළ ගැන අපට කිසිදු කථාවක් කරන්න බැහැ. සොයා බැලීමක් කරන්න බැහැ. ඒ නිසා මේක මුදුනින් නිවැරදි විය යුතුයි. ඉහළ නිවැරදි වෙලා, අඩුම තරමින් මේ පරිසරය ගැන හිතන අමාත්‍යවරයෙක් - ජනාධිපතිතුමාත් සියල්ල බදා ගෙන ඉන්නවා. හැබැයි, ඔහුට පරිසරය ගැන සොයන්න වෙලාවක් නැහැ. සමහර දේවල් ඔහුට මතක නැහැ. මේ කියන දේ මේ මතක නැහැ. ඒ නිසා එවැනි පරිසර අමාත්‍යවරයෙක් වෙනුවට රට ගැන හිතන පරිසර අමාත්‍යවරයෙක් වහාම අවශ්‍ය මොහොතක් මේ තිබෙන්නේ.

විශේෂයෙන් මේ ජල මූලාශ්‍ර ටික රැක ගන්න ඕනෑ ගරු සභාපතිතුමනි. අනාගත පරම්පරාවට අපි මේක රැකලා දෙන්න ඕනෑ. ඒක වර්තමානයේ ජීවත් වන අපේ වගකීමක්. අන්න ඒ වගකීම පැහැර හරින්නේ කවුද? ඒ වගකීම පැහැර හරින කිසිවෙකුට මේ සමාජයේ ඉඩක් දෙන්න ඕනෑ නැහැ. ඒ නිසා කැලණි ගඟේ දෙපස ඉවුර රැක ගන්න අපට ප්‍රතිපාදන නැත්නම් කැලණි ගඟට මෙන්න මේ විෂ ජලය එවන, ජලය අපවිත්‍ර කරන ඒ විෂ රසායනික ද්‍රව්‍ය එකතු කරන ආයතන ටිකට විරුද්ධව අපට මැදිහත් වෙන්න බැරි ඇයි? ඒ මැදිහත්වීම කළොත් අඩුම තරමින් මෙන්න මේ එකතු වන මේ කැළි කසළ බැහැර කිරීම් - අද කැළි කසළ බැහැර කරන ප්‍රධානම තැන හැටියට තෝරා ගන්නවා

ෂොපින් බෑග් එක කරකවලා ගඟට විසි කරන එක. ගඟ දෙපස. ඒ වාගේම ගඟ දෙපස අනවසර ඉදි කිරීම් වේගයෙන් සිද්ධ වෙනවා. කැලණි ගඟ ගැන කථා කරද්දී ගරු සභාපතිතුමනි, ලංකාව පුරාම මේ ආකාරයෙන් ගංගා පද්ධතිය, ඒ ඇල මාර්ග පද්ධතිය විනාශ වෙලා හමාරයි. මම දැක්කා පසුගිය දවසක පත්තරේ තිබෙනවා. කතරගම ඉදි කිරීම් කරලා තිබෙනවා මේ රටේ හිටපු ප්‍රධාන ප්‍රභූ නිලධාරීන්. ප්‍රභූ නිලධාරීන් ඉදි කරලා තිබෙනවා, පරිසරය විනාශ කරමින් පඩිපෙළ කතරගම ගඟට දාලා තිබෙන්නේ. ඒ අනෙකුත් අපද්‍රව්‍ය බැහැර කරන්නේ ගඟට. හැබැයි, අයිතිකරුවෙක් නැහැ මේකේ. අර මල්වානේ ඉඩම වාගේ. හැබැයි, ජල බිල් එනවා එතුමාගේ නමට. මේ ජනාධිපතිවරයෙක් වෙන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අදාළ නැහැ. ඔබතුමා මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

කැලණි ගඟ වාගේම ගරු සභාපතිතුමනි, මම කිව්වේ මේ රටේ පාලනය භාර ගත්ත උදවිය, මේ පරිසරය රැක ගන්න අපි භාර දෙන උදවිය රටේ ඉහළම නිලය. රාජ්‍ය නිලධාරීන්ගේ ඉහළම නිලය. ඒ නිලධාරීන් විසින් මේ සමාජය, මේ රටේ ජල මූලාශ්‍ර විනාශ කරනවා නම් ඔවුන්ගේ දැක්ම ඒක නම්, අද මේ අපේ කැලණි ගඟ රැක ගන්න පුළුවන්ද එවැනි පාලකයින්ගෙන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාවට වගකීමක් තිබෙනවා. පරිසරය ගැන හිතන, ඕනෑම දේශපාලන පක්ෂයක පරිසරය ගැන හිතන අය මේ ආයතනවලට යවන්න. එහෙම නැත්නම් අර ලිදුල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වාගේ අද ජලය විකුණා ගෙන කන මිනිස්සු නොවෙයි. අද අපට පුවත්පත්වල දකින්න ලැබෙන්නේ, මාධ්‍යවල දකින්න ලැබෙන්නේ ළමයි, ගැහැණු විකුණාගෙන කන සභාපතිවරු. මේවා ප්‍රසිද්ධ මාධ්‍යවල මේ ප්‍රවෘත්ති සිරස්තල අතරේ අපට පේන්න තිබෙනවා. එවැනි සභාපතිවරු පත් කර ගත්ත ජනතාවට දෙයියන්ගේම පිහිටයි.

ගරු සභාපතිතුමනි, ජීවයේ උල්පත වන ජලය රැක ගන්න එක අපේ වගකීමක්. ඔබතුමාගේ වගකීමක්. අපි හැමෝගේම වගකීමක්. ඒ සඳහා බස්නාහිර පළාත් සභාවේ අපි හැමෝම එකතු වෙලා මෙන්න මේ පරිසරය රැක ගන්න මේ ජල මූලාශ්‍ර ටික රැක ගන්න, කැලණි ගඟ රැක ගන්න අපි හැමෝම මැදිහත් වෙමුයි කියන ආරාධනය කරමින්, මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධව අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පිරිනමමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මට ඔබතුමාව පෙනුනේ නැහැ. කොස්තා මන්ත්‍රීතුමා දැවැන්ත චරිතයක් නේ? එතුමා ඉන්න නිසා මට ඔබතුමා ඔතැන ඉන්නවා පෙනුනේ නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ලැයිස්තුවක් දීලා තිබෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලැයිස්තුවක් දීලා තිබුණාට ඒකේ පිළිවෙළක් නැහැ. කොස්තා මන්ත්‍රීතුමා සද්දන්ත අලියෙක් වාගේ ඉන්නවා නේ. ඔබතුමාව පෙනුනේ නැහැ. ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ අ.භා. 01.23 ]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අපේ අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව මම හිතන්නේ, ගිය වතාවේදී කථා කළ යුතුව තිබුණු එකක්. නමුත් අදට කල් ගියා. එතුමා මේකේ සම්පූර්ණ විග්‍රහයක් ඉදිරිපත් කරනු ලැබුවා. මුලින්ම එතුමා මේ ප්‍රශ්නය අවබෝධ කර ගෙන එතුමාගේ යෝජනාවේ සඳහන් කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා මේ විෂය පිළිබඳව මනා විද්‍යාත්මක දැනුමක් තිබෙන කෙනෙකු හැටියට අපට වඩා එහා ගිහිල්ලා, මේකේ හානිය පිළිබඳව විද්‍යාත්මකව කදිම විග්‍රහයක් කළා. දැන් මේ කැලණි ගඟ ගැන කථා කරන්න අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා සහ කැලණි ගඟ අතර තිබෙන චෙන්ද්‍රීය සම්බන්ධය ගැන එතුමා විග්‍රහ කළා. මටත් එවැනි සම්බන්ධයක් තිබෙනවා. මොකද, මම උපන්නෙත් කොළොන්නාවේ. කැලණි ගඟ අසළ. ඒ නිසා මටත් ලොකු සම්බන්ධයක් තිබෙනවා කැලණි ගඟත් එක්ක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකද අපි උදේ හවස දකිනවා, මේ ගඟට වන හානිය. අපි දන්නවා සිරිපාදෙන් පටන් අරගෙන කිලෝ මීටර් 145 ක් ගෙවලා කැලණි ගඟ මෝදරින් මුහුදට වැටෙන්න ඔන්න මෙන්න තිබියදී, අපේ ගම පසු කරන්නේ මේ කැලණි ගඟ. ඇත්ත වශයෙන්ම මෙතැනින් පොඩ්ඩක් එහාට ගියාම තමයි ගම්පහ දිස්ත්‍රික්කයත්, කොළඹ දිස්ත්‍රික්කයත් වෙන් වෙන මායිම තිබෙන්නේ. එක පැත්තකින් මෝය කටින් දකුණු පැත්ත මෝදර කොළඹ 15 ප්‍රදේශය. අනෙක් පැත්තෙන් උතුර ප්‍රදේශය. හැඳල, හේකිත්ත, උස්වැටකෙයියාව ප්‍රදේශයත් අහු වෙන්නේ. ඇත්ත වශයෙන්ම මේ කිලෝ මීටර් 145 දිහාම බැලුවාම මට හැඟෙන දේ තමයි යම් ප්‍රමාණයක් මම මේ කැලණි ගඟ දිගේ ඇවිදලා තිබෙනවා. මට හැඟෙන දේ තමයි වැඩිම ජන සනත්වයක් තිබෙන ප්‍රදේශය තමයි මේ කොළඹ මෝදර, ඒ වාගේම කැලණිය, කොළොන්නාව, තොටලඟ ප්‍රදේශ. විශාල ජන සනත්වයක් තිබෙනවා. ඒ ජන සනත්වයක් තිබෙනවාය කියන එක අවසාන ප්‍රතිඵලය තමයි බරපතළ විධියට මේ ගඟට හානි වෙන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අපේ ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා දන්නවා. හැමිල්ටන් ඇළ ගලා ගෙන ඇවිල්ලා මීගමුව කලපුවේ ඉඳලා ඊට පස්සේ මේක කැලණි ගඟට සම්බන්ධ වෙනවා. අපි දන්නවා. එදා ලන්දේසි කාලයේ ඉඳලා ඉංග්‍රීසීන්ගේ පාලනය තිබෙන කාලය දක්වා මේක අභ්‍යන්තර ප්‍රවාහන මාර්ගය. එදා උඩහා ඉඳලා ලී ටික පල්ලෙහාට ගෙනාවේ මේ ගඟ දිගේ. අද ඒ සියල්ල අහිමි වෙලා ගිහිල්ලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම හරිම කනගාටුදායක තත්ත්වයක්. මේ කැලණි ගඟ අද අසීමිත ලෙස දූෂණය වෙලා ඉවරයි. මේකෙන් විශාල ප්‍රයෝජන ගන්න ජනතාවක් ඉන්නවා. මොකද, අපි දන්නවා කොළඹ දිස්ත්‍රික්කයේ, විශේෂයෙන් කොළඹ නගරයේ 80% ක් ජල අවශ්‍යතාවය සපුරා ගන්නේ, මේ කැලණි ගඟෙන්. අපි බොන්නේ කැලණි ගඟේ වතුර ටික. කැලණි ගඟෙන් සම්බන්ධ වුණු උල්පත්වලින් තමයි අපට ළිඳක් තිබෙනවා නම් ඒ ළිඳට වතුර ටික ගලාගෙන එන්නේ. යන්තම් කුඩා වැස්සක් වැහැපු හැටිය ඉස්සෙල්ලාම යට වෙන්නේ අපේ භූමිය. කැලණි ගඟ අසබඩ ප්‍රදේශය. ඒ නිසා අද මේ ගැන විශේෂයෙන් අවධානය යොමු විය යුතු කාලයක්, අපි දන්නවා, මේකේ ධීවර කර්මාන්තයේ යෙදෙනවා. විදුලි බලය සඳහා යොදා ගන්නවා. මැණික් ගරනවා. වැලි ගොඩ දානවා. කුණු ටිකත් බැහැර කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගෙදර වතුර බටෙත් දාලා තිබෙන්නේ ගඟට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි පරිසරයට ආදරය කරන අය ගරු මන්ත්‍රීතුමා. ජීවිතේට ඒවා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ ගඟ දෙපස ඉහළ යන කර්මාන්ත ශාලා නිසා බරපතළ හානියක් සිද්ධ වෙනවා. දූෂණයක් සිද්ධ වෙනවා. මධ්‍යම පරිසර අධිකාරිය කියනවා, පළමු වැනි එක පිරිපහදු කළ හා නොකළ කර්මාන්තවල අපද්‍රව්‍ය. දෙවැනි එක, කෘෂිකර්මාන්ත අපද්‍රව්‍ය. තුන් වැනි එක ගෘහ ආශ්‍රිත හා නගර ආශ්‍රිත බැහැර කිරීම් නිසා තමයි මේ කැලණි ගඟ

අපවිත්‍ර වෙන්නේ කියලා. දැන් කවුද මේ කියන්නේ?මධ්‍යම පරිසර අධිකාරිය තමයි මේ කටයුතු අධීක්ෂණය කරන අධිකාරිය. ඒ අධිකාරියම කියනවා, මේ කාරණා තුන නිසා කැලණි ගඟ අපවිත්‍ර වෙනවාය කියලා. එහෙම නම් කැලණි ගඟ අපවිත්‍ර වීම මේ කාරණා තුනෙන් වැළැක්විය යුතු අධිකාරිය කවුද? මේ අධිකාරිය ප්‍රශ්නය හඳුනාගෙන තිබෙනවා. හැබැයි, මේකෙන් රිංගලා යනවා. අපි දන්නවා. බොහෝ අවස්ථාවලදී මේ කර්මාන්තවලට දෙන බලපත්‍රය, පරිසර ආරක්ෂණ බලපත්‍රය සම්පූර්ණ ව්‍යාජයි. බොහෝ වෙලාවට මේක අත යට ගනුදෙනු හරහා වෙන්නේ. අපි දන්නවා, කර්මාන්ත ශාලා හිමියෝ මොකක්ද කරන්නේ කියලා. ඒ නිසා එක්තරා අවස්ථාවකදී අර බියගම කර්මාන්ත ශාලාවකින් 2015 අගෝස්තු මාසයේ මම හිතන්නේ. මම හරිනම් 2015 අගෝස්තු මාසයේ විෂ රසායනිකයක් එකතු වුණා. මේකෙන් බරපතළ හානියක් වුණා, විශේෂයෙන්ම පවිත්‍රතා යන්ත්‍රවලට. ගණන් බැලුවා. රුපියල් කෝටි 13 ක් හානිය. මම නම කියන්න කැමැති වෙන්නේ නැහැ. බහුජාතික සමාගමක්. හරියට සොයලා බැලුවොත් මේක සම්පූර්ණයෙන්ම අධිකාරියේ වැරැද්ද. මොකක්ද වුණේ? මේගොල්ලන්ගෙන් හානි පූරණය කර ගන්නවා කියලා කොන්දේසි කිහිපයක් යටතේ ආයිත් බලපත්‍රය දුන්නා. ඒ නිසා මේවාට නිසි ක්‍රමවේදයක් නැහැ. නිසි ඇගයීමක් නැහැ. ඒ නිසා මේකේ බරපතළකම අපේ ගරු මන්ත්‍රීතුමා පෙන්වලා දුන්නා වාගේම මේක එන්න එන්න ඉහළ යනවා මිසක් පල්ලෙහා යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා විශේෂයෙන්ම ජල මූලාශ්‍රය සම්පූර්ණයෙන්ම දූෂිත වෙලා. මෙතුමා කිව්වා වාගේ බතික් කර්මාන්තය තිබෙනවා. ලෝහ කර්මාන්තය තිබෙනවා. අනෙකුත් ඩයි වර්ග මේ ජලයට මුදා හරිනවා. ඒ නිසා මේ ආසන්නයේ සිටින ජනතාව, සමහර නිවාස තිබෙනවා. ඒගොල්ලෝ වැසිකිළි අපද්‍රව්‍ය යන්න ස්ථානයක් හදලා නැහැ. කෙළින්ම කැලණි ගඟට බටේ දාලා තිබෙන්නේ. අපේ ගරු මන්ත්‍රීතුමා ඇහුවා වාගේ. මේවා ගැන සොයා බැලීමක්වත් නැහැ. ඒ නිසා අපි විහින් කර ගන්නා හානි මේවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉස්සෙල්ලාම සොයා බලන්න ඕනෑ මේ තිබෙන කර්මාන්ත හැම එකකටම පරිසර ආරක්ෂණ බලපත්‍ර තිබෙනවාද කියලා. බලපත්‍ර නැති කර්මාන්ත ඕනෑතරම් තිබෙනවා. මම වගකීමෙන් කියනවා. බලපත්‍ර නැති කර්මාන්ත අපි පෙන්වලා දෙන්නම්. මේවා ඉතාම බරපතළ තත්ත්වයක්. මේකෙන් වෙන්නේ මොකක්ද? මේ ඊයම් වාගේ බැර ලෝහ, ඒ වාගේම ක්‍රෝමියම් වාගේ බැර ලෝහ, විවිධ ලවණ වර්ග, හානිකර ලවණ වර්ග. ඒ නිසා බරපතළ විධියට මේ ජලයට හානි කරලා තිබෙනවා. මේකේ ප්‍රමිතිය බලන්න කවුරුවත් නැහැ. මේකේ ජලය නාන්නවත් සෞඛ්‍යාරක්ෂිත නැහැ. නමුත් තවමත් විශාල පිරිසක් තමන්ගේ එදිනෙදා කටයුතුවලට මේ ජලය පාවිච්චි කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නොවෙයි මේක කියන්නේ. මේක කියන්නේ පරිසර අධිකාරියමයි. මේ බෙල්ට් එකේ, මේ කොළඹ ඉඳලා අවිස්සාවේල්ලයට යනකල් ප්‍රදේශයේ විශේෂයෙන්ම රග්ගහවත්ත කියන ප්‍රදේශයේ තමයි ජලය දූෂිතම කියලා සොයා ගෙන තිබෙනවා. දැන් රග්ගහවත්ත කියන්නේ කොහේද? බියගම කලාපයේ. දූෂිත අපවිත්‍ර ජලය ටික ඔක්කොම එන්නේ මෙතැනින්. ඒකයි මේකට හේතුව. එතකොට මේ වතුර ටික තමයි අපට පිරිසිදු කරලා එන්නේ. මේ වතුරවලට අපට සහතිකයක් තිබෙනවාද? මම දන්නේ නැහැ. මම ඒ ප්‍රශ්නය අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න ඕනෑ. අපට සහතිකයක් තිබෙනවාද? 100% ක් මේ ජලයේ හානිකර ලවණ වර්ග, බැර ලෝහ මිශ්‍ර වෙලා නැහැයි කියන්න. ඒවා ගැන අපට අවබෝධයක් නැහැ. ඒ නිසා මේ ජලයේ ප්‍රමිතිය ගැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, මේක ගැන නිසි සොයා බැලීමක් නැහැයි කියන එක තමයි මගේ විශ්වාසය. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා කියනවා වාගේ මේකට සියලු ආයතන එකතු වෙලා - මම කැමැති නැහැ සංචාරක අමාත්‍යාංශය හරි, සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ආයතන ප්‍රමුඛත්වයෙහිලා මේ වැඩේ කරනවාට. ඊට කලින් අපි මේ පරිසරය ආරක්ෂා කර ගන්න ඕනෑ. මේ පරිසරය ආරක්ෂා කර ගන්න, මේ ගඟ ආරක්ෂා කර ගන්න, මේ ජලය ආරක්ෂා කර ගන්න අවශ්‍ය මූලික පියවර ටික ගන්න ඕනෑ. එක්තරා අවස්ථාවකදී එක් මහාචාර්යවරයෙක් ඇවිල්ලා මාව හම්බ වුණා. එතුමා මගෙන් ඇවිල්ලා ඇහුවා, ඇයි ඔබතුමන්ලා මේ කැලණි ගඟ ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් පළාත් සභාවට යෝජනා කරන්නේ නැත්තේ කියලා. ඒ අවස්ථාවේදී මම අපේ ගරු මහ ඇමතිතුමාගෙන් වෙලාවක් අරගෙන ඒ මහාචාර්යවරයාව මුණ ගැස්සුවා. ඒ වෙලාවේදී එතුමා පැහැදිලි කරලා පෙන්නුවා. මට වෙනම වීඩියෝ පටයක් පෙන්නුවා. මේ කැලණි ගඟ ආරක්ෂා කර ගන්නේ කොහොමද කියලා. මම කියන්න හැදුවේ, මේ රටේ උගතුන් ඕනෑතරම් ඉන්නවා. මේ රටේ උගතුන්ගේ සැලසුම්

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

ඕනෑතරම් තිබෙනවා. ගොඩක් දුර යන්න ඕනෑ නැහැ. අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගේ මූලිකත්වයෙන් අපට පුළුවන් කමිටුවක් පත් කරලා යෝජනා ඉදිරිපත් කරන්න. අපට පුළුවන් කමිටුවක් පත් කරන්න. මහ ඇමතිතුමාගේ විෂය. මහ ඇමතිතුමා සම්බන්ධ කර ගෙන ඊට ඉහළ බලධාරීන්ව සම්බන්ධ කර ගෙන - මේ රටේ පරිසරය කාටද අයිති? මහ ආණ්ඩුවට. ඒ අය සම්බන්ධ කර ගෙන වැඩ පිළිවෙළක් දියත් කරන්න අවශ්‍යයි. මොකද, අපට තමයි මේකෙන් හානි වෙන්නේ. අපේ ප්‍රදේශය. කොළඹ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළාත. ඒ නිසා අපට ඕනෑතරම් විශේෂඥයෝ, දැනුම, ව්‍යාපෘති ඕනෑතරම් තිබෙනවා. මම විශ්වාස කරනවා, මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා නම් අපේ මන්ත්‍රීතුමා මතක් කළා ඕනෑම ණය දෙන ආයතනයක්. ඕනෑතරම් ආයතන සොයා ගන්න පුළුවන්. මුදල් වැය කරන්න. මේක සංවර්ධනය කරලා සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගන්න පුළුවන් කියන පදනමෙන් ඕනෑතරම් අය ඉදිරිපත් වෙයි මුදල් වැය කරන්න. සංචාරකයෝ ආකර්ශණය කර ගන්න පුළුවන් කදිම ව්‍යාපෘති තිබෙනවා, මේ කැලණි ගඟ ආශ්‍රිතව ක්‍රියාත්මක කරන්න. ඒ නිසා මේක සංරක්ෂණය කරලා ආරක්ෂා කරන්න ඕනෑ. පර්යේෂණ කරන්න ඕනෑ. ඉස්සෙල්ලා මේ ජලය ආරක්ෂා කරන්න ඕනෑ. ඊට පස්සේ ඒකාබද්ධ වැඩ පිළිවෙළකට යන්න නම් මේකේ අනෙකුත් මූලික දේවල් හදන්න ඕනෑ. ඉවුර හදන්න ඕනෑ.

ඒ වාගේම ගඟ ප්‍රමාණවත් තරම් පටු කරන්න ඕනෑ. ගැඹුර වැඩි කරන්න ඕනෑ. මුහුදු ජලය ගඟට ගලාගෙන එක වළක්වන්න ඕනෑ. මේ සියලු කටයුතු එක ව්‍යාපෘතියකින් කරන්න පුළුවන්. ඒ නිසා අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ වෙලාවේ නැහැ. මම යෝජනා කරනවා. ගරු ඔබතුමා මාර්ගයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට දැනුම් දෙන්න. මේ ප්‍රධාන අමාත්‍යවරයාට ඉතිහාසගත වෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් පටන් ගන්න පුළුවන්. ඉදිරි මාස කිහිපය ඇතුළත වුණත් මේ කටයුතු ගැන ඇත්තට වුවමනාවක් තිබෙනවා නම්. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරමින්, මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව විශේෂයෙන්ම අපේ අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මට බොහොම හැඟීමක් තිබෙනවා. මොකද, අපි කැලණි ගඟ ආශ්‍රිතව ඉන්න අය නිසා. නිරන්තරයෙන් අපේ භූමිය මේ කැලණි ගඟේ වතුරට යට වෙනවා. මේ කැලණි ගඟේ වතුර පාවිච්චි කරන අය අපේ ප්‍රදේශවල ඉන්නේ. ඒ නිසා මේක ආරක්ෂා කර ගැනීමේ ලොකු අවශ්‍යතාවයක් මට දැනෙනවා. ඒ නිසා මේ යෝජනාව ගෙන ඒම ගැන අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට යළිත් වරක් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[ අ.භා. 01.38 ]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා මේ සභාවට නිරන්තරයෙන් ඉතාම හොඳ අදහස් ඉදිරිපත් කරන මන්ත්‍රීවරයෙක්. අපි නිරන්තරයෙන් එතුමා අගය කරනවා. ඒ වාගේම තමයි එතුමා අද දිනයේත් ඉතාමත් වැදගත් මාතෘකාවක් යටතේ යෝජනාවක් ගෙන ආවා. අපි දන්නවා ලෝක ඉතිහාසය ගත්තත් ශිෂ්ටාචාරයක් නිරන්තරයෙන් බිහි වුණේ ගඟක් ආශ්‍රිතව. ගඟක තිබෙන අවශ්‍යතාවය, ජලයේ තිබෙන අවශ්‍යතාවය පිළිබඳව ලෝකයේ ආරම්භයේ සිටම තිබෙන දෙයක්. නමුත් අද වනකොට මේ කැලණි ගඟ සම්බන්ධයෙන් මේ විධියට කථා කරන්න ලැබීම ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. මෙතැන අදහස් කියනකොට ගොඩක් මන්ත්‍රීතුමන්ලා කිව්වා පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට මේ තුළින් ගඟ ගැන දැනුවත් කරන්න ඕනෑ කියලා. මම හිතන්නේ නැහැ එහෙම කියන්න ඕනෑ කියලා. පුංචි කාලයේ ඉඳන්ම අපට මේ ගඟ ගැන උගන්වනවා. මේ ගඟ කොපමණ අපට ආධ්‍යාත්මිකව නෑඹුරු කරපු එකක්ද? ආගමට සම්බන්ධ කරපු එකක්ද? මේ ගඟට, ජලයට මොන තරම් ආදරය කරන්න අපට උගන්වලා තිබෙනවාද? එහෙම තිබිලත් සමාජයේ මිනිස්සු මේ ගඟ අපවිත්‍ර කරනවා නම් හෙට දිනයේ අධ්‍යාපනය ලබා දුන්නත් ඒ දේම තමයි කරන්නේ. පුංචි කාලයේම අපට ඉගැන්නුවේ සමනල කන්ද කියන්නේ අපේ පූජනීය තැන. සිරීපාදය. මේ සමනල කන්දේ ඉඳලා දෙයක් ගලාගෙන එනවා නම් එය පල්ලෙහාට එනකොට පූජනීය තත්ත්වයෙන් තමයි අපි සැලකුවේ. කෙනෙක් කථාවට කිව්වා යමක් ලබා ගන්නවා නම් කැලණි ගඟෙන් නාලා එන්න කියලා. පවිත්‍රතාවය තමයි එතැනින් තහවුරු කළේ. එහෙම දෙයක් පුංචි කාලේ අපේ ආධ්‍යාත්මයට දීලා තිබෙනවා. ඒ වාගේම මේ හරහා ඇති වන උප සංස්කෘතීන් ගණනාවක් - පුංචි කාලේ අපට කිව්වේ සමනල කන්දේ ඉඳලා පටන් ගන්න මේ ගංගාවල් මිනි කැට, මුතු කැට, වැලි යට හංගලා තමයි මහ මුහුදට ගලා බසින්නේ කියලා. අපේ රටේ තිබෙන

සම්පත් ප්‍රමාණය, මැණික් වෙන්න පුළුවන්. මිනිරන් වෙන්න පුළුවන්. ඒ හා සමාන මුතු මැණික් මේ සියල්ල ගැන අපි පුංචි කාලේ ඉගෙන ගත්තත් මේ සියල්ල විනාශ කරන්නේත් අපි.

කනගාටුවට කාරණාව තමයි ගඟක හෝ ඔයක තිබුණු ප්‍රධාන දේ තමයි ඉවුර කියන එක. ඉවුර කියන්නේ කණ්ඩිය නොවෙයි. වැලි තලාවක් තිබෙනවා. ඒ වැලි තලාවට මැද්දෙන් තමයි ගඟක් ගලන්නේ. පුංචි කාලේ අපි මේ වැල්ලේ එරි එරී දිව්වා. මාළු කොටනවා කියලා එකක් තිබුණා. ගමේ ගොඩේ මිනිස්සු දිග පිහි අරගෙන, හෙල්ල අරගෙන මාළු අල්ලන්න කියලා යනවා. සමහර විට පෙට්ට්‍රල් මැක්ස් ලාම්පුවත් අරගෙන, පන්දම් අරගෙන එහෙම ගඟ දිගේ හැතැප්ම ගණන් යන්න තිබුණා. අද ගඟට බැහැ ගන්න තැනක් නැහැ. මේ ගඟ වෙන්න පුළුවන්, වෙනත් ගංගා වෙවන්න පුළුවන්. බහින බැහැ. දෙපැත්තේ තිබෙන්නේ ඉවුරක් හා ජල කඳක් පමණයි. කෙනෙක් බහින්න ගියා නම් රූටලා මඩ පිටින් ගඟට යනවා මිසක් ඒ ඉවුර, වැලි තලාව කියන එක අද නැති වෙලා ගිහිල්ලා. එහෙම නම් මේ සියල්ල ප්‍රජාවගේ යම් යම් ක්‍රියාකාරකම් හරහා සිදු වුණු දේවල්. ඒ නිසා මේ කැලණි ගඟ ගත්තත් අපි දන්නවා අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා උපදේශක කාරක සභාවට ගෙනාපු යෝජනාව. මහ ඇමැතිතුමා ක්‍රියාත්මක වුණා. ලොකු උත්සාහයක් ගත්තා. එතුමා පසුපස මමත් ගිහිල්ලා පානීය ජලය නිරන්තරයෙන් ලබා දෙන අත්තනගලු ඔයත් සංරක්ෂණය කරන්න ඕනෑ කියලා වැඩ පිළිවෙළක් අද පළාත් සභාවට ගෙනැල්ලා අද ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

අපේ මූලික මිනිස් අයිතියක් තමයි පානීය ජලය. මේ කැලණි ගඟෙන් අත්තනගල්ල ආසනයේ ජනතාවත් පානීය ජලය පරිභරණය කරනවා. ගෙවල් 3400 කට පූගොඩ හරහා ජලය ගේනවා. මෙන්න මේ කැලණි ගඟ ඒ තරම් අපට වැදගත් තැනක් වුණත් මේ වනකොට ඉතා අපවිත්‍ර වෙලා තිබෙනවා. එහෙම නම් මේ කර්මාන්ත ශාලා ඇති කරන කොට - අපි දන්නවා සාමාන්‍යයෙන් මිනිස්සු කියනවා කර්මාන්ත ශාලාවක් ඇති කරන කොට වැවක් ඇති කරන්නට ඕනෑ. ඒ වැවට ජලජ ශාක ඇති කරන්නට ඕනෑ. ඒ වැවට තමයි අපද්‍රව්‍ය මුදා හැරලා ප්‍රාථමික මට්ටමෙන් ජලජ ශාක හරහා යම් ප්‍රමාණයකට තමයි ගඟට මුදා හරින්නේ. එහෙම නැති වුණොත් treatment plant එකක් යන්නේ. ඒ ස්ථානවල එය පිරිසිදුකරණ එකක් හදන්නට ඕනෑ. ඒකට අපි ඇලම් කියලා වර්ගයක් පාවිච්චි කරනවා. පොලිම කියලා වර්ගයක් පාවිච්චි කරනවා. පොලිම ඩී කියලා ගම් වර්ගයක් පාවිච්චි කරනවා. මේවා හරහා ඒවා යම් ප්‍රමාණයකට - එදා අපි යාපනයේ ගිය වෙලාවේ එහෙම තැනක් අපි දැක්කා. සමහර විට වැසිකිළි පාවිච්චි කරන තැනක්. එතැන කොහොමද අපහරණය කරන්නේ කියන එක අපි දැක්කා. මෙන්න මේවා කරන්න ක්‍රමවේදයන් තිබෙනවා. මේවාට ඉතා විශාල මුදලක් යනවා. මේ treatment plant එකක් පවත්වාගෙන යන්න ගියාම ලොකු ගැටළු ඇති වෙනවා. මේවා කෙලින්ම ජලයට මුදා හරිනවා. ජලයට මුදා හැරපුවාම මේ ඇති වන උප සංස්කෘතීන් අපේ ඔයක් ගලනකොට ගඟක් ගලනවා වෙන්න පුළුවන්. මේවා ගලනකොට ඒ හරහා ඇති වෙන්නා වූ ශාක පද්ධතියක් තිබෙනවා. බට පඳුරු තිබෙනවා. උණ පඳුරු තිබෙනවා. අට්ටික්කා තිබෙනවා. හොර තිබෙනවා. කුඹුක් තිබෙනවා. වල් බෙලි තිබෙනවා. මේවා ඉවුර සංරක්ෂණය කරනවා. ඒ හරහා ඇති වුණු තව ජීවීන් ඉන්නවා. සත්තු ඉන්නවා. විවිධ පක්ෂීන් ඉන්නවා. විවිධ උරඟ සතුන් ඉන්නවා. මේ හරහා ඇති වුණු යම් යම් උප සංස්කෘතීන් තිබෙනවා. පුංචි කාලයේ අපේ අම්මලා අපට කියන්නේ පුතේ ඔයට යනවා නම් දවල්ට යන්න එපා. රෝහලේ රෙදි හෝදන වෙලාවට යන්න එපා, ඔයේ නාන්න. 10.00 ට ඉස්සෙල්ලා යන්න එපා. උදේම රෙදි හෝදනවා. ඒක තමයි අපේ පුංචි කාලයේ ලැබුණු ලොකුම පණිවිඩය. වතුර අපිරිසිදු වෙනවා නම් වෙන්නේ රෝහලේ රෙදි සේදීමෙන් පමණයි කියලා. අද වනකොට මේ සියල්ල විනාශ වෙලා. අපේ ගමේ ගැමියන් ගමට යනවා. ගිහිල්ලා කරන්නේ කල වැලක් අරගෙන කොටයක් උඩ තියලා තලනවා. කල වැල කියන්නේ ගමේ තිබෙන ශාක වර්ගයක්. මේ කල වැලට වතුර පවතින ප්‍රදේශයේ මාළු ටික ඔක්කෝම මැරිලා යනවා. සමහර විට ආඳා, ලූලා දවසක් දෙකක් ගියාට පස්සේ කඳ තුළ මැරිලා කුණු වෙලා තමයි උඩට එන්නේ. එක්කෝ අර බැටරි කෑලිවල කුඩු දාලා මාළු ටික මරලා දානවා. එක්කෝ ඩයිනමයිට් දානවා. මේ ජල සතා අල්ල ගන්න මේ විධියට කටයුතු කළාම පරිසරය දූෂණය වෙනවා. ඒ ජලජ ජීවියා විනාශ වෙනවා. ඒ වාගේ කාරණා සිද්ධ වෙනවා.

ඉතින් මේ තත්ත්වය තුළ තමයි හැම දෙයක්ම ඇති වෙන්නේ. ඒක කැලණි ගඟට කියලා වෙනස් තත්ත්වයක් නැහැ. නමුත් මම කියන්න උත්සාහ කළේ කැලණි ගඟ

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

කියන්නේ පූජනීය තැනක්. සමනල කන්දෙන් පටන් ගන්නවා කියලා පුංචි කාලේ අපේ හදවතට දෙන කොට අපි දන්නවා ඒ හරහා අවිස්සාවේල්ල ප්‍රදේශයට එනකොට රන්වල දෙවියෝ කියලා දෙවි කෙනෙක් අදහනවා. තොටියෙක් දෙවි කෙනෙක් වුණා කියලා. ඒ කාරණා කරන කොට අද ඊයේ දවසක පූගොඩ ප්‍රදේශයේ රත්තරන් මතු වුණා. මිනිස්සු කිව්වා රන්වල දෙවියෝ තමයි ගඟට මේ රත්තරන් දුන්නේ කියලා. එතකොට මේ මිනිස්සුන්ගේ විශ්වාසය ගොඩ නැඟුණා. තව ටිකක් මෙහාට එනකොට අපි දන්නවා මණිඅක්ඛිත නා රජ්ජුරුවන්ගේ කාලයේදී කැලණියට බුදු හාමුදුරුවෝ වැඩියා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රකාශ කළා. එතකොට මේ හරහා අපට කැලණි ගඟ කිව්වාම මතක් වෙන්නේ පූජනීය තත්ත්වයක්.

ඒ වාගේම අපි දන්නවා තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝ හංස සංදේශය ලියන කොට කැලණි ගඟ ආශ්‍රිතව ඇති වූ යම් යම් සිද්ධීන්, ආදර සබඳතා, ඒ තිබෙන සක්‍රියතා, ඒ ගඟේ තිබෙන්නා වූ මිනිස්සුන්ගේ දිය බුං කෙළීම්, ඒ වාගේම මිනිස්සු මේ ගඟ කොපමණ පරිහරණය කළාද? අද මේවා අපට දකින්න ලැබෙන්නේ නැහැ. තොටුපළ කියන එක අද නැති වෙලා ගිහිල්ලා. අද තොටුපළක් පාවිච්චි කරන්නේ බීලා බෝතලය බිඳලා ගඟට විසි කරලා යන්න. තොටුපළයක් හැදුවා නම් කරන්නේ අපට පාලනය කරන්න බැරි තරුණ කණ්ඩායමක් ඇවිල්ලා කෑගහලා, හූ කියලා, මාළු පුච්චගෙන කාලා, BBQ දාලා, බෝතල් ටිකත් බිඳලා ගඟට විසි කරන උප සංස්කෘතියක් ගොඩ නැඟිලා තිබෙනවා. මිනිස්සු හදන්නේ නැතුව මේ කිසි දෙයක් හදලා වැඩක් වෙන්නේ නැහැ කියන විශ්වාසය තමයි අද මට තිබෙන්නේ.

ඒ නිසා අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේකේ තිබෙන වැදගත්කම - විවෘත ආර්ථිකයක් මේ රටට හඳුන්වා දුන්නාට පස්සේ ජනතාව දැන ගත්තේ බල්ලෝ බලල්ලු මරලා හරි සල්ලි හොයනවා මිසක් සදාචාර සම්පන්නභාවය, ගුණ සම්පන්නභාවය, තමන්ගේ සමාජ වගකීම් මේ එකක්වත් මිනිස්සුන්ට වැදගත් වුණේ නැහැ. වතුරට අපවිත්‍ර කෑම ටිකක්වත් දාන්න එපා. එහෙම නැත්නම් වතුරට විෂ වර්ගයක් එකතු කරන්න එපා. පව් සිද්ධ වෙනවා කියලා මිනිස්සු අපට පුංචි කාලේ උගන්වපු දේවල් සමාජයෙන් බැහැර වෙලා ගියා. අද මේ ගඟ තමයි හැම දේටම පාවිච්චි කරන්නේ. කුණු ටික ගෙනැල්ලා දාන්න. එහෙම නැත්නම් අපද්‍රව්‍ය ටික එවන්න. එහෙම නැත්නම් යම්කිසි විනාශ කරන්න බැරි දෙයක් තිබෙනවා නම් ගෙනැල්ලා දාන්න. ඒ හරහා ගඟට ඇති වුණු දේ තමයි ගරු මන්ත්‍රීතුමා කිව්වා කිඹුල්ල ඇති කළා කියලා. නැහැ. මම දන්න විධියට අපේ ප්‍රදේශයේ මේ ගඟට තමයි ගෙනැල්ලා දාන්නේ. කුකුල්ලු මරණ අපද්‍රව්‍ය ටික, හරක්ගේ ඔළු ටික, එහෙම නැත්නම් වෙනත් වෙනත් අපද්‍රව්‍ය ටික ගඟට දැම්මාම ගඟේ පල්ලෙහා ඉන්න අර කිඹුල්ලු ඔක්කෝම උඩට එන්න ගත්තා. දැන් මිනිස්සු බයයි ගඟට බහින්න. තමන් ආදරය කරපු, තමන් නාපු, රෙදි ටික හෝද ගත්තු, වැලි ටිකක් ගොඩ දාගත්තු, මාළුවෙක් අල්ලගෙන ජීවත් වුණු මිනිස්සු අද ගඟට යන්න යම් බියක් දක්වනවා. ඒ නිසා අද මේ ජලය සම්බන්ධයෙන්, මේ කැලණි ගඟ සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන මේ කාරණා පිළිබඳව බස්නාහිර පළාත හැටියට ඇත්තටම අපි කනගාටු වෙන්නට ඕනෑ. ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා අධිරාජ්‍යවාදී යුගය තුළ මේ ගංගාවන් පාවිච්චි කරලා, මොනතරම් ප්‍රවාහනයට කටයුතු කළාද කියලා. ඔබතුමන්ලා අපි හැම දෙනාම සෝවියට් රුසියාවට ගියා. පින්ලන්තයට ගියා.

අපි දැක්කා මේ හැම ජල පහරක්ම මාර්ග බවට පත් කරගෙන තිබෙනවා. ඒවා සංචාරක කර්මාන්තය සඳහා කොපමණ වටිනවාද කියලා අපි මේ සභාවට ඇවිල්ලා කථා කළා. නමුත් එතැනින් එහාට ඒ සම්බන්ධව කථිකාවතක් නැහැ. ශ්‍රී ලංකාව කියන්නේ ඉතාමත් රමණීය රටක් නම් ඒ රමණීය රට තුළ තිබෙන හැම දෙයක්ම ඉතාම රමණීය වෙන්නට ඕනෑ. ඒ නිසා මේ කැලණි ගඟ කියන්නේ - මේ රටේ මහවැලි ගඟට ඇති වන්නා වූ යම්කිසි ගෞරවයකට වඩා වෙනත් ගෞරවයක් තමයි කැලණි ගඟට ඇති වෙලා තිබෙන්නේ. ඒ ගෞරවයට වඩා වෙනස් ගෞරවයක් තමයි කළු ගඟට ඇති වෙලා තිබෙන්නේ. නමුත් කැලණි ගඟ කියන්නේ, මේ බස්නාහිර පළාතට ආවේණික වුණු ඉතාමත් හොඳ සම්පතක්. මෙය ආරක්ෂා කර ගැනීම ඔබ අපි හැම දෙනාගේත්, රජයේත් වගකීමක්. ඒ වෙනුවෙන් අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට මගේ සුභාශිංසනත්, ප්‍රසංශාවත් පුද කරමින් ඉදිරියටත් එතුමන්ලා මේ වෙනුවෙන් කටයුතු කිරීමේදී අපෙන් දෙන්න පුළුවන් සහයෝගය ලබා දෙන බවත්, ස්තුතියත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[ පූ.භා.01.48 ]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කැලණි ගඟ සංරක්ෂණය සුරක්ෂිත කිරීම වෙනුවෙන් මා විසින් ඉදිරිපත් කරන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධව මේ වන විට හත් දෙනෙකුගෙන් සමන්විත මන්ත්‍රීවරුන් ප්‍රමාණයක් අදහස් දක්වලා තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාත් ඇතුළුව. මෙතැනදී සුවිශේෂී කාරණයක් තමයි ඒ ඒ දේශපාලන පක්ෂවල තිබෙන න්‍යාය පත්‍රයක් අනුව මන්ත්‍රීවරුන්ට කථා ලේඛනය හැදුවත් මෙතැනදී සුවිශේෂීත්වයක් දක්වනවා. කැලණි ගඟ සම්බන්ධව ආධ්‍යාත්මික බැඳීමක් තිබෙන අය ඒ ඒ දේශපාලන පක්ෂවලින් අදහස් ප්‍රකාශ කරලා තිබීම. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළුව. කැලණි ගඟට බැහැලා, කැලණි ගඟත් සමග පොර බදලා, කැලණි ගඟේ ආධ්‍යාත්මික බැඳීමත් එක්ක, ඉතිහාසයත් එක්ක බද්ධ වුණු ප්‍රමාණයක් ඒ හත් දෙනාගෙන් හය දෙනෙකුගෙන්ම අදහස් ප්‍රකාශ කරද්දී පිළිඹිබු වුණු කාරණයක්. එහෙම නම් සුභ නිමිත්තක් තිබෙනවා. මේ කැලණි ගඟ දෙපස ඉන්න මහජන නියෝජිතයින් විධියට කැලණි ගඟ සංරක්ෂණය කිරීමට දේශපාලන භේදයකින් තොරව එකාවන්ව අත්වැල් බැඳ ගත්තොත් මේ වැඩේ කරන්න පුළුවන් කියලා පූර්ව අවබෝධයක් මේ සභාව තුළ ජනිත වෙලා තිබෙනවා.

එහෙම කියන්නේම මේ කැලණි ගඟේ තිබෙන සුවිශේෂීත්වය. යම් කෙනෙක් කැලණි ගඟට බැහැලා ඒකේ ආස්වාදය භුක්ති විඳලා තිබෙනවාද ඔහුට මතක් වෙනවා ඉතිහාසය තුළ කොතරම් දෙයක් සංස්කෘතික වශයෙන් අපි අත්පත් කරගෙන තිබෙනවාද කියලා. ඒ සම්බන්ධව නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ඉතාමත් මැනවින් කරුණු පැහැදිලි කළා. ඒ කැලණි ගඟත් එක්ක බැඳුණු සංස්කෘතියත් එක්ක කාලයක් ජීවත් වෙලා හිටියා මගේ මිත්‍රයෙක් විධියටත් එතුමාගේ වැඩිමහල් සහෝදරයා. අදත් මාත් සමග එකට කැලණි ගඟ අයිනේ ජීවත් වන බොහොම හිතවත් මිත්‍රයෙක් විධියට ඉන්නවා. මම දැක්කා පොඩි කාලේදී එතුමාගේ ඥාතීන් ප්‍රමාණයක් කැලණි ගඟ අයිනේ ඉතාමත් මනරම්ව ප්‍රංශ ජාතික කාන්තාවක් සමග එතුමාගේ බොහොම ඥාතීත්වයක් තිබෙනවා. ඒ කාන්තාව ප්‍රංශයේ ඉඳලා ආපු නිසා දැකපු දෙයක් තමයි, ඒ කැලණි ගඟ සංරක්ෂණය කර ගන්න කැලණි ගඟ ඇතුළේ සුලං මෝලක් හයි කරලා ගෙදරට වතුර ගන්න, කැලණි ගඟේ ඉවුර හදා ගන්න ඉතාමත් බරපතළ උත්සාහයක් ගත්තා. ඒකත් අපි දැක්කා පොඩි කාලේදී. මෙන්න මේ විධියටයි ගං ඉවුරක් තිබෙන්න ඕනෑ කියලා. අදහස් දක්වද්දී අපි දැක්කා, මෙන්න මේ විධියට කැලණි ගඟත් සමග ආධ්‍යාත්මික බැඳීමක් එක්ක විශේෂයෙන්ම සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම මේ සභාව තුළත්, උපදේශක කාරක සභාව තුළත් විශේෂයෙන් කඩුවෙල ප්‍රදේශයේත් අරගලයක් කරනවා. සමහර විට තනියෙන් ගිහිල්ලා සටන් වදිනවා. ඒ විෂ කාරක ද්‍රව්‍ය එකතු වන තැන්වලදී ඒක වළක්වන්න. ඒක නිසා අද සුභ නිමිත්තක් තිබෙනවා, මන්ත්‍රීවරුන් විධියට දේශපාලන භේදයකින් තොරව යම් නිශ්චිත වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, ඒක ජයග්‍රහණය කරන්න අප්‍රතිහත ධෛර්යකින් වැඩ කරන්න.

විශේෂයෙන්ම කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කැලණි ගඟේ අවසාන භාගය කොලොන්නාව නගරය. බරපතළ ව්‍යසනයන්ට පත් වන ප්‍රදේශයක් වුණත් කැලණි ගඟට ආදරය කරන මන්ත්‍රීවරයෙක් විධියට ඒ පොර බැඳීමට සූදානම්. ඒ සම්බන්ධව නායකත්වය දෙනවා නම් ඒ නායකත්වයත් එක්ක පෙළ ගැහිලා මේ කැලණි ගඟ සුරක්ෂිත කරන්න මැදිහත් වෙනවා. ඒ වාගේම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ආණ්ඩු පාර්ශවය නියෝජනය කරමින් කථා කරද්දී දැකපු දෙයක් තමයි අද මේ රටේ භාණ්ඩාගාරය සතුව තිබෙන දේපළ ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ මෙහෙම වැඩක් කර ගන්න කියන එක. ඇත්ත කාරණයක්. ඒක තමයි සැබෑව. ඒක තුළ අපට සිද්ධ වෙනවා විදේශ රටවල්වලට හඬා වැටෙන්න. අනේ අපට මුදල් දෙන්න මේ කැලණි ගඟ දෙපස ඉවුරු සංවර්ධනය කරන්න කියලා. ඒක කර ගන්න ඕනෑ දෙයක්. කර ගත යුතුයි. ඒ සම්බන්ධ විවාදයක් නැහැ. හැබැයි අපට පුරවැසියන් විධියට කරන්න යුතුකමකුත් තිබෙනවා. ජනතාවට ඒ සම්බන්ධව අවබෝධයක් දීලා, ජනතාව ඒකරාශී කරගෙන ඒ තොටුපළ සංස්කෘතියත් එක්ක කමිටු හදාගෙන හරියට මිනිස්සු සන්නද්ධ වුණොත් මේ කැලණි ගඟ අපවිත්‍ර කරන මිනිස්සුන්ට විරුද්ධව පෙළ ගැහෙන්න පුළුවන්.

රන්වල මුත්තා ගැන අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා. ඒක දීර්ඝ සංස්කෘතික ඉතිහාසයක්. ඒ ඉතිහාසය සම්බන්ධව බැඳිලා තිබෙන කරුණු කාරණා ඉතාමත් මැනවින් පාරම්පරිකව අපි දන්නවා. කාලය තිබෙන නිසා පුංචි පැහැදිලි කිරීමක්

[ ගරු අසෝක සපුමල් රන්වල]

කරන්නම්. එදා කෑගල්ල ප්‍රදේශයේ යම් වගකීමක් ඒ රන්වල මුත්තාට පැවරිලා තිබුණා. ඒ වගකීම අනුව කැලණි ගඟ දෙපස ජනතාව සුරක්ෂිත කිරීම. කැලණි ගඟ සුරක්ෂිත කිරීම. ආරවුල් නිරාකරණය කිරීම. දැන් හදලා තිබෙන අණපනත් විධියටම එදා පනත්වලින් සීතාවක රාජසිංහ රජ්ජුරුවොත් ඊට පෙර රජවරුත් පවරලා තිබෙනවා වගකීමක්. ඒ වගකීම තමයි කැලණි ගඟ දෙපස ජීවත් වන ජනතාව බොහොම දරිද්‍රතාවයෙන් ජීවත් වෙන්නේ. නිතරම ගංහාවෙන් ගෙවල් යට වෙනවා. ඒ වාගේම කෑම හොයා ගන්න බැහැ. මාළු තමයි ප්‍රධාන ආහාරය. ඒ නිසා වගකීමක් තිබුණා ඉහළ ගංගා ධාරයේ සතුන් ඇති කරලා, එහෙම නැත්නම් ගව පාලනය කරලා, කිරි ඔරුවකින් අරගෙන එනවා. එක අතකින් කෙණ්ඩියත්, අනෙක් අතින් කෙවිටත් අරගෙන. එහෙම එන්නේ, කැලණි ගඟේ පහළ ප්‍රදේශයට එනකොට රෑ වෙනවා. ඒ නිසා ආලෝකමත් කරන්න පුහුල් පහන් එල්ලනවා ගඟ දෑලේ තිබෙන තොටුපළවල්වල. ගඟ දෑලට මිනිස්සු එකතු වෙනවා. කෙණ්ඩියෙන් මිනිස්සුන්ට කිරි ලබා දෙනවා අර මන්ද පෝෂණ අවශ්‍යතාවය සැපිරීම සඳහා. මන්ද පෝෂණය තුරන් කිරීම සඳහා. කිරි දීලා ඊට පස්සේ නඩු විභාග කරන්න බලය තිබුණා. කැලණි ගඟ අපවිත්‍ර කරලා තිබෙනවාද? යම් යම් පවුල් අතර ආරවුල් තිබෙනවාද? කැලණි ගඟ අවට ඉන්න මිනිස්සුන්ගේ සංස්කෘතිය තුළ පුංචි ආරවුල් ප්‍රමාණයක් ඇති කර ගන්නවා දැඩි දරිද්‍රතාවය නිසා. මේවා අහලා ඔවුන්ට බලය දීලා තිබුණා අර කෙවිටෙන් දඬුවම් කරන්න. එහෙම නැත්නම් ඒ තිබෙන පුංචි ලීයෙන් දඬුවම් කිරීමේ හැකියාව තිබුණා.

මෙන්න මෙහෙම නඩු අහන, ඒ වාගේම ජනතාවගේ ආරවුල් නිරාකරණය කරගෙන, ජනතාවගේ පෝෂණය නඟා සිටුවන්න මැදිහත් වීමක් අපේ සංස්කෘතිය තුළ තිබෙනවා. මම හිතන්නේ දේව සංකල්පය අනුව, ජීවත් වුණු පුද්ගලයෙක් විධියට පැහැදිලිවම කෙටි කාලයක් ඇතුළත ඔහු දේවත්වයට පත් වෙලා තිබෙන ඒ හැකියාව මොකක්ද කියන එක අපට විද්‍යාමාන වෙනවා. ඒක නිසා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඒක ඉතා පැහැදිලිව විග්‍රහ කළා. ඒ වාගේම රජයේ මැදිහත් වීමක් ඕනෑ. පළාත් සභාවට මේකට මැදිහත් වෙන්න අමාරුයි. පළාත් සභා විෂයය පථයට පොඩ්ඩක් එහාට ගිහිල්ලා මැදිහත්වීමක් අවශ්‍යයි කියන එක පිළිගන්නවා. හැබැයි අපි පැහැදිලි කර ගන්න ඕනෑ දෙයක් තිබෙනවා. දැන් මෙතැන තිබුණු සුභ නිමිත්ත නැහැ. පළාත් සභාවටත් දෙයක් කරන්න පුළුවන්. හරියට මන්ත්‍රීවරු මැදිහත් වෙලා, ඒ මන්ත්‍රීවරුන්ට නායකත්වය අරගෙන ගඟ දෙපස ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන් නම් ඒ සම්බන්ධව පරණ සංස්කෘතියත් එක්ක බද්ධ වෙලා ඒ වැඩේ කරන්න පුළුවන් හැකියාව අපට තිබෙනවා. ඒකට ඕනෑ පළාත් සභාවේ නිල ව්‍යුහය විතරයි. මූල්‍යමය පැත්තෙනුත් දායකත්වයක් ඕනෑ. හැබැයි ඒ මූල්‍යමය දායකත්වයට වඩා වටිනාකම තිබෙන්නේ අර උවමනාව ඇති කිරීමටයි. ඒ සම්බන්ධව තමයි මම පැහැදිලි කිරීම කළේ. අධ්‍යාපන අමාත්‍යාංශය හරහා දරුවන්ව දැනුවත් කරන්න. අපේ උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළ ආකාරයට ඇත්තටම දරුවන්ව දැනුවත් කරන්න දෙයක් නැහැ. දරුවන් මේ සම්බන්ධයෙන් දැනුවත් වෙලා තිබෙන්නේ උත්පත්තියේ වර්ණ දේහවලින්. ජලයට ආදරය කරන, ගඟට ආදරය කරන, ඒ වාගේම ඒක ඉගෙන ගැනීම, ඒක නිසා අත්තනගලු ඔය ආශ්‍රිතව හැදුනු සංස්කෘතිය අපි ඉතාමත් හොඳින් දන්නවා. සියනෑ කෝරළය තුළ. මෙන්න මේ සංස්කෘතිය පොඩ්ඩක් ඔප මට්ටම් කරන්න විතරයි අධ්‍යාපන අමාත්‍යාංශය බලධාරීන් සහ පාසල් පද්ධතිය උපයෝගී කරගෙන අපට කරන්න තිබෙන්නේ.

ඒ වාගේම දූෂ්‍යකරණයට ලක් වීම සම්බන්ධව නිවැරැදි කරලීමට මැදිහත් වීම. එක පැත්තකින් දූෂ්‍යකරණයට ලක් වෙමින් පවතිනවා. එසේ ලක්වීම අවම කිරීම සහ නැවැත්වීම. අනෙක් පැත්තෙන් තමයි නිවැරැදිකරණයට මැදිහත් වෙන්න ඕනෑ. අද දවසේ අපට මේ දෙකට මැදිහත්වීමක් කරන්න පුළුවන්. තවදුරටත් දූෂ්‍යකරණයට ලක් වීම නවත්වාගන්න පුළුවන්. අනෙක් පැත්තෙන් දූෂ්‍යකරණයට ලක් වෙලා තිබෙනවා නම්, ඒවා නිවැරැදි කරන්න මැදිහත් වෙන්න පුළුවන්. ඒ සම්බන්ධව තමයි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළේ. ඒ වාගේම ගඟක තිබෙන සුවිශේෂීකමත් තිබෙනවා. වියට්නාමයයි, ඒ වාගේම තායිලන්තයයි අතර තිබෙන මීකොංට් ගඟ ඉතාමත් දුර්වල ඉවුරක් තිබුණා. නමුත් අද වනකොට ඒක සංරක්ෂණය කරලා දෙපැත්තේ මනරම් භූමියක් බවට පත් කරලා තිබෙනවා. අනෙක් පරිසර පද්ධතියට වඩා මේ ගංහාවක තිබෙන වෙනස තමයි මහ වැස්සක් වැස්සාට පස්සේ පරණ ගඟ නොවෙයි අලුත් ගඟක්. ඒ දූෂ්‍යකරණයට ලක් වීම එතැනින් අවසන් වෙනවා. ඊට

පස්සේ එතැන ඉඳලා තමයි නැවතත් දූෂ්‍යකරණයට ලක් වෙන්නේ. ඒක නිසා ගං වතුරකට පස්සේ එහෙම නැත්නම් මහ වර්ෂාවකට පස්සේ ඒ අලුත් ගඟ ඒ විධියටම පවත්වා ගන්න අපි මැදිහත් වුණොත් ගඟ දූෂ්‍යකරණය එතැනින් ඉවරයි. අනෙක් පරිසර පද්ධතිවල මේ උරුමය අපට ලැබෙන්නේ නැහැ. ඒක නිසා කැලණි ගඟ නැවත තිබුණු තත්ත්වයට පත් කර ගන්න ඉතිහාසය තුළ අර, *වීණා වයමින්*

*මනහර නා මණෙවියනිඳ ළවැලි පිට*
*ගෙන මිණි වෙණ තත් නියගින් මැද රුවට*
*කණ හෙවැ කියන බුදු ගුණ ගී මියුරු කොට*
*සැනහෙව කැලණි ගඟ බඩ මද කලක් සිට*

මේ තත්ත්වය ඉතිහාසයේ තිබුණා (බාධා කිරීමක්) ඒක නිසා අපට පුළුවන්කම තිබෙනවා මෙන්න මේ විධියට කැලණි ගඟේ තිබුණු තත්ත්වයටම නැවත ගේන එක. ඉතිහාසයේ සංකල්පයක් බවට පත් වෙලා මැරෙන්න දෙන්න ඕනෑ නැහැ. අපට ඇත්ත කැක්කුමක්, ඇල්මක් තිබෙනවා නම් කැලණි ගඟ ඒ විධියටම නැවත සංරක්ෂණය කරන්න මහ වතුරකින් පස්සේ අපට ඒ අවස්ථාව ලැබිලා තිබෙනවා. කරගන්න පුළුවන්. අපට ඕනෑකම තමයි අවශ්‍ය.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළිතුරු කථාව යද්දී මට විනාඩියක් දෙනවාද? කථා කරන ගරු මන්ත්‍රීතුමාගේ අවසරය පිට විනාඩි 02 ක් දෙන්න. අද වැඩ අධික කාර්ය භාරයක් තියෙද්දී -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මම කථාව අවසන් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාගෙන් පස්සේ මට කථා කරන්න අවසර නැහැ රීතිය අනුව. ඒකයි. ඒ නිසා මම කියන්න ඕනෑ. ඉතාම වැදගත් කාලෝචිත යෝජනාවක්. මට සහභාගී වෙන්න නොහැකි වුණා. ඉතින් මම රන්වල ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වන දරුවන් හරහා පාසල් අධ්‍යාපනය හරහා මේ සඳහා අපෙන් ලබා දිය යුතු සියලුම සහයෝගය අපි ලබා දෙනවා. මම බලාපොරොත්තු වෙනවා ඉදිරි දවසක රන්වල ගරු මන්ත්‍රීතුමා අපත් එක්ක -

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ඔබතුමා සම්බන්ධ නොවෙනවා නම් මේකට හොඳයි කියන බහුතර මතය තමයි තියෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මෙහෙමයි. ඔය බාර් සංස්කෘතිය හදාගෙන හංවැල්ලේ මොකක්ද හෝටලයෙන් කුණු දාන - කථාවල් මට අදාළ නැහැ. මම හිටියොත් අනෙක් දවසේ මම උත්තර දෙනවා. නම් කියන්නේ නැහැ. සිංහ තෙල් දාන්න ඕනෑ රත්තරන් කෙණ්ඩියක. මතක තියාගන්න. මේ සිංහ තෙල්. ඒක රත්තරන් කෙණ්ඩියක දාන්න රංජිත් සෝමවංශ ඇමැතිතුමා පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සූදානම් කියන එක කියලා මම නිහඬ වෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

රොමැන්ටික් පැත්තට බර වෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ඉතාම පැහැදිලි අදහසක් ඉදිරිපත් කළා මේ කථාව යද්දිම. පොඩ්ඩක් රොමැන්ටික් පැත්තටත් මම බර වෙනවා කියලා. කලින් විද්‍යාත්මක පැත්තෙන්, classic පැත්තෙන් කථා කරලා. ඒකේ පොඩි හරයක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි. අපි විද්‍යාත්මක දේවල්, සියලු දේවල් නැවත භූමිය මත යථාර්ථයක් කරන්න සිද්ධ වෙන්නේ ගමේ ගඟ දෙපස ඉන්න ජනතාවත් එක්ක. ඉතිහාසයේ පාරම්පරික දැනුම සහ ඒ තිබෙන සංස්කෘතිය අපට නැත්නම් ගමට ගියාට පස්සේ මිනිස්සු ගහලා එලවනවා. මේ අපේ toilet එකේ බටේ වහන්න නේද මේ යක්කු එන්නේ කියලා. එහෙම නැත්නම් කර්මාන්ත ශාලාවක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා විනාඩියක් දෙන්න. සභාවේ කාලය දීර්ඝ කළ යුතු වෙනවා.

# සභාවේ කාලය දීර්ඝ කිරීම
EXTENSION OF COUNCIL DURATION

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව අවසන් වන තෙක් කාලය දීර්ඝ කරන ලෙස මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අනුව අපට සිද්ධ වෙනවා - ගමට ගියාම පුහුල් පහන ඕනෑ අපට. සැළලිහිණි සංදේශයේ තිබෙන කැලණි ගඟේ වර්ණනාව අවශ්‍ය වෙනවා. ඒ වාගේම ගමේ මිනිස්සුන්ගේ සංස්කෘතිය දැන ගන්න, ඔබතුමාගේ ඥාතීන් ඒ ගඟ ඉවුරේ කරපු වැඩ ටික අපි දැක්කා. ඒකත් අවශ්‍ය වෙනවා ඒවා මිනිස්සුන්ට පෙන්වන්න ගියාම. අපි ඒ සම්බන්ධව කථා කරනවා. ඒ නිසා මේ සියලු දේවල්වල සම්මිශ්‍රණයක් එක්ක තමයි විද්‍යාව ගිහිල්ලා බස්සන්න සිද්ධ වෙන්නේ. ඒ නිසා අපට සිද්ධ වෙනවා මේ විද්‍යාවයි, විද්‍යාත්මක දැනුමයි ගමට ගළපා ගන්නේ කොහොමද කියලා හිතන්න. ඒක නිසා තමයි එතුමා ප්‍රකාශ කළේ අපේ නායක රෝහණ විජේවීර සහෝදරයා ඉතිහාසය තුළ ප්‍රකාශ කරලා තිබෙනවා මේක බද්ධ කරගන්න විධිය කොහොමද කියලා. අපට උගන්වලා තිබෙනවා. ඒක නිසා අද අපට බල කරනවා ගමට යනවා නම් මේ තිබෙන රොමෑන්ටික් ගතියත් එකතු කරගෙන විද්‍යානුකූල පදනමක් හදාගෙන යන්න. එතුමාටත් ආරාධනය කරනවා නැවත ගමට ඇවිල්ලා අපත් එක්ක එකතු වෙලා ඒ දේට නායකත්වය දෙමු. ඒ දේට මැදිහත් වෙමු කියලා.

ඒ වාගේම මේ යෝජනාවේදී සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා පානිය ජලයේ ප්‍රමිතිය සම්බන්ධව ප්‍රශ්න කළා. එහෙම බොන්න හොඳද? නරකද? කියලා. ඒ සම්බන්ධව ඉතාමත් පැහැදිලිව කියන්න ඕනෑ. ගරු මහ ඇමැතිතුමා පත් වුණු අකරතැබ්බයත් ඒකමයි. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවක් අනුව එතුමා මූල්‍යමය ප්‍රතිපාදන වෙන් කරනවා කැලණි ගඟ සම්බන්ධව තාක්ෂණිකව, විද්‍යානුකූලව ජලයේ තත්ත්වයත්, ඒ ඉවුරුවල තත්ත්වයත් සම්බන්ධව පරීක්ෂණ කරන්න. ලක්ෂ 08 ක් විතර. හැබැයි දැන් අවුරුදු දෙකක් ගිහිල්ලා තිබෙනවා. තවම වාර්තාවක් නැහැ. මම මේ යෝජනාව ගෙන එනකොට මම මේ කාරණය දැනගෙන ඒකට අදාළව විවේචනයක් ඒ නිලධාරීන්ට ඉදිරිපත් කළේ නැහැ. මම දන්නවා ඒකට සිද්ධ වුණු දේ මොකක්ද කියලා. ඒ යෝජනාව එළියට දාන්න බැරුව මහචාර්යවරු, ආචාර්යවරු බරපතළ වික්ෂිප්ත භාවයකට පත් වුණා. ඒ යෝජනාව එළියට දැම්මා නම් ආණ්ඩුවත්, ඒ වාගේම රටේ ජනතාවත් බරපතළ ප්‍රශ්නයකට පත් වෙනවා. මේ වතුරද අපි බොන්නේ කියලා. ඇත්තටම ඒ වෙලාවේ ඒ මහචාර්යවරුන්ට වගකීමක් තිබුණා මේක එළියට නොදා මොකද කරන්නේ කියලා හිතා බලන්න. සමහර විට ඒකේ යම්කිසි ප්‍රමාණයක් අඩු වෙලා ඇති. අපට ආපු වාර්තාව සැබෑ වාර්තාවක් නොවෙයි. ඒ සැබෑ වාර්තාව ආවා නම් අනිවාර්යයෙන්ම අඹතලෙන් වතුර ගන්න එක නවත්වන්න සිද්ධ වෙනවා. පට්ටිවිලින් වතුර ගන්න එක නවත්වන්න සිද්ධ වෙනවා. ඒක නිසා ඒ වාර්තාවේ තිබෙන සැර පොඞ්ඩක් බාල කරලා අලුත් සාම්පල් ටිකක් ගෙන්නාගෙන ඒ සාම්පල් අනුව ගළපාගෙන ඒක දාලා දුන්නා. කමක් නැහැ, ඒකටත් විරෝධතාවයක් නැහැ. එහෙම කරපු එක හොඳයි. හැබැයි ඒ මහචාර්යවරුන් අද දන්නවා මේ කැලණි ගඟේ වතුර ජනතාව බොන එක, බරපතළ විපත්තියක් කියලා.

ඒ නිසා මහජන මන්ත්‍රීවරයෙක් විධියට මට වගකීමක් තිබෙනවා. ඒ සම්බන්ධව විද්‍යානුකූල පදනමක් තිබෙන මන්ත්‍රීවරයෙක් විධියටත් මට වගකීමක් තිබෙනවා. මේ ජලය පානීය ජලය විධියට නුසුදුසුයි. කොපමණ ක්ලෝරීන් දැම්මත්, කොතරම් පිල්ටර් කළත්. ඒ තිබෙන බැර ලෝහ වර්ග, ඩයි වර්ග ඉවත් වන්නේ නැතුව තමයි අපි පානය කරන්නේ. ඒ නිසා අකමැත්තෙන් වුණත් වතුර බෝතල්කාරයින්ට මේක වාසි වෙයි. ටැප් එක ඇරලා මේ ජලය බොන්න පුළුවන් තත්ත්වයක් නැහැ. මම ඒකට විකල්ප විධියට කියන්නේ පානීය ජලය, ජල බෝතලයෙන් බොන්න කියලා නොවෙයි. ඊට එහාට ගිහිල්ලා අපි මේ ගඟ හදා ගන්න ඕනෑ. ඊළඟට පානීය ජලය සුරක්ෂිත කරගන්න ඕනෑ. ඒ සම්බන්ධව වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් කැමැති නම්, අනික් ඇමතිවරුත් කැමැති නම් මේ මන්ත්‍රීවරුත් ඒ සම්බන්ධව එකඟ නම් මේ යෝජනාව යථාර්ථයක් බවට පත් කරගත්තොත් අපි විශ්වාස

කරනවා, අපි අවම සාධාරණයවත් අපේ රටේ ප්‍රධාන ජනතාවට - 25% ක් මේ කැලණි ගඟේ ජලය රටේ ජනතාවගේ පරිභෝජනය සහ වෙනත් අවශ්‍යතා සඳහා පාවිච්චි කරනවා කියලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා අතින් කියැවුණා. ඒ වාර්තාව අනුව තමයි කියලා ඇත්තේ. ඒක නිසා මේ ජනතාවට සාධාරණයක් කරන්න. අපි හරියට පළාත් සභාව විධියට මේකට මැදිහත් වුණොත් අර කියන මූල්‍යමය ප්‍රතිපාදන ලබාගෙන එනතුරුවත් යම් සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන් කියලා හිතනවා. මේ සම්බන්ධව අදහස් දැක් වූ සියලු ගරු මන්ත්‍රීවරුන්ට නැවත නැවතත් ස්තුතිවන්ත වෙමින්, ඒ සම්බන්ධව සියලු ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරමින් මගේ කථාව අවසන් කරනවා. සියලු දෙනාටම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොමත්ම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය දීර්ඝ කළ නිසා වෙලාව ගන්නේ. අධ්‍යාපන ගරු ඇමතිතුමාට පොඩි යෝජනාවක් කරන්න කැමැතියි. එතුමා මේ සම්බන්ධයෙන් මැදිහත් වුණු නිසා. අපි කඩුවෙල කැලණි ගං දියවර සුරැකීමේ සංවිධානය කියලා පරිසර සංවිධානයක් හදලා, ඒ හරහා අධ්‍යාපන බලධාරීන්ගේ උපදෙස් ඇතිව කලාප අධ්‍යාපන කාර්යාලවල පාසල් දරුවන් සම්බන්ධ කරගත්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළා. ඒකේ වීඩියෝ, එතකොට කෙටි කථා, කෙටි චිත්‍රපට ඒ වාගේ වැඩ සටහනක් කළා. ගරු ඇමතිතුමනි, ඒකේ හොඳම නාට්‍යය කළේ එම්.ඩී.එච්. ජයවර්ධන විද්‍යාලයේ දරුවෝ. ඔබතුමාට පුළුවන් නම් පළමුවැනි වතාවට, මම යෝජනාවක් කරන්නේ. ගොඩක් දේවල් කරන්න එපා. මෙන්න මේ කඩුවෙල එම්.ඩී.එච්. ජයවර්ධන විදුහලෙන් කරපු ඒ නාට්‍යය ගෙනැල්ලා පාසල් දරුවන් අතර ප්‍රථමයෙන් ප්‍රදර්ශනය කරන්නය කියලා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අවසන් වෙනවා. ඒ යෝජනාවට බෙදීමක් තිබෙනවාද? බෙදීමක් නැහැ. සම්මත වූ යෝජනාවක් සේ පිළිගන්නවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීමේ යෝජනාව
# MOTION FOR ADJOURNMENT

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed.*

# සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න
## QUESTIONS PRESENTED AT THE ADJOURNMENT OF THE COUNCIL

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් කල් තැබීමේ අවස්ථාවේදී ගරු රංජිත් සෝමවංශ අමාත්‍යතුමාට යොමු කිරීම සඳහා ප්‍රශ්න තිබුණා. ඒක ඉදිරිපත් කරනවාද? ඔබතුමා කල් ගන්නවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට උත්තර දීමට බලාපොරොත්තුවෙන් ඊළඟ සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා. එදිනට උත්තර ලබා දීමට කැමැත්තෙන් සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම හොඳයි. ඒක න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා. ඔබතුමාට පිළිතුරු ලබන සභා වාරයට ලබා ගන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ ඉල්ලලා තිබෙන්නේ මේ තිබෙන නීති පොත අනුව. එතකොට න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න බැහැ නේ? මම ඉල්ලා තිබෙන්නේ වාචිකව සභාව අවසන් වන වෙලාවට දෙන්න

[ගරු උපාලි කොඩිකාර]

පුළුවන් කරුණු සම්බන්ධව. එහෙම නැතුව කරන්න බැහැ නේ? එහෙමනම් මෙතැනට නීතියක් ඕනෑ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. දැන් එතුමා වාචිකව පොරොන්දු වුණා. ලබන න්‍යාය පත්‍රයට මේක දෙනවා කියලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

න්‍යාය පත්‍රයට දෙන්න -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එතුමා ඉල්ලලා තිබෙන්නේ නීති පොත අනුව. මම ප්‍රකාශ කර සිටින්නේ රීති පොත අනුව. ඒ නිසා මගේ ප්‍රකාශය භාර ගන්නා ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලබන සභා වාරයේදී පිළිතුරු බලාපොරොත්තු වෙන්න පුළුවන්. ස්ථිරවම. ගැටලුවක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ තිබෙනවා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කල් ගන්න පුළුවන්. එතුමා සිටිය නිසා නේ අපි මේ අහන්නේ. එතුමා ගියා නම් අපට අහන්න දෙයක් නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකේ කොහෙවක්වත් නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම මේ හින්දමයි සිටියේ. ඇත්තටම අපි කාටත් වැඩ තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රීති සංග්‍රහයේ -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපි කාටත් වැඩ තිබෙනවා. නමුත් මම අවංකවම සිටියේ මේකට උත්තරය සපයා යන්න ඕනෑ නිසා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට ගරු කිරීමක් වශයෙන් නැවතිලා - දැන් මේ අනික් ඔක්කොම ඇමතිවරු ගිහිල්ලා. නැවතිලා එතුමා සිටියේ මේක ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නය කියලා කියන්න. පිළිතුරු දෙනවා කියලා කියන්න. අපි ඒ අවස්ථාව ලබා දෙමු.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මොකද, මේ කෙටි කාලය තුළ, මගේ නිලධාරීන්වත් නැහැ. ඒ අයටත් අධික වැඩ තිබෙන දවස් කිහිපයක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කාරණයක් පෙන්නලා දෙනවා. මම මීට ඉස්සෙල්ලත් ඔය කාරණය පෙන්නලා දුන්නා. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය මොකක්ද කියලා මම දන්නේ නැහැ . මන්ත්‍රීවරයෙක් සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක් යොමු කළාට පස්සේ, ඒ රීතිවල සඳහන් වෙනවා. ඒක මේ සභාවට අයිති ප්‍රශ්නයක්. ඒ නිසා පළමුවැනි එක තමයි, ඒ සභාවට මන්ත්‍රීවරයා ප්‍රශ්නය කියවන්න ඕනෑ. එතකොට තමයි අපි දැනගන්නේ, මොකක්ද ප්‍රශ්නය කියලා. ඊට පස්සේ සාධාරණව ඒකට උත්තර දෙන්න උත්සාහ කරන්න ඕනෑ. මොකද සභාව කල් තබන අවස්ථාවේ උදේ 10.00 ට දෙන්නේ, ප්‍රශ්නයේ ඒ අවශ්‍යතාවය මත. එතකොට ඇමතිවරයා ඒකට උත්තර දෙන්න සාධාරණ උත්සාහයක් ගන්න ඕනෑ. ඇත්තටම ඒකට සාධාරණ උත්සාහයක් අරගෙන, ඒකට උත්තර බැරි නම් තමයි ඉඩකඩ තිබෙන්නේ, මේක න්‍යාය පත්‍රයට දාන්න කල් ගන්න. ඒක තමයි මේ සභාවේ වෙන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ වාගේ ප්‍රශ්න ගැන ගරු ඇමතිතුමාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියපු දේ ඉතාම -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ඇහුවාම එයා දන්නවා විස්තරේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හෘදයාංගමව පිළිගන්නවා. මගේ හෘද සාක්ෂියේ සාධාරණත්වය නිසා තමයි මෙච්චර වෙලාම රැඳිලා අවසාන වශයෙන් මේ සඳහා සාධාරණත්වය ඉෂ්ට කරන්න පැමිණියේ. එතකොට මගේ නිලධාරීන්ගෙන් මේ තොරතුරු ටික මම ගන්න ඕනෑ. මේක අතිශය කාලීනවම වැදගත් එකක් නම් මම මෙතැන ඉඳලා මේක කරනවා. මේක අහලා තිබෙන්නේ -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කාලීන වැදගත්කම එතුමාට -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා කියන එකට එකඟයි. මේ අහලා තිබෙන්නේ, සමුද්‍රදේවී විද්‍යාලයේ පන්ති කාමර කීයක් තිබේද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අහලා තිබෙනවා1 වැනි වසරේ පන්ති කාමර කීයක්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේක හදිසියේ ගංවතුර, ආපදා හදිසි බලපෑමක් වුණා නම් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේක කලාපෙන් අහලා දැනගන්න පුළුවන් නේ. පන්ති කාමර -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට සමාවෙන්න. මම මගේ නිලධාරීන්ව යවලා මම මේකට උත්තර දෙනවා. නමුත් මේකේ අහලා තිබෙන්නේ ළමයින් දාන එකක් ගැන.

අ. සමුද්‍රදේවී විද්‍යාලයේ පළමු වසරේ පන්ති කාමර කීයක් තිබේද?

ආ. එම පළමු වසරේ පන්ති කාමර සඳහා ළමුන්ගේ පුරප්පාඩු කීයක් තිබේද?

ඇ. මේ වන විට එම පුරප්පාඩු කීයක් පුරවා ඇත්ද?

ඈ. එම පුරප්පාඩු පුරවා ඇති ආකාරය කෙසේද?

ඉ. ඉතිරි පුරප්පාඩු කීයක් තිබේද? එම පුරප්පාඩු පුරවන්නේ කුමන ආකාරයටද?

මේ රීති චක්‍රලේඛ සියලු අණපනත් තිබියදී මේක මහා ගංවතුර හානියක්වත්, මොකක්වත් නොවෙයි නේ? එහෙමනම් මම දුවලා ගිහිල්ලා මගේ නිලධාරීන්ගෙන් අහගෙන එනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගංවතුරට වඩා හපන්නේ. අර දෙමළ ගරු මන්ත්‍රීතුමා කිව්වේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේක තමන්ගේ පුද්ගලිකව තමන්ට වැදගත් වෙන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රටේ අධ්‍යාපනය -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පොදුවේ බැලුවොත් මේක එතරම් වැදගත් ප්‍රශ්නයක් නොවෙයි. මගේ න්‍යාය පත්‍රය තුළ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දරුවන්ට අධ්‍යාපනය දෙන ආයතනය. දරුවෝ ගෙදර ඉන්නවා. ඉස්කෝලේ පන්ති කාමරයේ ඉඩ තියාගෙන.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට වැදගත් ප්‍රශ්නයක් නොවෙයි, මේක. මම දන්නේ නැහැ, අනුන්ට වැදගත් ද කියලා. මගේ න්‍යාය පත්‍රය තුළ මේක නොවැදගත් ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේක කොටින්ම රීති යටතේ උත්තර දෙනවා මිසක් මේවා පල් හෑලි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඇමතිතුමාට දරුවෝ නැති වුණාට අපට ඉන්නවා කොළඹ ඡන්දය දීපු දෙමව්පියන්ගේ දරුවෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේවා නොඇසිය යුතු පල් හෑලි. අන්න ප්‍රශ්න. අහන්න තිබෙන ඒවා. කථා කරන්න තිබෙන ඒවා. රටේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට 50,000 ක් ඡන්දය දීපු මිනිස්සු කොළඹ දිස්ත්‍රික්කයේ ඉන්නවා. එතකොට ඒ අයගේ දරුවන්ට ඉස්කෝලයක් නැති වෙලා. ඉස්කෝලේ පන්ති කාමරයේ ඉඩ තිබෙන කොට ඇමතියාට උත්තරයක් දෙන්න බැරි නම් මොක්කද අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේවා දුරකථනයෙන් දෙන්න පුළුවන් උත්තර.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලබන සභා වාරයේදී අනිවාර්යයෙන් උත්තර දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ලබන සභා වාරයට කැමැති නම් විතරක් උත්තර ලබා දෙනවා. බොහොම ස්තුතියි.

## කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.10 ට, 2018 ජුනි මස 19 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 02.10 p.m till 9.30 a.m. on 19.06.2018*